

# පාලි වාක්‍ය විවේචනයං



පාලිවාක්‍යසම්පාදනයට හා වාක්‍යවිච්ඡේදාදියට

උපකාරවූ

# පාලිවාක්‍යවිවේචනය.

---


පාලිභාෂාවතරණය, ත්‍රිභාෂාරත්නාකරය, පාළිපාඨාවලී ආදි

ග්‍රන්ථසමූහයක කර්තෘවූ

අම්බලම්ගොඩ

**පොල්වත්තේ ශ්‍රී බුද්ධදත්ත ස්ථවිර**

ස්වාමීන්වහන්සේ විසින්

සම්පාදිතයි.


---

# PĀLIVĀKYAVIVECANAYA.

## HELPING TO CONSTRUCT AND ANALISE PALI SENTENCES


BY

**Polwatte Sri Buddhadatta Sthavira**

OF AGGARAMA, AMBLAMGODA.

*Author of Pàlibhàshàvatarana, Pàlipàthàvali, Tribhàshàratnàkara etc ,*

*Editor of*

*Visuddhimagga, Apadàna etc., (Ceylon.)*

*"Buddhadatta's Manuals", Sammohavinodani, Saddhammapajjotikà etc., (England )*


---


අම්බලම්ගොඩ පොල්වත්තේ

ඕ. ඩැනියෙල් සිල්වා විසින්

ප්‍රකාශිතයි

ශ්‍රීභාරතී යන්ත්‍රාලය

කොළඹ.


---

# විඥාපනය.

පාලි ඉගෙන ගන්නා ආධුනිකයන්හට පාලිභාෂාවතරණයේ කොටස් තුනෙන් ලැබිතිබෙන උපකාරමහත ඉතා වැදගත් බැව් දැනගන්නට තිබේ. එහෙත් වාක්‍යරචනාව ගැන වැඩි විස්තරයක් ඒ පොත්වල ඇතුළත්ව නැත. ඒ පාඩුව පිරිමැසීම සඳහා අප විසින් වාක්‍ය සම්පාදනය ගැනම කරුණු දක්වන මේ "පාලි වාක්‍යවිවේචනය" සම්පාදනය කරන ලදී.

ප්‍රාචීනභාෂෝපකාරසමිතියේ පරීක්ෂණවලට පෙනී සිටින ශිෂ්‍යයන් බොහෝසේ පාලිවාක්‍යරචනාවෙන් අසමර්ථන බව අසන්නට ලැබේ. ඊට හේතුව නම් අපේ ප්‍රාචීනවිද්‍යාස්ථානයන්හි වාක්‍යරචනාව විශේෂාංගයක් ලෙස නොඉගැන්වීමයි. එය ඉගැන්වීමේ පිළිවෙළ දක්වන පොත්ද අපට නැත්තාහ. පොතක් නැතිකල්හි ස්වෝත්සාහයෙන්ම ක්‍රමයක් උපදවා ශිෂ්‍යයන්ට ඉගැන්වීමත් ඒ ඒ ආචාර්යවරයන්ට පහසු නොවේ. මේ කරුණු සැලකූ අප විසින් වාක්‍යවිභාග-වාක්‍යවිච්ඡේදාදිය දක්වන මේ පොත මහත් වෙහෙසකින් සම්පාදිතයි.

වාක්‍යයක් නියමලෙස විභාග කොට බැලීමෙන්ම එහි අන්තර්ගත අදහස තේරුම්ගත හැකිවන්නේය. එසේ විච්ඡේද කරන්නට නොවත් ඒ ඒ කොටස්වලට බෙදන්නට අසමර්ථවනකල එහි යථාර්ථය තේරුම්ගැනීමද අපහසුවේ. නිවරදිලෙස වාක්‍යවිච්ඡේදයකිරීමට උගත්තහු විසින් ව්‍යාකරණයට විරුද්ධ නොවනසේ වාක්‍යයන් ගැළපීමද හැකිවේ. පාලිවාක්‍යවිච්ඡේදය ඉගැන්වීමට පොතක් මින්පෙර නොතිබුණේය. එබැවින් ඉංග්‍රීසිවාක්‍ය විච්ඡේද ක්‍රමයද ආශ්‍රයකොට පාලියට ගැළපෙන නාමාදිය යොදමින් අපවිසින් මෙය අලුතෙන් නිපදවන ලදී.

තවද ලේඛනසම්පාදනය හා භාෂාපරිවර්තනය සඳහා කුඩා පාඨවත් "පාලිභාෂාවතරණ" තුන්වෙනි පොතේ ඇතුළත් කරන්නට නොහැකිවූ බැවින් ඒ දෙකද මේ පාලිවාක්‍යවිවේචනයෙහි ඇතුළත් කෙළෙමු. ඒ දෙකොටසත් වාක්‍යරචනාව හා සම්බන්ධකම් ඇත්තේමය. එබැවින් මින් මත්තෙහි පාලිවාක්‍ය රචනාවෙහි දක්ෂවනු කැමැත්තන් පාලිභාෂාවතරණයත් පාලි වාක්‍යවිවේචනයත් පරිශීලනය කළොත් ස්වාධ්‍යාය මුදුන් පමුණුවාගතහැකි බව සිහි තබාගත යුතුයි.

මෙහි අන්තයේ තිබෙන උපග්‍රන්ථයෙන් පාලිභාෂාවේ රීති ස්වල්පයක්ද ඒ ඒ තැනට යෙදිය යුතු ක්‍රියාපදාදියෙන් ස්වල්පයක්ද දක්වීමු. සිංහල භාෂා රීතීන් අනුව පාලි වාක්‍යයන් සම්පාදනය කිරීමෙන් වරදව අසුවන ශිෂ්‍යයන්ට මෙය ඉතා ප්‍රයොජනවත්වේයයි හඟිමු. මෙය වනාහි එවැනි දේ පාලිභාෂාවෙහින් ඇතැයි ලොකයාට දක්වීම සඳහා බින්දුමාත්‍රයක් ගෙනහැර පෑමකි. භාෂාරීති ගැනම ලියතොත් පිටු සියගණනක ග්‍රන්ථයක් සම්පාදනය කළ හැක. එසේ වෙන්වශයෙන් පොත්ලිවීමට තවම කාලය නොපැමිණියේය. එතරම් ශාස්ත්‍රරසිකයන් ලක්දිව නැති බැවිනි. අනාගතයෙහි යම්කිසි උගතකු විසින් භාෂාරීති සම්බන්ධයෙන් එක් පොතක්ද ගැටලු අප්‍රකට පදයන්ගේ අර්ථ පැහැදිලි කිරීම් වශයෙන් එක් ග්‍රන්ථිපදයක්ද සම්පාදනය කිරීමට අවකාශ ඇත්තේය. අපවිසින් ඊට මග පෙන්වන ලදී.

අලුතෙන් යමක් නිපදවීමේදී අඩුපාඩු ඇතිවීම ස්වභාව ධර්මයකි. එබැවින් මෙහි කිසියම් දොෂයක් හෝ අඩුපාඩුවක් දක්නට ලැබුණිනම් කරුණාධ්‍යාශයෙන් එය අපහට දන්වන මෙන් ශාස්ත්‍ර ප්‍රවීණයන්ගෙන් ඉල්ලා සිටිමු.

මීට

පොල්වත්තේ බුද්ධදත්ත ස්ථවිර.

අම්බලම්ගොඩ අග්ගාරාමයේදීය.
6-6-1933.

# පටුන.


| | පිට |
|---|---|
| වාක්‍යය හා එහි අවයව හැඳින්වීම | 1 |
| සකර්මක අමිශ්‍ර වාක්‍ය | 2 |
| විශේෂණපද (එක්කරන සැටි) | 3 |
| ලිඞ්ගපරිවර්තනය (ස්ත්‍රී ප්‍රත්‍යයෝ) | 6 |
| ක්‍රියාවිශේෂණ | 10 |
| සංඛ්‍යාවිශේෂණ | 12 |
| සර්වනාම විශේෂණ | 15 |
| සමාස විශේෂණ | 16 |
| එක් විශේෂ්‍යපදයකට විශේෂණ බොහෝ ගණනක් | 17 |
| භින්නාධිකරණ විශේෂණ | 18 |
| කර්තෘකර්මාදිය තැබියයුතු තැන් | 20 |
| ක්‍රියාකාරකසම්බන්ධය | 22 |
| වාක්‍යප්‍රභේදයෝ | 29—45 |
| (1) අමිශ්‍ර වාක්‍ය | 29 |
| (2) මිශ්‍ර වාක්‍ය | 30 |
| අන්තර්වාක්‍ය (විභාගය) | 31 |
| (3) සංහතවාක්‍ය | 35 |
| වාක්‍යවිච්ඡේදය | 35 |
| ආඛ්‍යාතවිස්තාරය | 38 |
| ආඛ්‍යාතපූරණය | 42 |
| සංහතවාක්‍යයක් විච්ඡේද කිරීම | 43 |
| පරිවර්තන පරිචය | 46 |
| ලේඛනසම්පාදනය | 51 |
| අර්ථවිවරණ | 55—73 |
| උපග්‍රන්ථය | 74—86 |
| භාෂාරීති | 74 |
| ඒ ඒ තැන්හි යෙදියයුතු ක්‍රියාපදාදිය | 78 |
| රීති | 79 |
| පාලි—සිංහල වචන මාලා | 87 |

# ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 5 | 22 | විසෙසියයුතු | වෛශෙෂියයුතු |
| 19 | 4 | හදගෙන | හදශෙන |
| 24 | 8 | කලංභාවා | කාලංකාවා |
| 28 | 1 | නිඨපෙතවා | නිඨාපෙතවා |
| 45 | 36 | මිංසළෙහිතෙහි | මංසලොහිතෙහි |
| 81 | 11 | ජිගවජ්ජා | ජිඝවජ්ජා |

# පාලිවාක්‍යවිවේචනය.

නමො තස්ස වාක්‍යපථාතීතස්ස.

1. සම්පූර්ණ අදහසක් ප්‍රකාශකරන වචනසමූහය **වාක්‍ය** නම්. වාක්‍යයකගේ නිෂ්පාදනයට කරන්නෙක් ද ක්‍රියාවක් ද ඇතිවිය යුතුයි. **කරන්නකු** (කර්තෘපදයක්) **හා කිරීමක්** (ක්‍රියා පදයක්) **නැතිව වාක්‍යයක් සම්පාදනය කළහැකි නොවේ.**

**පුරිසො නිසීදති** (=පුරුෂයා හිඳී) යන්න වාක්‍යයකි. **පුරිසො** නාමපදයකි; මේ වාක්‍යයෙහි (හිඳීම්) ක්‍රියාව කරන්නා පුරුෂතෙමේයි. **නිසීදති** ක්‍රියාපදයකි; පුරුෂයාගේ කිරීම එයින් කියවේ.

2. **පුරිසො** එකවචනයකි, **නිසීදති** යන්නත් එකවචනයකි. මෙසේ කර්තෘ එකවචනය වූ විට (හෙවත් කරන්නා එක් අයකු වූවිට) **ඔහුගේ ක්‍රියාවත් එකවචනයෙන් සිටිය යුතුයි.**

භාෂාවක් නිවරදසේ ව්‍යවහාර කළයුතු ආකාරය ව්‍යාකරණයෙන් උගන්වනු ලැබේ. "**පුරිසො නිසීදන්ති** (=පුරුෂයා හිඳිත්)" යි කිවහොත් එය ව්‍යාකරණයට විරුද්ධයි; කර්තෘ එකවචනයෙන් ද ක්‍රියාව බහුවචනයෙන් ද යොදා තිබෙන හෙයිනි.

3. **ක්‍රියාව බහුවචනය වූවිට කර්තෘ ද බහුවචනයෙන් සිටිය යුතුයි.** එබැවින් මේ වාක්‍යයේ කර්තෘපදයද බහුවචනයක් කොට **පුරිසා නිසීදන්ති** යි යෙදියයුතු වේ.

"**පුරිසා නිසීදති**"යි කර්තෘ බහුවචනයෙන් හා ක්‍රියාව එකවචනයෙන් යෙදීමත් යුතුනොවේ.

## අභ්‍යාසය 1.

ගුරුවරයා විසින් එකවචනවලින් වාක්‍යදශයක් ද බහුවචනවලින් වාක්‍යදශයක් ද ශිෂ්‍යයන් ලවා සෑදවියයුතු.

පහත පෙනෙන වාක්‍යයන් නිදොස්කළයුතු:-

1. ගොණො ධාවන්ති. 2. සීහා තිට්ඨති. 3. මිගා සයති. 4. සුනඛො සයන්ති. 5. පුරිසා භුඤ්ජති. 6. කාකො රවන්ති. 7. ත්වං නිසීදථ. 8. අහං පචාම. 9. තුම්හෙ ගච්ඡසි. 10. මයං භුඤ්ජාමි. 11. අහං කරොම. 12. ත්වං සයථ.

# අමිශ්‍රවාක්‍ය (සකර්මක.)

කර්තෘ හා ක්‍රියාව වාක්‍යයක ප්‍රධානාවයවවයයි. **පුරිසො සයති** (=පුරුෂයා නිදයි) යන තැන ක්‍රියාපදය අකර්මක (කර්මයක් නොගන්නා) බැවින් ඒ වාක්‍යය කර්තෘ-ක්‍රියා දෙකින් සම්පූර්ණවේ. නමුත් **ගොණො ඛාදති** (=ගොනා කයි) යනතැන "ඛාදති" යන ක්‍රියාව කර්මයක් අපේක්‍ෂාකෙරේ. මේ වාක්‍යය ඇසූවකුට ගොනා කන්නේ කුමක්ද? තණකොළද? පිදුරුද? අන්දෙයක්ද? යන සැකය උපදී, එබැවින් කනදෙය ද ඇතුලත් කොට **ගොණො තිණං ඛාදති** (=ගොනා තණකයි) කීවිට වාක්‍යය සම්පූර්ණවේ. මෙසේ–

4. **අකර්මකක්‍රියාවකින් යුත් වාක්‍යය කර්මය නැතිව සම්පූර්ණවනමුත් සකර්මකක්‍රියාවකින් යුත් වාක්‍යය කර්මයක් නැති කල්හි සම්පූර්ණ නොවේ.**

සකර්මක වාක්‍ය:–

1. පුරිසො රුක්ඛං ඡින්දති.
2. මනුස්සා භත්තං භුඤ්ජන්ති.
3. අස්සා ගාමං ධාවිංසු.
4. දාසො ගොණෙ බන්ධි.
5. වනිතායො පදුමානි ආහරිංසු.
6. රක්ඛසී මනුස්සෙ ඛාදි.
7. වඩ්ඪකිනො දාරුභණ්ඩානි කරොන්ති.
8. සීහා සප්පෙනො මාරෙන්ති.
9. කස්සකා ඛෙත්තානි කසිංසු.
10. තුම්හෙ පක්ඛිනො පලාපෙථ.
11. අහං සීලං රක්ඛිස්සාමි.
12. ත්වං මහාචෙතියං වන්දසි.
13. මයං අනුරාධපුරං ගමිස්සාම.
14. තුම්හෙ පුඤ්ඤානි කරොථ.
15. භික්ඛවො ධම්මං දෙසෙසුං.

5. **කර්තෘ හා ක්‍රියාව ඒකවචනයෙහි සිටි නිසා කර්මයත් ඒකවචනයෙහි වියයුතු නොවේ.** එක් මිනිසකු විසින් එක්ගසක් හෝ බොහෝ ගස් හෝ කැපියහැක; එබැවින් කර්තෘ ඒකවචනය වූවිට කර්මය ඒකවචනයෙන් හෝ බහුවචනයෙන් සිටීමට බාධාවක් නැත. **එමෙන්ම කර්තෘ හා ක්‍රියාව බහුවචනයෙහි සිටි**

තැන්හි කර්තෘ ඒකවචනයෙන් යොදන්ට බාධාවක් නැත්තේය. මිනිසුන් බොහෝ දෙනෙකුන් විසින් එක් ගසක් කැපීම හෝ එක් කුඹුරක් සීසෑම කළහැකිවේ. මෙසේ කර්තෘ කතෘ ක්‍රියාවන්ගේ එකබහුත්වය අනුගමනය නොකෙරේයයි දතයුතු.

### අභ්‍යාසය 2.

මේ වාක්‍යයන්හි අඩුතැන් කර්තෘපදවලින් පිරවියයුතු:-

1. ත්වං ………… ගච්ඡාසි. 2. භික්ඛවෝ ………… රක්ඛන්ති. 3. හත්ථිනො ………… ඛාදන්ති. 4. සීහො ………… මාරෙති. 5. මයං ………… කසාම. 6. තුම්හෙ ………… වන්දථ. 7. පුරිසො ………… බන්ධති. 8. දාසා ………… භුඤ්ජන්ති. 9. ගොණො ………… ධාවි. 10. මනුස්සා ………… ආහරන්ති. 11. කස්සකො ………… ඡින්දි. 12. ගොණා ………… ඛාදිංසු.

---

## විශෙෂණපද.

---

6. ක්‍රියාපදයටත් කර්තෘපදයටත් සම්බන්ධකොට විශෙෂණපද යෙදියහැක. "පුරිසො ආගච්ඡති" (=පුරුෂයා ඒ) යන වාක්‍යයෙහි පුරුෂයා ධනවතෙක් නම්:

ධනවා පුරිසො ආගච්ඡති
(=ධනවත් පුරුෂයා ඒ) යයි කියහැක.

ඔහුට ඇති ගුණයන් අනුව නානාවිධ විශෙෂණපද යෙදිය හැක:

| | | | |
|---|---|---|---|
| 1. සීලවා | පුරිසො | ආගච්ඡති | (සිල්වත් පුරුෂයා ඒ.) |
| 2. පඤ්ඤවා | ,, | ,, | (නුවණැති ,, ,,) |
| 3. රස්සො | ,, | ,, | (මිටි ,, ,,) |
| 4. ලකුණ්ටකො | ,, | ,, | (කුරු ,, ,,) |
| 5. උච්චො | ,, | ,, | (උස් ,, ,,) |
| 6. සෙතො | ,, | ,, | (සුදු ,, ,,) |
| 7. කාළො | ,, | ,, | (කළු ,, ,,) |
| 8. කක්ඛළො | ,, | ,, | (රළු; තපුරු,, ,,) |
| 9. දුප්පඤ්ඤො | ,, | ,, | (අඥාන ,, ,,) |
| 10. පාපකාරී | ,, | ,, | (පව්කාර ,, ,,) |
| 11. රොදමානො | ,, | ,, | (අඬන ,, ,,) |
| 12. හසමානො | ,, | ,, | (සිනාසෙන ,, ,,) |

ආදිවශයෙන් නොයෙක් පද පුරිස-ශබ්දයට හෝ අන්‍ය ශබ්දයකට විශෙෂණකොට යෙදියහැක; නමුත්

**7.** **ඒ විශෙෂණපද වෙසෙසනු ලබන පදයට අයත් ලිඞ්ගයෙන් ද විභක්තියෙන් ද සංඛ්‍යාවෙන් ද යුක්තවිය යුතුයි.** (සංඛ්‍යා නම් එක-බහුවචනයි.)

උඩ දක්වූ වාක්‍යයන්හි වෙසෙසනුලැබූ පදය පුරිසො යන්නයි. එයට විශෙෂණවූ පදසියල්ල පුරිසො යන්න මෙන් පුල්ලිඞ්ගයත් ප්‍රථමා විභක්තියත් එකවචනයත් ගෙන සිටී.

**7.** (1) **කර්මය හා සෙසදන විශෙෂණපද කර්මවිභක්තියෙන්ම යුක්තවෙති.** උදාහරණ:-

1. රක්ඛසී බහූ මනුස්සෙ ඛාදි.
2. වඩ්ඪකී **නානාවිධානි** දාරුභණ්ඩානි කරොති.
3. මනුස්සා **මහන්තං** රුක්ඛං ඡින්දිංසු.
4. කස්සකා **ඛුද්දකං** ඛෙත්තං කසන්ති.
5. වනිතා **රත්තානි** පදුමානි ආහරි.
6. ත්වං **ධඤ්ඤඛාදකෙ** පක්ඛී පලාපෙහි.
7. අහං **දීඝං** රජ්ජුං ආනෙස්සාමි.
8. මයං **සීලවන්තෙ** භික්ඛූ වන්දිස්සාම.
9. කඤ්ඤා **සෙතානි** වත්ථානි පරිදහති.
10. චොරො **තිඛිණං** සත්ථං හරි.

අභ්‍යාසය 3.

මේ වාක්‍යයන්හි කර්තෘ-කර්ම පදවලට ගැළපෙන විශෙෂණ පද එක්කළයුතු:-

1 ...... .. භික්ඛූ ධම්මං දෙසෙති. 2. ත්වං ...... .... පුඤ්ඤානි කරොහි. 3. මයං ...... .. ගොණං ආහරිම්හ. 4. .... ...... සීහො ... ....... හත්ථිං මාරෙසි. 5. වඩ්ඪකී ...... ... ගෙහානි කරොන්ති. 6 ... ...... වනිතා ......... පදුමං පූජෙසි. 7 ...... ...... ගොණො ........ තිණං ඛාදි. 8. අහං ......... වත්ථං පරිදහාමි. 9. කස්සකො ............ පක්ඛී පලාපෙති. 10 ... ... ..... දාසො ............ අස්සෙ බන්ධි.

නිදොස්කළයුතු:-

1. අහං රත්තානි පදුමං ආහරිං. 2. වනිතා සෙතං වත්ථානි පරිදහිස්සති. 3. මනුස්සා මහන්තා රුක්ඛා ඡින්දන්ති. 4. ත්වං දීඝා රජ්ජුං ආනෙහි. 5. මයං සීලවන්තං භික්ඛූ පස්සාම.

පාලියට නැඟියයුතු:-

1. මිනිහා මහත්වූ කෙතක් සීසෑවේය. 2. වඩුවෝ කුඹා ගස් කැපූහ. 3. මම තියුණු පොරවක් ගෙනෙන්නෙමි. 4. ස්ත්‍රිය ධාන්‍ය කන පක්ෂීන් පලවාහරී. 5. කන්‍යාවෝ දික්ලණු ගෙනෙත්. 6. සොරු දරුණු රකුසියට පහර දුන්හ. 7. වඩුවා රතු වස්ත්‍රයක් හඳී. 8. වඩුවන්ගේ නොයෙක් ලිබඩු මිනිස්සු මිලදී ගනිත්. 9. වෙළෙන්දේ සුදුරෙදි විකුණත්. 10. ඇත්තු ගුණවත් ස්ත්‍රියක් මැරූහ.

7. (2) තෘතීයාදි අන්‍යවිභක්තීන් හා ද විශෙෂණ පද යෙදියහැක.

උදාහරණ:-

1. ධාවන්තං පුරිසං පස්සි (=දුවන පුරුෂයකු දුටී.)
2. ධාවතා පුරිසෙන කතං (=දුවන පුරුෂයා විසින් කරන ලදී.)
3. ධාවන්තානං පුරිසානං අදාසි (=දුවන පුරුෂයන්ට දුන්නේය.)
4. ධාවන්තෙහි පුරිසෙහි අපෙහි (=දුවන පුරුෂයන්ගෙන් ඉවත්වෙව.)
5. සෙතානං පුරිසානං අස්සා ධාවන්ති (=සුදුමිනිසුන්ගේ අශ්වයෝ දුවත්.)
6. නීචෙසු පුරිසෙසු සගුණො නත්ථි (=නීචමිනිසුන් කෙරෙහි යහපත් ගුණය නැත.

7. (3) විශෙෂ්‍ය (විශෙෂියයුතු) පදය ස්ත්‍රීලිඞ්ගිකවේ නම් විශෙෂණපද ද ස්ත්‍රීලිඞ්ගික වෙති.

1. සීලවතී කඤ්ඤා ධම්මං සුණාති (=සිල්වත් කන්‍යා, තොමෝ ධර්මය අසයි.)
2. කාලා වනිතායො ගාමං අගමංසු (=කළු ස්ත්‍රීහු ගමට ගියහ.)
3. තෙ මහන්තිං නාවං අභිරූහිංසු (=ඔවුහු මහත් නැව නට නැංගාහ.)
4. ඉත්ථියො දීඝා දොණියො ආරූහිත්වා නදිං තරිංසු (=ස්ත්‍රීහු දික් ඔරුවලට නැගී ගඟ එතරකළහ )
5. කොමලාහි තරුණීහි ගායිතං (=කොමල තරුණියන් විසින් ගායනාකරනලදී.)
6. දුප්පඤ්ඤාය නාරියා ධනං අදංසු (=අඥාන ස්ත්‍රියට ධනය දුන්හ.)

**7.** (4) **නපුංසකලිඞ්ගික විශේෂ්‍ය පදයන් හා නපුංසකලිඞ්ගික විශේෂණපදම යෙදෙති:-**

1. සරෙ රත්තං පදුමං පුප්ඵති (=විලෙහි රත් පියුම පිපේ.)
2. බහූනි කුලානි ඉධ වසන්ති (=බොහෝ පවුල් මෙහි වෙසෙති.)
3. තෙ සෙතානි උප්පලානි ආහරිංසු (=ඔවුහු සුදු උපුල් ගෙනආහ.)
4. සො මහන්තෙන පදුමෙන චෙතියං පූජෙසි (=හෙතෙම මහත් පියුමකින් චෛත්‍යය පිදී )
5. මනුස්සා උළාරානි පුඤ්ඤානි කරෙන්ති (=මිනිස්සු උදාර වූ පින් කරති.)
6. කොසලරාජා ද්වීසු රට්ඨෙසු රජ්ජං කාරෙසි (=කොසොල් රජ (කාශි-කොශල) දෙරටෙහි රාජ්‍යය කරවිය.)

**අභ්‍යාසය 4.**

පහත පෙනෙන වාක්‍යයන් පාලියට නැගියයුතු:-

1. සුදු ගොන්නු දුවත්. 2. රතු උපුල් ගෙනෙව්. 3. උස් ගසක් කපමු. 4. හෙළපියුම්වලින් චෛත්‍යය පුදව්. 5. සිල්වත් ස්ත්‍රීහු දන් දුන්හ. 6, ඔවුහු කුඩා නැවකින් ගඟේ ගියහ. 7. මහත්වූ ගමෙහි බොහෝ ගෙවල් වෙති. 8. නපුරු මිනිසෙක් රතුදෙනව පහරදුන්නේය. 9. කළු ගොණාට තණකොළ දෙව. 10. ධනවත් තරුණියෝ සුදුරෙදි මිලදී ගනිත්.

පහත පෙනෙන වාක්‍යයන් නිදොස්කළයුතු:-

1. සෙතා පුරිසො තිට්ඨති. 2. තෙ ධාවන්තො අස්සං බන්ධන්ති. 3. කාලා වනිතං පස්සථ. 4. රත්තං පදුමානි ආහරථ. 5. සෙතෙන පදුමං පූජෙමි. 6. මහන්තී ගොණො ධාවති. 7. නහායන්ති වනිතාය හත්ථා හසති. 8. දුප්පඤ්ඤස්ස වනිතාය භාතරො කසන්ති. 9. ධනවන්තො වනිතා ආගච්ඡන්ති. 10. සීලවන්තියො පුරිසා නිසීදන්ති.

---

# ලිඞ්ගපරිවර්තනය.

**8. ඇතැම් පුල්ලිඞ්ගික ශබ්දයන් ආ-ඊ-ආදි ස්ත්‍රීප්‍රත්‍යයන් යෙදීමෙන් ස්ත්‍රීලිඞ්ගිකභාවයට පැමිණවිය හැක.**

| පුංලිඞ්ග: | ඉත්ථිලිඞ්ග: |
|---|---|
| **ආ-ප්‍රත්‍යය** (අකාරාන්තයන් කෙරෙන් පමණයි):- | |
| ඛත්තිය | ඛත්තියා (=රාජවංශික ස්ත්‍රී) |
| දහර | දහරා (=ළදරි) |
| අජ | අජා (=අජ ස්ත්‍රී) |

| පුම්ලිඞ්ග: | ඉත්ථිලිඞ්ග: |
|---|---|
| බාල | බාලා (=අඥාන ස්ත්‍රී) |
| අස්සද්ධ | අස්සද්ධා (=ශ්‍රද්ධා නැත්තී) |
| දුස්සීල | දුස්සීලා (=සිල් නැත්තී) |
| මහාපඤ්ඤ | මහාපඤ්ඤා (=මහනුවණැත්තී) |
| පාපධම්ම | පාපධම්මා (=ලාමක ස්වභාව ඇත්තී) |
| කාළ | කාළා (=කළු ස්ත්‍රී) |
| රස්ස | රස්සා (=මිටි ස්ත්‍රී) |

කකාරයෙන් අවසන්වෙන පුල්ලිඞ්ගික ශබ්දයන් කෙරෙන් ආප්‍රත්‍යය වූ පසු කකාරයට මුලින් ඉකාරාදෙශ ද වේ. (මේ ශබ්දයෝ බොහෝසේම ණ්වු-ප්‍රත්‍යයෙන් සිඬවූවෝයි.)

| | |
|---|---|
| සාවක | සාවිකා (=ශ්‍රාවිකාතොමෝ) |
| උපාසක | උපාසිකා (=උවැසිය) |
| මාණවක | මාණවිකා (=තරුණිය) |
| නායක | නායිකා (=නෙත්‍රී) |
| කුමාරක | කුමාරිකා (=කුමරිය) |
| ගායක | ගායිකා (=ගීකියන්නී) |
| පරිබ්බාජක | පරිබ්බාජිකා (=පරිව්‍රාජිකාව) |

ඊ-ප්‍රත්‍යය (අකාරාන්තයන් හා වන්තු-මන්තු ප්‍රත්‍යයාන්තයන් කෙරෙන්)

| | |
|---|---|
| කුමාර | කුමාරී |
| තරුණ | තරුණී |
| සමණ | සමණී |
| බ්‍රාහ්මණ | බ්‍රාහ්මණී |
| සාමණෙර | සාමණෙරී |
| සකුණ | සකුණී |
| සුනඛ | සුනඛී |
| බිළාල | බිළාලී |
| සීහ | සීහී |
| මිග | මිගී |
| කාක | කාකී |
| වානර | වානරී |
| ගොතම | ගොතමී (=ගෞතමගොත්‍ර ඇත්තී) |
| කුක්කුට | කුක්කුටී |

ඇතැම්විට ඊ ප්‍රත්‍යය පරකල්හි න්තු ප්‍රත්‍යයට ත-කාරාදෙශ වේ.

| | | |
|---|---|---|
| | පුම ලිඞ්ග: | ඉත්ථි ලිඞ්ග: |
| (ප්‍රථමා) | ගුණවා | ගුණවතී; ගුණවන්තී |
| ,, | සීලවා | සීලවතී; සීලවන්තී |
| ,, | පඤ්ඤවා | පඤ්ඤවතී; පඤ්ඤවන්තී |
| ,, | ධනවා | ධනවතී; ධනවන්තී |
| ,, | සතිමා | සතිමතී; සතිමන්තී |
| ,, | බුද්ධිමා | බුද්ධිමතී; බුද්ධිමන්තී. |

ඉනීප්‍රත්‍යය (අ-ඉ-ඊ-උකාරාන්තයන් කෙරෙන්)

| | |
|---|---|
| රාජ | රාජිනී |
| යක්ඛ | යක්ඛිනී |
| දීප | දීපිනී |
| සාමි | සාමිනී |
| මේධාවී | මේධාවිනී |
| භික්ඛු | භික්ඛුනී |
| තපස්සී | තපස්සිනී |
| බ්‍රහ්මචාරී | බ්‍රහ්මචාරිනී |
| මාලී | මාලිනී |
| පක්ඛී | පක්ඛිනී |
| මන්තී | මන්තිනී |
| සුඛී | සුඛිනී |
| පාපකාරී | පාපකාරිනී |

ආනී-ප්‍රත්‍යය (අකාරාන්ත-ඉකාරාන්තයන් කෙරෙන්)

| | |
|---|---|
| මාතුල | මාතුලානී |
| ගහපති | ගහපතානී |
| ඛත්තිය | ඛත්තියානී |
| ආචරිය | ආචරියානී |
| කපිල | කපිලානී |

9 ඇතැම් පුල්ලිඞ්ගික ශබ්දයන්ට ස්වරූපයෙන් වෙනස් වූ ස්ත්‍රීලිඞ්ගික ශබ්ද ඇත්තාහ:

| | |
|---|---|
| පුරිසො | ඉත්ථී |
| පිතා | මාතා |
| භාතා | භගිනී |
| සසුරෙ (=මාමා) | සස්සු (=නැන්දා) |

(මෙහි කසාදයෙන්වූ නෑකමයි)

| | |
|---|---|
| අස්සො | වළවා, (අස්සා කියාත් වේ) |
| ගොණො | ගාවී |

| | |
|---|---|
| පුතෙතා | ධීතා; (පුත්තී කියාත් වේ) |
| ජාමාතා (=බෑනා) | සුණ්සා (=ලේලි) |
| දෙවෝ | අච්ඡරා (=දෙවඟන) |
| යුවා (තරුණයා) | යුවතී (=තරුණී) |
| භත්තා (=ස්වාමිපුරුෂයා) | භරියා (=භාර්‍ය්‍යාව) |
| සාලො (=මස්සිනා) | නනන්දා (=නෑනා) |

### අභ්‍යාසය 5.

**මාතුලො ගහපතිං ගොණං වික්කිණි** යන වාක්‍යයේ පුල්ලිඞ්ගිකශබ්දයන් ස්ත්‍රීලිඞ්ගයට නැගූවිට:-

**මාතුලානී ගහපතානිං ගාවිං වික්කිණි** යි සිටී.

**සස්සු ගුණවතිං සුණ්සං අකොසාසි** යන වාක්‍යයේ ස්ත්‍රීලිඞ්ගික ශබ්දයන් පුල්ලිඞ්ගයට නැගූවිට:-

**සසුරො ගුණවන්තං ජාමාතරං අකොසාසි** යි සිටී.

මේ අනුව පහත පෙනෙන වාක්‍යයන් පුල්ලිඞ්ගයටත් ස්ත්‍රීලිඞ්ගයටත් පෙරළියයුතු:-

1. රාජ කුමාරෙහි සඞ්ං ගන්ත්වා උය්‍යානෙ මිගෙ පස්සි. 2. සසුරෙ ජාමාතරා සඞ්ං ගොණෙ වික්කිණිතුං නගරං අගමාසි. (නගරශබ්දය 'නගරී'යයි ස්ත්‍රීලිඞ්ගයට නැගියහැක). 3. භික්ඛූ ච සාමණෙරා ච උපාසකා ච බ්‍රාහමණා ච රාජනො ච ධම්මසවණාය සන්නිපතිංසු. 4. භගිනියො ගහපතානීනං සන්තිකං ගන්ත්වා, තාසං ධීතරානං සකුණියො අදංසු. 5. මෙධාවිනී බ්‍රාහ්මණී බ්‍රහ්මචාරිනිං තපස්සිනිං උපසඞ්කමි. 6. තස්මිං අරඤ්ඤෙ බහූ සීහියො ව්‍යග්ඝියො දීපිනියො සිගාලියො මිගියො සකුණියො ච වසන්ති. 7. සීලවා සාමණෙරෙ පබ්බජිතො භික්ඛු උපසම්පන්නො ගුණවා භවති. 8. අන්ධො මාණවකො රඤ්ඤො සන්තිකං පත්වා එකං අස්සං යාචි. 9. තාසං ඉත්ථීනං ධීතරො සස්සූනං ගාවියො තිණං ඛාදාපෙසුං. 10. සසුරෙ ජාමාතුනො පුත්තස්ස සුනඛං කුක්කුටං ච අදාසි.

**10.** ස්ත්‍රියට පර්‍ය්‍යායනාමයක්වූ **මාතුගාම** ශබ්දය **නියත පුල්ලිඞ්ගිකයි**; නමුත් **එය හා යෙදෙන විශෙෂණපද** ඇතැම්විට ස්ත්‍රීලිඞ්ගයෙන් යෙදීතිබේ:-

### අඞ්ගුත්තරපඤ්චකනිපාතයෙහි:

1. "කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙනමිධෙකච්චො මාතුගාමො දුබ්බණ්ණා ච හොති දුරූපා සුපාපිකා දස්සනාය, දළිද්දා ච හොති අප්පස්සකා අප්පභොගා?"(සුමනාසුත්ත.)

පඤ්චකනිපාතයෙහිම:

2. "සල්ලපෙ අසිහත්ථෙන, පිසාචෙනාපි සල්ලපෙ,
නත්වෙව එකො එකාය මාතුගාමෙන සල්ලපෙ."

ප්‍රථම නිදර්ශනයෙහි 'එකාචෙවා' යන සර්වනාමවිශෙෂණය පුල්ලිඞ්ගයෙන් ද ඉතිරි විශෙෂණ සය ස්ත්‍රීලිඞ්ගයෙන් ද යෙදී තිබේ.

ඇතැම්තැනක මෙසේ වුවත් මාතුගාම ශබ්දයට පුල්ලිඞ්ගික විශෙෂණත් යෙදියහැකිබව අඞ්ගුත්තරපාලියෙන්ම ප්‍රකටවේ:

එහි දුකනිපාතයෙහි:

3. "ද්වින්නං භික්ඛවෙ ධම්මානං අතිත්තො අප්පටිවානො මාතුගාමො කාලංකරොති."

චතුක්කනිපාතයෙහි:

4. "කොධනො ආනන්ද මාතුගාමො, ඉස්සුකී ආනන්ද මාතුගාමො, මච්ඡරී ආනන්ද මාතුගාමො, දුප්පඤ්ඤො ආනන්ද මාතුගාමො; අයං ඛො ආනන්ද හෙතු යෙන මාතුගාමො නෙව සභාය නිසීදති, න කම්මන්තං පයොජෙති."

---

## ක්‍රියාවිශෙෂණ.

**11.** පාලිභාෂාවෙහි ක්‍රියාවිශෙෂණපද බොහෝසේ ම නපුංසක-කර්මවිභක්ති-එකවචනයෙන් සිටිත්. ඇතැම්විට තෘතීයාඑකවචනයෙන් ද සිටිත්.

1. "මුහුත්තමපි චෙ විඤ්ඤූ පණ්ඩිතං පයිරුපාසති
ඛිප්පං ධම්මං විජානාති ජිව්හා සූපරසං යථා"

(ධම්මපද.)

(=ඉදින් ප්‍රාඥතෙමේ මොහොතක් වත් පණ්ඩිතයකු සේවනය කෙරේනම් දිව ව්‍යඤ්ජනරසය (මෙන්) දනගන්නාසේ වහා ධර්මය අවබොධකෙරේ.) මෙහි මුහුත්තං, ඛිප්පං දෙක ක්‍රියාවිශෙෂණයි.

තවත් උදාහරණ:-

2. "තෙසං හි භගවා කප්පාසිකවනසණ්ඩෙ පඨමං ධම්මං දෙසෙසි." ධ. අ.

3. "සුසුඛං වත ජීවාම වෙරිනෙසු අවෙරිනො"
(ධම්මපද)

4. "මා බාළ්හං පරිදෙවෙසි ඛිප්පං බන්ධාහි භණ්ඩිකං"
(කුණ්ඩලකෙසිවත්ථු).

5. "පඨමං ගිහිභාවෙ ආදීනවං කථෙත්වා ඉදානි අභිණ්හං ගුණං කථෙති." (ධ. අ.)

6. "එස මයා දින්නං විසුං ගණ්හාති." "ථෙරො තස්ස ගෙහෙ නිබද්ධං භුඤ්ජති." (ධ. අ.)

7. "තං සක්කච්චං භොජෙත්වා තස්ස පත්තං සාධුකං ධොවිත්වා නානග්ගරසභොජනස්ස පූරෙත්වා ................ 'ඉමස්ස පිණ්ඩපාතං දදෙය්‍යාථා'ති ආහ."
(ධ. අ. ජම්බුකාජීවක.)

8. "සණිකං උපායෙන පුච්ඡිස්සාමීති චින්තෙත්වා අමච්චෙ ආහ." "සා මෙ නිච්චං ඔතාරමෙව ගවෙසති."
(ධ. අ. උදෙනවත්ථු.)

### තෘතීයාවට උදාහරණ:

1. "මච්ඡරියසෙට්ඨිං මුහුත්තෙන දමෙත්වා ..............සත්ථු සම්මුඛං, නෙත්වා සොතාපත්තිඵලෙ පතිට්ඨාපෙසි" ධ. අ.

2. "භූමියං නිපජ්ජිත්වා සම්පරිවත්තමානා කිච්ඡෙන දාරකං විජායිත්වා .............." (පටාචාරාවත්ථු.)

3. "ඉදානි පන මෙ චිත්තං නිබ්බුතං භවිස්සති, සුඛෙන ච සයිතුං ලභිස්සාමි." (උදෙනවත්ථු.)

### අභ්‍යාසය 6.

මේ වාක්‍යයන්හි ඒ ඒ තැනට ගැළපෙන ක්‍රියාවිශෙෂණ යෙදියයුතු: 1. අස්සා ..... ..... ධාවන්ති. 2. දාරකො ............... කීළිත්වා ගෙහං අගමාසි. 3. පණ්ඩිතා ...... . ධම්මං විජානන්ති 4 ධනවන්තා මඤ්චෙසු .......... සයන්ති. 5. සම්ම, මා................ අඤ්ඤස්ස අගුණං කථෙහි. 6. භගවා... ..... භික්ඛූනං අප්පමාදෙන ඔවදි. 7. යාවාහං ආගච්ඡාමි තාව... ...... ඉධෙව තිට්ඨාහි. 8. මනුස්සා..... ......ගන්ත්වා ආසනානි පඤ්ඤපෙසුං, පච්ඡා භික්ඛූ අගමිංසු. 9. තෙ භික්ඛූ නිසීදාපෙත්වා ...... භොජෙසුං. 10. භොජනාවසානෙ ........ පත්තෙ ධොවිංසු.

———

## සංඛ්‍යාවිශේෂණ.

**12.** නාමපද වූ කර්තෘ-කර්මාදීන්ගේ විශේෂණයෝත් නාමපදම වෙති. නාමපදයෝ වනාහි නාමනාම-සමාසනාම-තද්ධිතනාම- කිතකනාම- සංඛ්‍යානාම- සර්වනාමාදි ප්‍රභේදයෙන් යුක්තවෙති. ඔවුනතුරෙන් සංඛ්‍යානාමයන් අන්පදයන්ට විශේෂණවන ආකාරය මෙහි දක්වනු ලැබේ.

1 එකා ඉත්ථි ද්වෙ පුත්තෙ විජායි.
2 චත්තාරො පුරිසා අට්ඨ ගොණෙ හරිංසු.
3 පඤ්ච වාණිජා දසහි සකටෙහි භණ්ඩානි ආහරිංසු.
4 තිස්සන්නං වනිතානං ච පුත්තා ච ධීතරො ච සන්ති.
5 දසහි ගාමෙහි සතං මනුස්සා ආගමිංසු.
6 අට්ඨසු ගෙහෙසු පඤ්චතිංසති ජනා වසන්ති.
7 ද්වාදස උපාසකා ඡන්නං භික්ඛූනං ච චීවරානි අදංසු.
8 පඤ්චන්නං දාසානං පඤ්චදස පුත්තා වීසති මහිසෙ නෙත්වා ඛෙත්තං කසිංසු.

9 එකෙන ධනවා අත්තනො චතුන්නං පුත්තානං එකෙකස්ස සහස්සං රූපියානි සතං ගාවො ච අදාසි.

10 ලඞ්කාදීපපාලකා එකස්මිං වස්සෙ රූපියානං ද්වාදස කොටියො අසීති සතසහස්සානි ච නානාබලීහි ලභන්ති.

(මොවුන්ගේ අර්ථ විවරණයෙන් දතයුතු.)

සංඛ්‍යාවන්ගේ ලිඞ්ගභේදයත් වරනැගෙන ආකාරයත් **පාලිභාෂාවතරණ** ප්‍රථමභාගයෙහි දක්වනලදී. මෙහිදී නැවත එය බලා හොඳින් ධාරණය කොට ගතයුතුයි. ඒ ශබ්දයේ පටන් අට්ඨාරස ශබ්දය දක්වා සංඛ්‍යාවෝ බහුවචනයෙන් පමණක් යුක්තවෙති, ඔවුන්ගේ එකවචන නැත්තාහ.

**13.** එකූනවීසති (19) පටන් අට්ඨනවුති (98) දක්වා සංඛ්‍යාවෝද කොටිය පටන් කොටිප්පකොටිය දක්වා ශබ්දයෝද ස්ත්‍රීලිඞ්ග එකවචනයෙන් යුක්තවෙති. නමුත් 'විස්සේ කොටස් හතරක්'' 'සියේ කොටස් අටක්'' යනාදි වශයෙන් වෙන් වෙන් කොටස් ගණන් ප්‍රකාශකරණකල්හි බහුවචනයෙන්ද සිටිත්.

**14.** එකූනසත (99) ශබ්දයේ පටන් 'සතසහස්ස' හෝ 'ලක්ඛ'- ශබ්දය දක්වා ශබ්දයෝ නපුංසක එකවචනයෙන් යුක්තවෙති. කොටස් වශයෙන් කියනුලබන කල්හි ඔවුහුද බහුවචනයෙන් සිටිත්.

උඩ දැක්වූ වාක්‍යයන් අතුරෙන් 5 වැන්නෙහි "සතං මිනුස්සා" යනතැන මිනුස්සා පුල්ලිඟු බහුවචනයි, සතං නපුංසක එකවචනයි. විශෙෂණපදය විශෙෂ්‍යපදයාගේ ලිඞ්ගසංඛ්‍යාවන් ගතයුතු වුවත් සතශබ්දය නියතනපුංසකලිඟු ඇතිහෙයින් මිනුස්ස-ශබ්දයාගේ ලිඞ්ගය නොගනී.

**15. නියතලිඞ්ග ඇති හෙවත් අසුවල් ශබ්දය අසුවල් ලිඞ්ගයෙහි පමණක් වේයයි නියමිතවූ ශබ්දයන් අන්‍යලිඞ්ගික ශබ්දයක් හා විශෙෂණවනවිට ස්වකීය නියත ලිඞ්ගය අත්නොහරිති.**

8 වෙනි වාක්‍යයෙහි "වීසති මහිසෙ" යනතැන වීසති ස්ත්‍රීලිඞ්ග කර්මවිභක්ති එකවචනයි, මහිසෙ පුල්ලිඞ්ගකර්මබහුවචනයි. මේ දෙක ලිඞ්ගයෙන් ද වචනයෙන් ද වෙනස්ව විභක්තියෙන් පමණක් සමානව විශෙෂණ විශෙෂ්‍යව සිටී.

10 වෙනි වාක්‍යයෙහි "වාදස කොටියො, අසීති සතසහස්සානි" යන පද අන්පදයන්ගේ විශෙෂණ නොවෙති. නමුත් කොටස් වශයෙන් සංඛ්‍යාවන් දක්වන ආකාරයට නිදර්ශන වශයෙන් මෙහි ඇතුළත් කරනලදී. "රූපියල් (පිළිබඳ) කෝටි දෙළසක්ද ලක්‍ෂ අසූවක් ද"යි අර්ථ දතයුතුයි.

**පොත්වලින් උපුටාගත් නිදර්ශන:**

1. "චත්තාරි සතසහස්සානි ඡළභිඤ්ඤා මහිද්ධිකා
දීපඞ්කරං ලොකවිදුං පරිවාරෙන්ති සබ්බදා"
(බුද්ධවංසපාළි)

(=ෂඩභිඥ ඇති මහත්සෘද්ධි ඇති සාරලක්‍ෂයක් රහත්හු හැම කල්හි දීපඞ්කරසර්වඥයන් වහන්සේ පිරිවරත්)

2. "සතසහස්සවස්සානි ආයු තස්ස මහෙසිනො" (=ඒ සර්වඥයන් වහන්සේගේ ආයුෂය අවුරුදු ලක්‍ෂයකි) බුද්ධවංසපාළි. "සතසහස්සවස්සානි" යන්න "ආයු" යන එකවචනයට විශෙෂණයි.

3. "පුන නාරදකූටම්හි පවිවෙකගතෙ ජිනෙ
ඛීණාසවා විතමලා සමිංසු සතකොටියො"
(බුද්ධවංසපාළි.)

(=නැවත සර්වඥයන් වහන්සේ නාරදකූටයෙහි විවේකීව වසන කල්හි පහවූ කෙලෙස් ඇති සියක්කෝටියක් රහත්හු රැස්වූහ.) මෙහි "සතකොටියො" යන ස්ත්‍රීලිඞ්ගබහුවචනය 'ඛීණාසවා" යන පුල්ලිඞ්ගික ශබ්දයට විශෙෂණයි.

4. "තිංසාය වස්සසහස්සෙහි ලොහකුම්භිමුඛං පත්වා එකෙකං ගාථං වත්තුකාමා හුත්වා" (=තිස්දහසක් හවුරුද්දෙන් ලෝ සැළියේ මූවිට (ගැටිය)ට පැමිණ එක් එක් ගාථාව කියනු කැමැත්තෝවැ.) ධම්මපදට්ඨකථා (219). මෙහි තිංසාය යන එක වචනය "වස්සසහස්සෙහි" යන බහුවචනයට විශෙෂණවේ.

5. "ඉමස්මිං ජම්බුදීපෙ එකසතං රාජානො එකසතං අග්ග මහෙසියො" (=මේ දඹදිව එක්සියයක් රජවරුද එක්සියයක් මෙහෙසියෝ ද වෙති.) ධ. අ. (221.) "මෙහි එකසතං යන නපුංසක එකවචනය පුල්ලිඞ්ග- ස්ත්‍රීලිඞ්ගයන්හි බහුවචනයන්ට විශෙෂණවී සිටී.

6 "කස්සපො භගවා ...... වීසතියා ඛීණාසවසහස්සෙහි සද්ධිං චාරිකං චරමානො බාරාණසිං අගමාසි" (=කාශ්‍යපසම්බුද්ධයන්වහන්සේ ............... විසිදහසක් රහතන් වහන්සේ සමග චාරිකාවෙහි හැසිරෙමින් බරණැසට වැඩිසේක)

ධම්මපදට්ඨකථා (219.)

## අභ්‍යාසය 7.

### මේ වාක්‍යයන් පාලියට නැගියයුතු:

1. ගම් විස්සකින් පන්සියයක් මිනිස්සු ආහ. 2. අපි ගොණුන් විසිදෙනෙකුන්ට තණකොළ දුනිමු. 3. ඔවුහු තිස් නමක් භික්ෂූන්ට සිවුරු විසිපහක් දුන්හ. 4 ගොවියෝ හතළිස් දෙනෙක් ගොණුන් අසූවක් මිළදී ගත්හ. 5. ස්ත්‍රීන් සතරදෙන ගේ පුත්‍රයෝ සතරදෙන රුපියල් හාරදහසකින් ගෙවල් සත රක් සෑදවූහ. 6. දාසයෝ අටදෙන පෙරෝ අටකින් ගස්හැටක් කැපූහ. 7. ගෙවල් සියයක දහසක් මිනිස්සු වෙසෙත්. 8. දීපඞ්කර සම්බුද්ධයන් වහන්සේ සාරලක්ෂයක් රහතන් වහන්සේ සමග අමර නගරයට පිවිසිසේක. (=පාවිසි)

### ඉලක්කම් වලින් දක්වා තිබෙන ගණන්වලට පාලිවචන යෙදියයුතු:

1. 4 ඉත්ථියො 4 පුත්තානං 4 අම්බෙ අදංසු. 2. 10 වාණිජා 500 සකටෙහි භණ්ඩානි හරිංසු. 3. ධනවා අත්තනො 2 භාතරානං 200 රූපියානි අදාසි. 4. 20 මනුස්සා 500 භික්ඛූනං දානමදංසු 5. එකො ධනවා 5000 රූපියෙහි චෙතියං කාරාපෙසි. 6. රාජා 20 වාණිජානං 10000 රූපියානි දත්වා 50 අස්සෙ ගණ්හි. 7. අනාථපිණ්ඩිකො 540000000 විස්සජ්ජෙත්වා /ජෙතවනමහාවිහාරං කාරෙසි. 8. සො නිබද්ධං 500 භික්ඛු භොජෙසි.

## 16 සර්වනාමවිශේෂණ.

1. තාසං ඉත්ථීනං කතමා පඤ්ඤවතී?

2. තයො පුරිසා එකං වනං අගමිංසු, තෙසු එකො ඉතරෙසං ද්වින්නං මග්ගං දස්සෙසි.

3. සබ්බාසං වනිතානං සබ්බෙ භත්තාරො අඤ්ඤං ගාමං අගමිංසු.

4. තස්ස පුරිසස්ස තෙ පුත්තා තස්මිං ඨානෙ ඨත්වා තං ගොණං තෙන දණ්ඩෙන පහරිංසු.

5. ඉමිස්සා ඉත්ථියා අයං ධීතා ඉමාය සූචියා ඉදං වත්ථං සිබ්බි.

6. ඉමෙසං උභින්නං පුරිසානං සබ්බං ධනං තෙහි චොරෙහි ගහිතං.

7. "තිස්ස, මහල්ලකභික්ඛූනං සබ්බමෙතං වත්තං කාතුං වට්ටති. ............එතෙ භික්ඛූ ඛමාපෙහීති." චූළතිස්ස. ධ. අ.

8. "සො නිමුජ්ජිත්වා අඤ්ඤෙන ඨානෙන පලායි." "අඤ්ඤං තෙ කුමාරිකං ආනෙස්සාමි." "තස්මිං සමයෙ සත්ථා පරිසමජ්ඣෙ ධම්මං දෙසෙති." ධ. අ.

9. "තස්මිං ඛො පන නිවෙසනෙ සබ්බෙව දාසකම්මකරා විසාඛාය සන්තකාව." "එතෙන හි අග්ගිනා සදිසො අග්ගි නාම නත්ථීති එවං ඉමස්මිං කාරණෙ සා නිද්දොසාව අහොසි" ධ. අ. විසාඛාවත්ථු.

10. "තුම්හෙ කෙනාකාරෙන ගතාති?" "උභොහි හත්ථෙහි ජණ්ණුකානි ඔලම්බිත්වා නිත්ථුනන්තා...... .අත්ථි නු ඛො කිඤ්චි ගෙහෙති ආහ." ධ. අ. 205.

### අභ්‍යාසය 8.

පාලියට නැගියයුතු:-

1. ඒ පුරුෂයන්-අතුරෙන් කවරෙක් බලවත් වේද? 2. අසවලා මේ ගමේ සියලු ගෙවල් දන්නේයයි කවරකුට කියහැකිද? (=කො වත්තුං සමත්ථො). 3. සොහොයුරන් දෙදෙනාගේ සියලු දරුවෝ එක්තරා වනයකට ගොස් බොහෝ මුවන් මැරූහ. 4. මේ ගෘහපතියාගේ දියණියන් විසින් අරශාලාවේදී මේ රෙදි වියන ලදහ. 5. මවුපියන් දෙදෙනාගේ (=උභශබ්දය යොදනු) සියලු ධනය ඔවුන්ගේ දරුවන් සතරදෙනාට දෙනලදී. 6. අර

සත්‍රීන් දෙදෙනගේ ස්වාමිවරු දෙදෙන අන්ගමකට ගොස් මේ ගොනුන් විසිදෙන ගෙනාහ. 7. මේ නුවර සියලු ගෘහපතීන්ගේ දාසයෝ අර විල්වලින් රතුනෙලුම් ගෙනවුත් අන් චෛත්‍යයකට පිදූහ. 8. කුමක්හෙයින් තොපගේ සහෝදරයෝ අන්‍යයන්ගේ ගොනුන්ට පහරදෙත්ද?

---

## 17. සමාසවිශෙෂණ.

1. "සො ……… **ධමනිසන්ථතගත්තො ආලසියාභිභූතො කච්ඡුපරිකිණ්ණො** අහොසි" (ධ. අ. 147.)

2. "**අසීතිසකටමත්තානි** ඛදිරදාරූනි ආහරාපෙත්වා පූරෙත්වා." ධ. අ.

3. **සබ්බසෙතස්ස** හත්ථිපොතකස්ස **දායකො එකචාරිකො** හත්ථි සාරිපුත්තත්ථෙරෙ අහොසීති" (ධ. අ. රාධත්ථෙර.)

4. "**කතභත්තකිච්චෙන** ථෙරෙන සද්ධිං මධුරපටිසන්ථාරං කත්වා එවමාහ." (ධ. අ. අග්ගසාවක.)

5. "**පියංවදො** කරවීකසකුණො **මධුරරසං සහකාරඵලං** මුඛතුණ්ඩකෙන පහරිත්වා පග්ඝරිතරසං සායිත්වා… ……… **සකල වනගහණනිස්සිතං** සත්තකායං මත්තං .. ……… කරොන්තො … … …විරවති" (මහාබොධිවංස)

6. "**පාතුභූතසත්තරතනො** රාජා කාලිඞ්ගො චක්කවත්ති එකදිවසං **සබ්බාලඞ්කාරපතිමණ්ඩිතො මාලාවිලෙපනධරො** ………… …**සබ්බසෙතං කෙලාසකූටපටිභාගං** ගජරතනමාරුය්හ … ……… මාතාපිතුන්නං අස්සමපදං පායාසි."

(මහාබොධිවංස.)

7. "සාවත්ථියං **අනාථපිණ්ඩික- විසාඛාදි- පඤ්චකොටිමත්තා** අරියසාවකා **විසකොටිමත්තා** කල්‍යාණපුථුජ්ජනා ච ගන්ධමාලාදයො ආදාය සන්නිපතිංසු." (මහාබොධිවංස.)

8. "**සත්තරතනමයං** වෙදිකං කාරාපෙත්වා **සුවණ්ණමිස්සකං** වාලුකං ඔකිරිත්වා පාකාරෙන පරික්ඛිපිත්වා **සත්තරතනමයං** වාරකොට්ඨකං කාරාපෙසි" (මහාබොධිවංස.)

9. "**තිංසයොජනිකං** මග්ගං ගන්ත්වා **උත්තුඞ්ගතරඞ්ග** භඞ්ගාභිරාමං ගඞ්ගං නදිං උත්තරිත්වා **වරරාජගහං** රාජගහං නාම **අතිමනොහරං** නගරං පවිසිත්වා තත්ථ **ඉස්සරියමදමත්තං** ජනං පරිහාසෙන්තො විය **සන්තින්ද්‍රියො සන්තමානසො** …. … පිණ්ඩාය චරිත්වා.... …. විරොචමානො නිසීදි." (මහාබොධිවංස.)

10. "දසසහස්සයනො විජයුත්තරං නාම වීසංරතනසතායාමං භුවනවිවරව්‍යාපිනාදං සඞ්ඛං ධමයන්තො අඨාසි". (මහාබොධිවංස.)

---

## 18. එක් විශෙෂ්‍යපදයකට විශෙෂණ බොහෝ ගණනක් එකවිට යෙදියහැක:

1. සීලවා ධනවා පුරිසො ගච්ඡති.
2. වනචරකා මහන්තානි සෙතානි පදුමානි ආහරන්ති.
3. කාලා දුප්පඤ්ඤා ඉත්ථී සෙතං සුඛුමං වත්ථං පරිදහති.
4. ධනවන්තො බලවන්තො කාලා පුරිසා ගාමං ගච්ඡන්ති.
5. සෙතා සීලවතී පඤ්ඤවතී වනිතා මහන්තං නීලං පීඨං කිණි.

6. ආගච්ඡන්තානං පාපකාරීනං දසන්නං තෙසං පුරිසානං සකබලා දුම්මෙධා පුත්තා මහන්තෙන සෙතවණ්ණෙන අඩගොණෙන මාරෙසුං.

7. ලක්ඛණට්ඨකො බලවා දළ්හො ධාවන්තං රථං කූටගොණං දීඝාය දළ්හාය රජ්ජුයා බන්ධිත්වා එකස්මිං මහන්තෙ දළ්හෙ ථම්භෙ උපනිබන්ධි.

8. මහාපුරිසො— කෙතකාසොකචම්පකාදිනානාතරුෂණ්ඩමණ්ඩිතං මිගතුරඟනාගව්‍යග්ඝාදිචතුප්පදගණානුචරිතං දෙවදානවාදිනානාභූතසත්තනිසෙවිතං අනෙකවිධරතනාකරං සුරකින්නරනාගරඞ්ගමණ්ඩලං හිමවන්තං අපෙක්ඛාසි.

9. මොහන්ධකාරවිධංසකො ධම්මදීපඞ්කරො ලොකසිවඞ්කරො දීපඞ්කරො නාම අනුත්තරො සම්මාසම්බුද්ධො වරරුචිරදස්සනෙ ජනනෙත්තමනොහරෙ සුදස්සනමහාවිහාරෙ විහරති.

10. "සො ............... දීපඞ්කරලොකනාථං සුනිවත්ථං සුපාරුතං සන්තින්ද්‍රියං සන්තමානසං ලක්ඛණානුබ්‍යඤ්ජනසම්පන්නං ඡබ්බණ්ණබුද්ධරංසියො විස්සජ්ජන්තං අරියගණපරිවුතං අලඞ්කතමග්ගපටිපන්නං දෙවමනුස්සෙහි පූජියමානං දිස්වා ............... අවකුජ්ජො හුත්වා .... ............ කලලපිට්ඨෙ නිපජ්ජි." (මහාබොධිවංස)

11. මහන්තානි මහන්තානි පබ්බතකූටානි ධූපායන්තානි පජ්ජලන්තානි ආකාසෙනාගන්ත්වා බොධිසත්තං පත්වා දිබ්බමාලාගුළභාවං ආපජ්ජිංසු.

---

## භින්නාධිකරණ විශෙෂණ,

**19.** මින් පෙර විශෙෂණ ගැන දක්වූ සියල්ල සමානාධිකරණ විශෙෂණ ගැනයි. **යම්තැනක විශෙෂණය විශෙෂ්‍යයාගේ ලිඞ්ගවිභක්තිසඞ්ඛ්‍යාවන් ගනී නම් එය සමානාධිකරණ විශෙෂණයයි. යම්තැනක ඒ දෙදෙනාගේ සමානලිඞ්ගවිභක්ති සංඛ්‍යාවලින් සිටීමක් නැත්නම් එය භින්නාධිකරණයයි.**

බ්‍රාහ්මණස්ස පුත්තො (=බමුණාගේ පුත්‍රයා.)
තස්සා මාතාපිතරො (=ඇගේ මව්පියෝ.)
රඤ්ඤො ඡත්තං (=රජුගේ ඡත්‍රය.)
භික්ඛුනො චීවරං (=භික්ෂුවගේ සිවුර.)
සෙට්ඨිනො පාසාදෙ (=සිටුහුගේ ප්‍රාසාදය.)

ආදී සම්බන්ධවිභක්තියෙන් යුත් පද බොහෝසේම භින්නාධිකරණ විශෙෂණ වෙති.

**භින්නාධිකරණ විශෙෂණ තෘතීයාවෙන් ද සිටිති.**

"එකූනතිංසො වයසා සුභද්ද
යං පබ්බජිං කිං කුසලානුඑසී."

(=සුභද්‍රය, මම **වයසින්** එකුන්තිස් හවුරුදු ඇත්තේ කුශලය කුමක්දැයි සොයමින් පැවිදිවීමි.) මහාපරිනිබ්බාණසුත්ත. මෙහි "වයසා" යන්න කරණාර්ථයෙහි හෝ අන්‍යාර්ථයෙක්හි නොවේ, 'එකූනතිංසො' යන්නට විශෙෂණවශයෙන්ම සිටි හෝයි.

2. "විපස්සී මාරිස, භගවා අරහං සම්මාසම්බුද්ධො ඛත්තියො ජාතියා අහොසි ……………… කොණ්ඩඤ්ඤො ගොත්තෙන" (=භවත්නි, විදර්ශී අහීයි සම්‍යක්සම්බුද්ධතෙමේ ජාතියෙන් ක්‍ෂත්‍රිය විය, ගොත්‍රයෙන් කෞණ්ඩන්‍ය විය.) මහාපදානසුත්ත.

3. "තස්ස ධම්මෙසු දායාදො ඔරසො ධම්මනිම්මිතො
සාරිපුත්තොති නාමෙන හෙස්සති අග්ගසාවකො."

(=ඒ සර්වඥයන්වහන්සේගේ ධර්මයන්හි දායාදයෙක්වූ ඖරසවූ ධර්මනිර්මිතවූ නමින් සැරියුත් නම්වූ අග්‍රශ්‍රාවකයෙක් වන්නේය.) අපදානපාළි 19.

4. "වාමෙන සූකරො හොති-දක්ඛිණෙන අජාමිගො,
සරෙන නෙලකො හොති-විසාණෙන ජරග්ගවො."
(සම්මොහවිනොදනී.)

(=වම්පසින් ඌරෙක් වේ; දකුණුපසින් එළුවෙක්වේ; හඬින් වස්සෙක් වේ; අගින් මහලු ගවයෙක් වේ.) මේ කියවෙන්නේ ප්‍රේතයකුගේ ලක්ෂණයි.

5. "එවං සො භින්නෙන හදයෙන අක්ඛීහි නික්ඛමන්තෙහි ජීවිතක්ඛයං පාපුණි" (=මෙසේ හෙතෙම පැළුණු හෘදයෙන් හා නික්මුණු ඇසින් යුක්තව ජීවිතක්ෂයට පත්විය.)

168. සකුණග්ඝිජාතක.

## අභ්‍යාසය 9.

මේ වාක්‍යයන් පාලියට නැගියයුතු:

1. දෙවානම්පියතිස්සරජුගේ බාලසොහොයුරුවූ මහානාම නම් යුවරජුගේ භාර්‍යාවූ අනුලාදේවිය සර්වාලඞ්කාරයෙන් සැරසී පන්සියයක් ස්ත්‍රීන් විසින් පිරිවරනලදුව අවුත් තෙරුන් වහන්සේ වැඳ එක්පසකැ හුන්නීය.

2. ශාක්‍යකුලතිලකවූ සර්වඥයන් වහන්සේ රහතන් දහසක් විසින් පිරිවරනලදුව නොයෙක් සියගණන් වෘක්ෂයන්ගෙන් අලඞ්කෘතවූ ලඨිවන නම් උයනට පිවිස දොළොස් නහුතය (120000)ක් බ්‍රාහ්මණගෘහපතීන් පිරිවැරූ බිම්සර රජුට දහම් දෙසූසේක.

3. සුදත්ත නම් ඇති අනාථපිණ්ඩික සිටුතෙමේ ජෙතරජ කුමාරයාගේ සෙවනින් හා ජලයෙන් යුක්තවූ සිහිල් සුදු වැලි තලා ඇති පිපි පියුම්පුලින් ගැවසිගත් පොකුණුවලින් අලඞ්කෘතවූ අතිශයෙන් ඇලුම්කටයුතු උයන මිලදීගෙන එහි මහාප්‍රාකාරයකින් පරික්ෂිප්තවූ නොයෙක් විසිතුරු ප්‍රාසාද ඇති විහාරයක් කරවිය.

4. ඒ සිල්වත් ගුණවත් නුවණැති ස්ත්‍රීන්ගේ ධනවත් බලවත් දරුවෝ මහත් විසිතුරු ගෙවල් සෑදවූහ.

5. කාරුණිකවූ ස්වාමිතෙමේ විශ්වාසවූ දක්ෂවූ සෙවකයන් දශදෙනකුන්ට ජවසම්පන්න රතුඅසුන් දශදෙනකුන් දුන්නේය

6. සුරනිමිල නම් යොධතෙමේ මහත් කළු අසකුපිට නැගී ප්‍රාකාර දොරටු අටලු ප්‍රාසාද ඇති නොයෙක් සියගණන් වෙළඳ හල්පෙළින් ගැවසිගත් මහාචෛත්‍යාදියෙන් අලඞ්කෘතවූ නොයෙක් දහස්ගණන්භික්ෂූන්ගෙන් ගැවසිගත් අනුරාධපුරයට ඇතුල්විය.

## කර්තෘකර්මාදිය තැබියයුතුතැන්.

**20. අසුවල් පදය අසුවල් තැනම තැබියයුතුයයි නියමයක් ව්‍යාකරණයෙහි නැතත් කර්තෘපදය වාක්‍යයේ මුලද ක්‍රියාව අගද කර්මය මැද ද ඔවුන්ගේ විශේෂණ පද ඇත්නම් ඒවාට මුලින් ද යෙදීම පාලියේ සාමාන්‍ය රීතියයි.**

(කර්තෘගේ විශේෂණ කර්තෘපදයට මුලින්ද කර්මවිශේෂණ කර්මයට මුලින්ද ක්‍රියාවිශේෂණ ක්‍රියාවට මුලින්ද තැබියයුතු.) පූර්වක්‍රියාවන් අවසාන ක්‍රියාවට මුලින් යෙදිය යුතුයි.

යටදැක්වූ බොහෝ වාක්‍යයන්ගෙන් මේ සාමාන්‍යරීතිය ප්‍රකටවන බැවින් මෙහි උදාහරණ දැක්වියයුතු නොවේ.

මේ සාමාන්‍ය රීතියට වෙනස්ව යෙදෙනතැන්ද දුලබ නොවෙත්. **ගාථාබන්ධනයේදී බොහෝසේම මේ පිළිවෙල නොසලකනු ලැබේ:-**

“අථ නං දහරා ච සාමණේරා ච අනුබන්ධිත්වා ආදාය සත්‍ථු සන්තිකං අගමංසු” යන දම්පියාඅටුවාපාඨයෙහි කර්මය මුලින් යොදා තිබේ.

“පුඤ්ඤඤ්චෙ පුරිසො කයිරා, කයිරාථෙතං පුනප්පුනං” යන ධම්මපදගාථාවෙහිත් එසේම යොදා තිබේ.

“උපෙමි බුද්ධං සරණං ධම්මඤ්චාපි අනුත්තරං
සංඝං ච නරදෙවස්ස ගච්ඡාමි සරණං අහං”

යන විමානවත්ථුගාථාහි ක්‍රියාව මුල ද කර්තෘපදය අග ද යොදා තිබේ.

**21.** **ප්‍රශ්න ඇසීමේදී කිංශබ්දාදියෙන් සෑදුණු පදත් අන්‍යනිපාතපදාදියත් වාක්‍යයේ මුල යෙදෙනබව පෙනේ:-**

1. “කිං කරෙසි භාතික?” (ධ. අ. 3.)
2. “කහං ගතො’සි ආවුසො?” (ධ. අ. 333.)
3. “කුහිං යාසි උපාසක?” (ධ. අ. 9.)
4. “කස්මා සො සප්පා එතං න ඩසි?” (ධ. අ. 333.)
5. “කො තත්‍ථ වසති?” (ධ. අ. 7.)
6. “කෙනායං ගණ්ඨි පහටො?” (ධ. අ. 328.)
7. “කච්චි පන මෙ මාතාපිතරො තුය්හං කුඩා?” (ධ. අ. 316)
8. “කං’සි ත්වං ආවුසො උද්දිස්ස පබ්බජිතො? කො වා තෙ සත්‍ථා? කස්ස වා ත්වං ධම්මං රොචෙසි?” (ධ. අ. 46.)

මේ සාමාන්‍යරීතිය ඉක්මවා යෙදුණුතැන් ද විද්‍යමානවෙති:-

"සචාහං ගෙහං ගමිස්සාමි, 'සාමිකො තෙ කුහිං?'න්ති පුච්ඡිස්සන්ති." (ධ. අ. 318.)

**22. ආලපනය වාක්‍යයේ මුල හෝ අග යෙදීම සාමාන්‍ය රීතියයි.**

1. "භන්තෙ, ඉමස්මිං සාසනෙ කති ධුරානි?" (ධ. අ. 4.)

2. "ආවුසො, ඉමං තෙමාසං කතිහි ඉරියාපථෙහි වීතිනාමෙස්සථ?" (ධ. අ. 4.)

3. "භාති, සචෙ වෙජ්ජං ආනෙස්සාමි, භත්තවෙතනං දාතබ්බං භවිස්සති." (ධ. අ. 13.)

21 වෙනි අඞ්කයෙව යටින් දැක්වූ 1-2-3 වෙනි වාක්‍යයන්හි ආලපනය අග යෙදී තිබේ.

4. "අයං මෙ භන්තෙ සම්පත්ති තුම්හෙසු මනං පසාදෙත්වා ලද්ධා" (ධ. අ. 18) යනාදි වාක්‍යයන්හි මෙකී සාමාන්‍යරීතියට වෙනස්ලෙස ආලපනය යොදා තිබේ.

**23. ප්‍රතිවචන දීම සඳහා යොදන "ආම, එවං" ආදි වචන බොහෝසේ වාක්‍යයේ මුල යොදනු ලැබේ.**

1. "ආම, සම්ම, ඉදානාහං විහාරං ගන්ත්වා ථෙරං ........ දිස්වා ආගතොම්හි." (ධ. අ. 10.)

2. ("පස්සථ නො තුම්හෙ භික්ඛවෙ අමුං මහන්තං අග්ගික්ඛන්ධං?) එවම්භන්තෙ." (අග්ගික්ඛන්ධොපමසුත්ත.)

3. ("කිම්පන භන්තෙ ඉදානි පි දිනෙන ලභිස්සන්තීති?) ආම මහාරාජාති." (ධ. අ. 52.)

මේ වාක්‍යයන් හි "ආම- එවං" නිපාතයන් ආලපනයටත් මුලින් යෙදී තිබෙන බව සැලකියයුතු.

**24. වචන පිළිගැන්මෙහි වූ "සාධු" ආදිය ද වාක්‍යයේ මුල යොදනු ලැබේ.**

1. "සාධු, සාමි, යථාජ්ඣාසයං කරොථ" (ධ. අ. 34.)

2. "සාධු, භන්තෙ, එකං රූපාරම්මණං දිස්වා මය්හං කථෙය්‍යාසි" (ධ. අ. 35.)

3. "එවමාවුසො ති ඛො ආයස්මා ආනන්දො තස්ස භික්ඛුනො පටිස්සුත්වා යෙන භගවා තෙනුපසඞ්කමි."

(මහාපරිනිබ්බාණ සුත්ත.)

මේ වාක්‍යත්‍රයෙහි ම වචනප්‍රතිග්‍රහණයෙහි නිපාත ආලපනයවත් මුලින් යෙදී තිබේ.

### අභ්‍යාසය 10.

මේ වාක්‍යයන් පාලියට නැගියයුතු:-

1. ඔව්හු කොහි ගියාහුද? 2. කවරෙක් එහි ගියේද? 3. තෝ කුමක් හෙයින් ඊයේ නාවෙහිද? 4. හොඳයි මිතුර මමත් උඹ සමග යන්ට එන්නෙමි. 5. මේ ගමෙහි මිනිස්සු කීදෙනෙක් විසූවෝද? 6. ඇවැත්නි, හෙට අපි අනුරාධපුරයට යන්නෙමු. 7. එම්බා පුරුෂයෙනි, පව් නොකරව්. 8. ස්වාමීනි, මේ විහාරයෙහි කීනමක් භික්ෂූහු වසත්ද? 9. උපාසකය, කොයින් (කොහි සිට) එන්නෙහිද? 10. 'එසේය ස්වාමීන් වහන්සැ'යි මනුෂ්‍යයෝ භික්ෂූන්ට පිළිතුරු දුන්හ.

---

## ක්‍රියාකාරකසම්බන්ධය.

**25.** කර්තෘපදයක් හා ක්‍රියාපදයක් නැතිව වාක්‍යයක් සෑදිය නොහැකිබව යට කියනලදී. නමුත් ඇතැම් තැනක "ගච්ඡ, අමුම්හි ඔකාසෙ තිට්ඨාහි" (=යව අසවල් තැන සිටුව), "ආගච්ඡාහි ති වත්තබ්බො" (=එව යි කියයුතුය) යනාදිවශයෙන් කර්තෘපදයක් නැතිවාක්‍ය දක්නාලැබේ. ඒ වාක්‍යයන්හි කරන්නන් නැති නිසා එසේ දක්වනලද්දේ නොවේ, කර්තෘපද නොදක්වූවත් අර්ථාවබොධයට බාධානැති බැවින් එසේ කියනලදී. "යව, සිටුව, එව" යන ක්‍රියාවන් මධ්‍යමපුරුෂඑකවචන බැවින් ඒවායේ කර්තෘ 'තෝ' (ත්වං) වියයුතු යි. මෙසේ යම් තැනක කර්තෘපදය නොදක්වනලද්දේ නම් ක්‍රියාපදයේ පුරුෂයත් සංඛ්‍යාවත් බලා නොකියා හරනලද කර්තෘපදය (අධ්‍යාහාරකොට) යොදාගත යුතුයි.

මෙසේම ක්‍රියාපද නොයෙදූ වාක්‍ය ද දක්නා ලැබේ. **ධම්මපදඨකථාවේ** චක්ඛුපාලවත්ථුවෙහි දෙතැනකම "තුම්හෙ පන භන්තෙ" යන වාක්‍යය පෙනේ. මේ පොත අවසානයෙහි වූ "පරිවර්තනපරිච්ඡෙදයෙහි"ද එය පෙනේ. මෙහි තිබෙන්නේ කර්තෘපදය පමණකි, එබැවින් 'කිං කරිස්සථ" යි කාමීයත් ක්‍රියාවක් අධ්‍යාහාරකොට වාක්‍යය සම්පූර්ණකළයුතු වේ. "ඔබවහන්සේ වනාහි කුමක් කරන්නහුදැයි" යි ඇසීම සඳහා මේ වාක්‍යය යොදා තිබේ. මෙසේ යම් තැනක ක්‍රියාව යොදා නැත් නම් එතැන්හි කර්තෘට අයත් පුරුෂය බලා ඊට ගැළපෙන ක්‍රියාවක් යොදාගත යුතු.

**26. එක් කර්තෘපදයකට සම්බන්ධකොට එකකට වැඩි ගණනක් ක්‍රියාපද යෙදියහැක:**

1. "පදුමරාජා බාරාණසියං රජ්ජං කාරෙති, සකලජම්බුදීපං සංඛොභෙත්වා දානං දෙති; සො තං දිස්වා තුස්සිස්සති, තුට්ඨො බහුං ධනං දස්සති." (චුල්ලපදුම ජාතක.)

මෙහි "කාරෙති, දෙති" යන ක්‍රියාවයට කර්තෘවූයේ "පදුම රජ" යන්නයි. "තුස්සිස්සති, දස්සති" දෙකට කර්තෘවූයේ "සො" යන්නයි. 'පදුමරාජා රජ්ජං කාරෙති, පදුමරාජා ......... දානං දෙති. සො ...... තුස්සිස්සති; සො තුට්ඨො බහුං ධනං දස්සති"යි එක්එක් ක්‍රියාවට වෙන්වශයෙන් කර්තෘපද යොදා අර්ථාවබොධය කළයුතු.

2. "කිං භණෙ තිට්ඨථ? ඉමං කුමාරං ගණ්හථ, හනථ, පලාපෙථ" (ජාතකනිදාන.)

මෙහි "තුම්හෙ කිං තිට්ඨථ? තුම්හෙ ඉමං කුමාරං ගණ්හථ; තුම්හෙ .........හනථ; තුම්හෙ ........පලාපෙථ"යි 'තුම්හෙ' යන කර්තෘපදය ක්‍රියාවක් පාසා අධ්‍යාහාරකටයුතුයි.

3. 'භගවා තෙව තාසං වචනං මනසි අකාසි; න අක්ඛිනි උම්මිලෙත්වා ඔලොකෙසි; ................ විවෙකසුඛමෙවාදැව අනුභවන්තො නිසීදි. (ජාතකනිදාන.)

4. "අම්හෙ පන තිංසමත්තා ජනා පාණං න හනාම; අදින්නං නාදියාම; මිච්ඡා න චරාම; මුසාවාදං න කථෙම; මජ්ජං න පිවාම; මෙත්තං භාවෙම; දානං දෙම; මග්ගං සමං කරොම; පොක්ඛරණියො ඛණාම; සාලං කරොම."

(කුලාවක ජාතක.)

මෙහි සියලු ක්‍රියාවන්ට "අම්හෙ" යන්න කර්තෘ වේ.

---

27. කර්තෘපද වෙන්ව සිටියත් ඔවුන්ගේ ක්‍රියාව එකක් විනම්(කර්තෘපද දෙකකට හෝ වැඩිගණනකට) එක් ක්‍රියාපදයක් බහුවචනයෙන් යෙදිය හැක:

1. "තස්මිං ඛණෙ මහාමොග්ගල්ලානත්ථෙරො ච ආනන්දත්ථෙරො ච විහරන්ති" (ධ. අ. 299.)

මෙහි කර්තෘපද දෙකක් එකවචනයෙන් සිටි නමුත් කර්තෘන් දෙදෙනාගේ සිතීම් ක්‍රියාව එකක්ම වූ බැවින් එක් ක්‍රියාපදයක් යොදනලදී.

2. "එකස්මිං පබ්බතපාදෙ සීහො ච ව්‍යග්ඝො ච එකිස්සා යෙව ගුහාය වසන්ති." (මාලුත ජාතක.)

3. "සත්ථරි අග්ගාළවෙ චෙතියෙ විහරන්තෙ බහු උපාසිකා ච භික්ඛුනියො ච විහාරං ධම්මසවණාය ගච්ඡන්ති; ............ ගච්ඡන්තෙ පන කාලෙ උපාසිකා ච භික්ඛුනියො ච න ගච්ඡිංසු, භික්ඛූ චෙව උපාසකා ච අහෙසුං" (තිපල්ලත්ථමිගජාතක.)

මෙහි එක් එක් ක්‍රියාවට බහුවචනවූ කර්තෘපද දෙක බැගින් වෙති.

4. රාජා ච රාජපුත්තා ච ජනපදෙ නියුත්තකපුරිසා ච භණ්ඩාගාරිකා ච අනුපුබ්බෙන කාලංකත්වා සද්ධිං පරිසාය සග්ගෙ උප්පජ්ජිංසු" (තිරොකුඩ්ඩවණ්ණනා.)

මෙහි බහුවචනයක් ද එකවචන තුනක් ද "උප්පජ්ජිංසු" යන එකම ක්‍රියාවට කර්තෘපදව සිටිති.

---

**28. පුද්ගලයන් වශයෙන් බොහෝ දෙනෙකුන් වුවද් සමූහයක් වශයෙන් ගනු ලබන කල්හි කර්තෘපදය එකවචනයෙන් සිටී, ක්‍රියාපදයත් එය අනුව යේ:**

1. "අථ ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධො යෙනා' යස්මා ආනන්දො තෙනුපසඞ්කමි ............ එකමන්තං නිසින්නං ඛො රඤ්ඤො උදෙනස්ස ඔරොධං ආයස්මා ආනන්දො ධම්මියා කථාය ............ සම්පහංසෙසි. අථ ඛො ............ ඔරොධො ............ ආයස්මතො ආනන්දස්ස පඤ්චඋත්තරාසඞ්ගසතානි පාදාසි." (චූලවග්ගපාළි.)

මෙහි 'ඔරොධ' නම් අන්තඃපුරස්ත්‍රීසමූහය යි. ('මාතුගාම ශබ්දය මෙන් මෙයත් පුල්ලිඞ්ගිකයි.) උදෙන රජුගේ අන්තඃපුර ස්ත්‍රී සමූහය පන්සියයක් පමණවූ නමුත් මෙහි සමූහවශයෙන් ගෙන එකවචනය යොදනලදී.

2. "තෙසු ගච්ඡන්තෙසු සඞ්ඝස්ස පරිසා භිජ්ජි; ............ ආරාමො තුච්ඡො අහොසි." (අග්ගසාවකවත්ථු.)

3. "මහාජනො අත්තනො අත්තනො පුත්ත-ධීතු-ඤාතීනං අත්ථාය පරිදෙවමානො මහාසද්දමකාසි." (ධ. අ. 218)

---

**29. බොහෝ දෙනෙකුන්ගේ ක්‍රියාව එකක් වුවත් කර්තෘන් ගෙන් ඇතැම්කෙනෙකුන් 'සමග' යන්නෙන් සම්බන්ධකරනු ලැබුවහොත් ප්‍රථමාවෙන් සිටි පදය අපෙක්ෂාකොට ක්‍රියාව යොදනු ලැබේ.**

1. "අජ්ජාහං පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං විහාරෙ යෙව නිසීදිස්සාමි" (=අද මම පන්සියයක් භික්ෂූන් සමග විහාරයෙහිම හිඳින්නෙමි.) (මච්ඡරියකොසියවත්ථු.)

මෙහි පන්සියයක් භික්ෂූන්ගේත් අස්මච්ඡබ්දයෙන් වාච්‍යවූ ස්වාමීන් වහන්සේගේත් හිඳීම එකක්ම වුවත් 'සද්ධිං' යන්නෙන් සම්බන්ධකරනුලැබූ බැවින් ප්‍රථමාවෙන් සිටි 'අහං' යන්න අනුව ක්‍රියාව යොදනලදී.

2. "සුරියකුමාරො 'අහම්පි භාතිකෙහි සද්ධිං ගමිස්සාමී'ති තෙහි සද්ධිං යෙව නික්ඛමි" (=සූර්‍ය්‍යකුමාරතෙමේ "මමත් බෑයන් සමග යන්නෙමි"යි ඔවුන් සමගම නික්මුණේය.)
දෙවධම්මජාතක.

සූර්‍ය්‍යකුමාරයාත් සොහොයුරෝත් එක්මගක එක්වම ගියාහුය, නමුත් බෑයන් 'සමග' යන්නෙන් සම්බන්ධකළ බැවින් 'සුරියකුමාරෙ' යන්න අනුව 'නික්ඛමි' යන්නත් 'අහං' යන්න අනුව 'ගමිස්සාමි' යන්නත් එකවචනයෙන් යොදනලදී.

3. "සත්ථා ආනන්දත්ථෙරෙන පච්ඡාසමණෙන පිණ්ඩාය චරන්තො ............ තං පවත්තිං ආචික්ඛි" (=ස්වාමීන්දතෙමේ පසුව යන අනඳමහතෙරුන් හා පිඬුපිණිස හැසිරෙන්නේ.... .......... ඒ ප්‍රවෘත්තිය කීය.) ධ. අ. ආනන්දසෙට්ඨිවත්ථු.

4. "තෙ අත්තනො අන්තෙවාසිකෙහි අඩ්ඪතෙය්‍යෙහි පරිබ්බාජකසතෙහි සද්ධිං වෙළුවනං අගමංසු" (=ඔවුහු තමන්ගේ අතැවැසිවූ දෙසියපණසක් පරිව්‍රාජකයන් සමග වේළුවනයට ගියහ.) අග්ගසාවකවත්ථු.

මෙහි බහුවචනක්‍රියාව අතැවැසියන් සලකාගෙන නොව 'තෙ' යන බහුවචනය සලකාගෙනයි.

---

30. එක් ක්‍රියාවකට කර්තෘපද කිපයක් වූ කල්හි ඒ කර්තෘපද ප්‍රථමාදි පුරුෂයන් අතුරෙන් එක් පුරුෂයකට අයත්විනම් ක්‍රියාපදය යෙදීම අපහසු නොවේ; "උඹත් මමත් ගමට යමු" යන වාක්‍යයෙහි මෙන් කර්තෘන් වෙන් වෙන් පුරුෂවලින් යුක්තවූවිට ක්‍රියාව කිනම් පුරුෂයකින් යුක්තවියයුතුදැයි සෙවියයුතුවේ:

එවැනි වාක්‍යයන්හි පසුවූ පුරුෂය අනුව ක්‍රියාව බහුවචනයෙන් යෙදියයුතු.

ප්‍රථමපුරුෂයට මධ්‍යමපුරුෂයත් මධ්‍යමපුරුෂයට උත්තම පුරුෂයත් පසුවූ පුරුෂය නම් වේ (යම් වාක්‍යයක ප්‍රථමපුරුෂයත් මධ්‍යමපුරුෂයත් යෙදී තිබේනම් ක්‍රියාව මධ්‍යමපුරුෂ බහුවචනයෙන් සිටී. යම් වාක්‍යයක ප්‍රථම- උත්තම පුරුෂද්වය හෝ මධ්‍යම- උත්තම පුරුෂද්වය හෝ පුරුෂත්‍රයම හෝ යෙදී තිබේ නම් ක්‍රියාව උත්තමපුරුෂබහුවචනයෙන් සිටී )

1. ත්වං ච අහං ච වාපිං ගච්ඡාම (=තෝද් මමත් වැවට යමු ) මෙහි ත්වං මධ්‍යමපුරුෂ එකවචනයි, අහං උත්තමපුරුෂ එකවචනයි. ක්‍රියාව උත්තමපුරුෂ බහුවචනයි.

2. තෙපි තුම්හෙපි චිතං ගච්ඡථ (=ඔව්හුත් තෙපිත් චෛත්‍යයට යව්.)

3. සො ච තුම්හෙ ච අහං ච භත්තං භුඤ්ජාම (=ඔව්හුත් තෙපිත් මමත් බත් අනුභව කරමු.)

4. "ධම්මෙන රජ්ජං කාරෙන්තං රට්ඨා පබ්බාජයිත්ථ මං
ත්වං ච ජානපදා චෙව නෙගමා ච සමාගතා"

(=තෝ ද ජනපද වැසියෝ ද නියම්ගම් වැසියෝද එක්වූවහු ධම්යෙන් රාජ්‍යයකරවන මා රටින් පිටුවහල් කළාහුය.)

වෙස්සන්තරජාතක.

5. "අහං ච මද්දිදෙවී ච ජාලී කණ්හාජිනා උභො
අඤ්ඤමඤ්ඤං සොකනුදා වසාම අස්සමෙ තදා"

(=මම ද මද්‍රිදේවිය ද ජාලි-කෘෂ්ණාජිනා දෙදෙන ද එකල්හි එකිනෙකාගේ ශෝක දුරුකරමින් ආශ්‍රමයෙහි වසමු.)

වෙස්සන්තරජාතක.

**මේ යෙදීම කළහැක්කේ සියලු දෙනාගේ ක්‍රියාවන් එක් කාලයක් ප්‍රකාශ කරනහොත් පමණයි.**

## අභ්‍යාසය 11.

1. ක්‍රියාපද බොහෝ ගණනක් හා එක් කර්තෘපදය බැගින් ඇති වාක්‍ය 3 ක් පාලියෙන් ලියනු.

2. එකවචනයෙන් යුත් කර්තෘපද තුනක් ද එක් ක්‍රියාපදයක් ද ඇතිවිතයේ වාක්‍යදෙකක් සම්පාදනය කටයුතු.

3. එකවචන බහුවචන වලින් සිටි කර්තෘපද කීපයක් ඇති එක් ක්‍රියාපදයක් ඇති වාක්‍යයක් ලියනු.

4. සමූහයක් කර්තෘපදය කොට වාක්‍යයක් ලියනු.

5. ප්‍රථමාවෙන් එක් කර්තෘපදයක් තබා ඒ ක්‍රියාවට සම්බන්ධ වෙන අන්‍යයන් තෘතීයාවෙන් සම්බන්ධ කොට වාක්‍ය දෙකක් සම්පාදනය කටයුතු.

6. ප්‍රථමපුරුෂයෙන් හා මධ්‍යමපුරුෂයෙන් සිටි කර්තෘන් ගෙන් යුත් වාක්‍යයක් ද පුරුෂත්‍රයෙන්ම සිටි කර්තෘන්ගෙන් යුත් වාක්‍යයක් ද සෑදියයුතු.

මේ වාක්‍යයන් පාලියට නැගියයුතු:

1. තෙපි මිත්‍රයන් සමග නුවරට යව්.

2. උඹලාත් අපිත් හෙට දළදා වඳින්ට යන්නෙමු.

3. සිල්වත් මනුෂ්‍යයෝ සතුන් නොමරති, සොරකම් නොකරති, බොරු නොකියති, මත්පැන් නොබොති, දන් දෙති, මෛත්‍රී වඩති, පිදියයුත්තන්ට පුදති.

4. බල්ලෙක් ද බළලෙක් ද ගොණෙක් ද මිනිසෙක් ද මිදුලෙහි (=අඞ්ගණෙ) සිටිත්.

5. බොහෝ රජවරු ද සිටුවරු ද බ්‍රාහ්මණයෝ ද ගෘහපතීහු ද පරිව්‍රාජකයෝ ද සර්වඥයන් වහන්සේගේ ධර්මය ඇසීමට පැමිණියහ.

6. නොයෙක් ස්ත්‍රීහුද පුරුෂයෝ ද පිරිමිළමයි ද ගෑණුළමයි ද තරුණයෝ ද තරුණියෝ ද වෙළෙන්දෝ ද යාචකයෝ ද සොරු ද උත්සවකාලයේදී අනුරාධපුරයට පැමිණෙති.

---

**31. එක් කර්තෘපදයක් හා එක් අවසාන ක්‍රියාපදයක් ඇති වාක්‍යයක පූර්වක්‍රියා බොහෝ ගණනක් යෙදියහැක.**

1. බ්‍රාහ්මණො නදිං ගන්ත්වා නහායිත්වා ගෙහං ආගන්ත්වා පචිත්වා භුඤ්ජිත්වා සයි.

2. "ලුද්දකො ගෙහා නික්ඛමිත්වා මිගං උක්කන්තිත්වා අග්ගිං කත්වා ...... ....... මධුරමංසං පචිත්වා ඛාදිත්වා පානීයං පිවිත්වා අවසෙසං ....... කාජෙනාදාය ......... සරං අගමාසි." (කණ්ඩිනජාතක.)

3. "සො ගච්ඡන්තො ......... සකටානි මොචාපෙත්වා සකටපරිවට්ටකෙන ඛන්ධාවාරං බන්ධාපෙත්වා කාලස්සෙව මනුස්සෙ ච ගොණෙ ච .. ..... භොජාපෙත්වා මනුස්සානං මජ්ඣෙ ගොණෙ නිපජ්ජාපෙත්වා සයං බලනායකො ගහෙත්වා ඛග්ගහත්ථො ....... ඨිතකොව අරුණං උට්ඨාපෙසි."

(අපණ්ණකජාතක.)

4. "පුනදිවසෙ පාතොව සබ්බකිච්චානි නිට්ඨපෙත්වා ගොණෙ භොජෙත්වා දුබ්බලසකටානි ඡඩ්ඩෙත්වා පිරුනි ගාහාපෙත්වා අප්පග්ඝං භණ්ඩං ඡඩ්ඩාපෙත්වා මහග්ඝං ආරොපෙත්වා යථාධිප්පෙතං ඨානං ගන්ත්වා......... ...භණ්ඩං වික්කිණිත්වා සබ්බං පරිසං ආදාය පුන අත්තනො නගරමෙව අගමාසි"

(අපණ්ණකජාතක.)

---

32. මුලදී බහුවචනයෙන් එක්ව කියැවුණු කර්තෘන් පසුව එකිනෙකා වෙන්ව වෙනස්වූ ක්‍රියාවන් කළහොත් ක්‍රියාපද මුල් කර්තෘපදය අනුව නොයත්.

1. "තෙ කිර මෙ සහායකා ධම්මසවණත්ථං ගච්ඡන්තෙන මහාජනෙන සද්ධිං ජෙතවනං ගන්ත්වා එකො ධම්මකථං අස්සොසි, එකො අත්තනො ගය්හූපගං ඔලොකෙසි"

(ධ. අ. ගණ්ඨිභෙදකචොරවත්ථු)

මෙහි බහුවචනයෙන් සිටි කර්තෘපදය "ගන්ත්වා" යන පූර්ව ක්‍රියාවට පමණක් කර්තෘ විය, (පසුව දෙදෙන වෙනස් ක්‍රියාවන්හි යෙදුණ බැවින්) අවසාන ක්‍රියාවන්ට කර්තෘ නොවීය.

## අභ්‍යාසය 12.

මේය පාලියට නැගියයුතු:-

බ්‍රාහ්මණයෝ පස්දෙනෙක් සර්වඥයන්වහන්සේගෙන් ධර්මය ඇසීමට ජේතවනාරාමයට ගොස් එකෙක් අහසදෙස බලමින් හුන්නේය, එකෙක් ගසක් සොලවමින් හුන්නේය, එකෙක් නිදාගත්තේය, එකෙක් පොළව සෑරුවේය, එකෙක් සකසා ධර්මය ඇසීය.

1. පූර්වක්‍රියා දෙක බැගින් ඇති වාක්‍ය 2 ක්ද සතර බැගින් ඇති වාක්‍ය 2 ක් ද පූර්වක්‍රියා සයක් ඇති එක් වාක්‍යයක් ද සෑදිය යුතු.

2. මාතුගාම- දර- ඔරොධ- ශබ්දයන් යොදා පිළිවෙළින් වාක්‍යතුනක් සෑදියයුතු.

3. ආලපනය මුලට යොදා එක් වාක්‍යයක් ද සෑදියයුතු.

4. ආලපනයක් හා වචන පිළිගැනීමෙහි වූ 'සාධු' ආදි නිපාතයක් ඇතිව එක් වාක්‍යයක්ද, ප්‍රතිවචනදීමෙහි වූ 'එවං' ආදි නිපාත සමග ආලපනයකුත් ඇතිව වාක්‍ය දෙකක්ද සෑදිය යුතු.

---

## වාක්‍යප්‍රභේදයෝ.

වාක්‍යයෝ වනාහි-

1. අමිශ්‍රවාක්‍ය
2. මිශ්‍රවාක්‍ය
3. සංහතවාක්‍ය වශයෙන් ත්‍රිවිධවෙති.

33. එක් කර්තෘවාචකයකින් හා එක් අවසානක්‍රියාවකින් යුක්තවූයේ **අමිශ්‍රවාක්‍ය** නම්. උදාහරණ:

(1.) පුරිසො ඛෙත්තං කසති.
(2.) "න පුප්ඵගන්ධො පටිවාතමෙති."
(3) "කො න සමෙමා ගමිස්සාදි?"

කර්තෘ-කර්ම-ක්‍රියාවන්ට අයත් විශේෂණපදාදිය නිසා වාක්‍යය කොතරම් දික්වූවත් ඇත්තේ එක් කර්තෘවාචකයක් හා එක් අවසාන ක්‍රියාවක් නම් එය අමිශ්‍රවාක්‍යයක් මය:-

(4) "පාතුභූතසත්තරතනො රාජා කාලිඞ්ගො චක්කවත්ති එකදිවසං සබ්බාලඞ්කාරපතිමණ්ඩිතො මාලාවිලෙපනධරො සබ්බසෙතං කෙලාසකූටපටිභාගං ගජරතනමාරුය්හ මාතාපිතූනං අස්සමපදං පායාසි."

---

34. කර්තෘවාචකය වනාහි ශුද්ධනාමපදයක් හෝ සර්වනාමයක් හෝ සමසිතනාමයක් හෝ විශේෂණපද සහිත නාමයක් හෝ පදසමූදයක් හෝ අන්තර්වාක්‍යයක් හෝ වියහැක:-

අමිශ්‍රවාක්‍යයන්ට උදාහරණ වශයෙන් දැක්වූ (1) වෙනි වාක්‍යයෙහි "පුරිසො" ශුද්ධනාමපදයකි; (3) වෙනි වාක්‍යයෙහි 'පුප්ඵගන්ධො' සමසිත නාමයෙකි; (2) වෙනි වාක්‍යයෙහි "කො" සර්වනාමයකි; (4) වෙනි වාක්‍යයෙහි (i) පාතුභූතසත්තරතනො, (ii) කාලිඞ්ගො, (iii) චක්කවත්ති, (iv) සබ්බාලඞ්කාරපතිමණ්ඩිතො, (v) මාලාවිලෙපනධරො යන පද "රාජා" යන කර්තෘපදයට විශේෂණව සිටිත්.

'තිණ්ණි ඵලානි පතෙන්තන අරියසාවකෙන ඔලොකිත-ඔලොකිතඨානං තමපි" (=ඵලත්‍රයට පැමිණි ආර්යශ්‍රාවකයා විසින් බැලූ බැලූ තැන තමපාවිය) යන වාක්‍යයෙහි "තිණ්ණි ඵලානි පතෙන්තන අරියසාවකෙන ඔලොකිතඔලොකිතඨානං" යන පද සමූදය කර්තෘවාචකය වේ. එයත් අමිශ්‍රවාක්‍යයකි.

"සුනඛකාලෙ පච්චෙකබුද්ධෙ සිනෙහෙන පවත්තිත-භුඤ්ජකරණමත්තමෙව තං රක්ඛති" (=බලුව සිටිකල පසේබුදුන් කෙරෙහි ස්නෙහයෙන් පැවැත්වූ බිරීම් මාත්‍රයම ඔහු රකී) යන වාක්‍යයෙහි ක්‍රියාව 'රක්ඛති' යන්නයි. "තං" කර්මයයි. කවරෙක් ඔහු රකීද? භුඤ්ජකරණමාත්‍රය රකී. කුමන භුඤ්ජකරණයක්ද? පසේබුදුන් කෙරෙහි ස්නෙහයෙන් පැවැත්වූ භුඤ්ජකරණයයි. කොයි කලකදී කළ බිරීමක්ද? බලුව සිටි කල්හි කළ බිරීමයි. මෙසේ "සුනඛකාලෙ පච්චෙකබුද්ධෙ සිනෙහෙන පවත්තිතභුඤ්ජකරණමත්තං" යන මේ පදසමූහය මේ වාක්‍යයේ කර්තෘවාචකයයි.

---

85. කර්මය ද කර්තෘවාචකයට කී ලක්ෂණවලින් යුක්ත විය හැක. (වාක්‍යවිච්ඡේදයේදී කර්මය ආඛ්‍යාතයට අයත් වන බැවින් වාක්‍යප්‍රභේද දක්වීමේදී කර්මය විශේෂාවයවයක් ලෙස නොදක්වන ලදී.)

අනන්තවාක්‍යයක් කර්තෘවාචකය හෝ කර්මය වුවහොත් එය මිශ්‍රවාක්‍යයක් වන බැවින් ඒ ගැන මිශ්‍රවාක්‍යවිභාගයෙහිදී විස්තර කරනු ලැබේ.

---

86. ප්‍රධානානන්තවාක්‍යයක් ඇතිව එට යටත් පැවතුම් ඇති උපානන්තවාක්‍ය එකකින් හෝ වැඩිගණනකින් යුක්ත වූයේ "මිශ්‍රවාක්‍ය" නමි.

(අ) අනන්තවාක්‍යයක් කර්තෘපදයකින් හා අවසාන ක්‍රියාවකින් යුක්තවියයුතුයි. කොසම්බකවත්ථුවෙහි පෙනෙන 'තථාගතස්ස තත්ථ හත්ථිනාගෙන උපට්ඨියමානස්ස වසනභාවො සකලජම්බුදීපෙ පාකටො අහොසි" යන වාක්‍යයෙහි "තථාගතස්ස තත්ථ හත්ථිනාගෙන උපට්ඨියමානස්ස වසනභාවො" යන පදසමූහයම කර්තෘවාචකය වේ (සියලු දඹදිව කුමක් ප්‍රකටවීද? තථාගතයන් වහන්සේ එහි ඇත්රජුවිසින් උපස්ථාන කරනු ලබමින් වසන බව ප්‍රකට විය.) නමුත් ඒ පදසමූහයෙහි ආඛ්‍යාතයක් නැති බැවින් එය පදසමූහයක් මිස වාක්‍යයක් නොවේ.

(ආ) යටත්පැවතුම් ඇතිබව නම් ප්‍රධානානන්තවාක්‍යයාගේ සම්බන්ධය නැතිව අර්ථය සම්පූර්ණ නොවීමයි:

(1) "සචාහං ගෙහං ගමිස්සාමි මාතාපිතරො මං නාජ්ජස්සන්ති" යන මෙහි පළමු කොටසින් "ඉදින් මම ගෙට යන්නෙම් නම්"යි කියවුණු කලැ සම්පූර්ණාර්ථයක් ප්‍රකාශ නොවේ, "මවු

පියෝ මට තර්ජනය කරන්නාහ" යන ප්‍රධානවාක්‍යයාගේ සම්බන්ධය ඇතිකල්හිම අර්ථය සම්පූර්ණවේ. මෙහි "සචාහං ගෙහං ගමිස්සාමි" උපානුගතවාක්‍යයයි. "මාතාපිතරො මං තජ්ජෙස්සන්ති ප්‍රධානානුගතවාක්‍යයයි.

(2) "යො හවෙ දහරො භික්ඛු යුඤ්ජති බුද්ධසාසනෙ
සො ඉමං ලොකං පභාසෙති අබ්භාමුත්තොව චන්දිමා."
(ධම්මපද.)

(=යම් තරුණ භික්ෂුනමක් බුද්ධානුශාසනයෙහි යෙදේ ද- හෙවත් පිළිපදී ද- ඒ භික්ෂුතෙමේ වලාකුළින් මිදුණු චන්ද්‍රයා මෙන් මේ ලෝකය ප්‍රභාවත් කෙරේ.)

මෙහි ප්‍රධානානුගතවාක්‍යය "සො ඉමං ලොකං පභාසෙති" යන්නයි; ඒ වාක්‍යය නැතිව "යො දහරො භික්ඛු බුද්ධසාසනෙ යුඤ්ජති," "අබ්භාමුත්තො චන්දිමා පභාසෙති ඉව" යන උපානුගතවාක්‍යයන්ගේ අර්ථය සම්පූර්ණ නොවේ.

---

**37.** අනුගතවාක්‍යයෝ වනාහි:

(1.) නාමානුගතවාක්‍ය
(2.) නාමවිශේෂණානුගතවාක්‍ය
(3.) ක්‍රියාවිශේෂණානුගතවාක්‍ය

යයි ත්‍රිවිධ වෙති.

(1) කෙවල නාමපදයක් හෝ වූවත් නාමයකගේ ස්වභාවය ගෙන කර්තෘවාචකය හෝ කර්මයවී සිටින වාක්‍යය **නාමානුගතවාක්‍යයයි.**

උදාහරණ:-

A. "සච්චං කිර ත්වං නන්ද සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙසි" (=නන්දය, තෝ බොහෝ භික්ෂූන්ට මෙසේ දන්වූයෙහිය යන්න සැබවක් වේද?) ධ. අ. 60.

මෙහි ආඛ්‍යාතය "සච්චං (හොති)" යන්නයි. කර්තෘවාචකය සෙවීම පිණිස "කුමක් සත්‍ය වේද"යි ප්‍රශ්නය නැඟිය යුතුවේ, ඊට "තෝ බොහෝ භික්ෂූන්ට මෙසේ දන්වූයෙහිය"යන්න උත්තරය වේ. එබැවින් "ත්වං නන්ද සම්බහුලානං භික්ඛූනං එවමාරොචෙසි" යන මුළු අනුගතවාක්‍යය කර්තෘගේ ස්ථානය ගනී.

B. "න මෙ හොති අහොසින්ති, භවිස්සන්ති න හොති මෙ" (=මම පෙරවීමියි (සිතක්) මට නොවේ; මම වන්නෙමියි (සිතක්) ද මට නොවේ.) අභිමුඛනාලඞ්කාරයා.

පළමු "න හොති" යන්නට "අහං අහොසිං" යන්නද දෙවෙනි "න හොති" යන්නට "අහං භවිස්සං" යන්නද කර්තෘවාචකව සිටිත්.

C. **"නෙව හොති න න හොති තථාගතො පරම්මරණා** ඉති චෙ මෙ අස්ස ..... ..... ඉති තෙ නං ව්‍යාකරෙය්‍යං" (="සත්ත්ව තෙමේ මරණින් මතු නොවේ, නොවන්නේත් නොවේ"යයි ඉදින් මට (කල්පනයක්) වේ නම් (මම) තට එය ප්‍රකාශකරන් නෙම්.) **බ්‍රහ්මජාලසුත්ත.** "අස්ස" යන ක්‍රියාවට කර්තෘවාචකය වන්නේ "නෙව හොති තථාගතො පරම්මරණා, න න හොති තථාගතො පරම්මරණා" යන අන්තර්වාක්‍යයයි.

කර්තෘවාචකය වන නාමාන්තර්වාක්‍යයන් පාලියෙහි ඉතා සුලභ නොවන නමුත් කර්මයාගේ ස්ථානය ගන්නා ඔවුහු ඉතා සුලභ වෙති. වද- වච- බ්‍රූ ආදි ධාතූන්ගෙන් සිඩවූ ක්‍රියාවන්ට කර්ම වශයෙන් යෙදුණු බොහෝ අන්තර්වාක්‍ය දක්නා ලැබේ.

D. "**ගච්ඡං වදෙසි සමණ ඨිතො**'ම්හි,
**මමං ච බ්‍රූසි ඨිතමඨිතොති**"

(=ශ්‍රමණය, තෝ යන්නේම "මම සිටියේ වෙමි"යි කියෙහිය; සිටි මට "නොසිටියේ වෙහි"යි කියෙහි.) **අඞ්ගුලිමාලථෙරගාථා.**

E. සත්ථා තතොපි ජීවකම්බවනං ගන්තුකාමො "**ගණ්හථ මං නෙථා**"ති ආහ. (ජීවකපඤ්හවත්ථු. ධ. අ.)

F. භික්ඛූ සත්ථාරං පුච්ඡිංසු: **කද පන ථෙරෙන පඤ්හා ඨපිතාති.**" (ධ. අ. 295.)

(ඉ) **නාමවිශේෂණයකගේ** ස්වභාවයෙන් යුක්තව **අන්‍ය** නාමයක් වෙසෙසන ආකාරයෙන් සිටින්නේ **නාමවිශේෂණාන්තර්වාක්‍යයයි**; (එය කර්තෘ හෝ කර්මය හෝ වෙසෙසන්නක් විය හැක)

A. "සුඛං සුපන්ති මුනයො **යෙ ඉත්ථීසු න බජ්ඣරෙ.**"
(ගොතමථෙරගාථා.)

මෙහි 'යෙ ඉත්ථීසු න බජ්ඣරෙ" යන උපාන්තර්වාක්‍යය ප්‍රධානාන්තර්වාක්‍යයේ කර්තෘවූ 'මුනයො' යන්න වෙසෙසයි. **"යම් කෙනෙක් ස්ත්‍රීන් කෙරෙහි නොබැඳෙත් ද, ඒ මුනීහු සැපයේ නිදත්."**

B. **"යං නිස්සිතා ජගතිරුහං විහඞ්ගමා
ස්වායං අග්ගිං පමුඤ්චති"** (සකුණජාතක.)

C. "යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො නූපලබ්භති,
ආරකා හොති සද්ධම්මා නභසො පඨවී යථා"
(මහාකස්සපත්ථෙරගාථා.)

තළුඅකුරෙන් දැක්වූ අනුවාක්‍යයත් කර්තෘවිශෙෂණ වශයෙන් සිටී.

කර්මීය වෛශෙෂන අනුවාක්‍ය:-

A. "යො මෙ ඤාණං පකිත්තෙසි
පසන්නො සෙන චෙතසා,
තමහං කිත්තයිස්සාමි
සුණොථ මම භාසතො."
(ඤාණත්ථවිකත්ථෙරපදාන.)

තළුඅකුරෙන් අඩිකින වාක්‍යය 'තං' යන කර්මීය වෛශෙෂිකයි.

B. "අසන්තං යො පග්ගණ්හාති, අසන්තං චූ'පසෙවති
තමෙව ඝාසං කුරුතෙ ව්‍යග්ඝො සඤ්ජීවිකො යථා"
(සඤ්ජීව ජාතක)

මෙහි 'තං' යන කර්මීය වෛශෙෂන අනුවාක්‍ය දෙකකි. ප්‍රධාන කර්තෘපදය අන්තර්ලීනයි "(සො) තං එව ඝාසං කුරුතෙ" යන්න ප්‍රධානානුවාක්‍යයකි.

(3) ක්‍රියාවිශෙෂණයකගේ ස්වභාවයෙන් යුක්තව ස්ථාන- කාල- ආකාර- උපමාන- හෙතු ආදිය ප්‍රකාශකරන්නෝ ක්‍රියා විශෙෂණානුවාක්‍යයයි.

A. "යෙනත්ථො ලභතෙ බබ්බු දුතියො තත්ථ ජායති"
(බබ්බුජාතක 137)

ස්ථානය ප්‍රකාශකෙරේ.

B. "යදා බලාකා සුචිපණ්ඩරච්ඡදා
කාලස්ස මෙඝස්ස භයෙන තජ්ජිතා
පලෙහිති ආලය මාලයෙසිනී
තදා නදී අජකරණී රමෙති මං."
(සප්පකත්ථෙරගාථා)

කාලාර්ථයෙහි වේ.

C. "යෙන යෙන සුභික්ඛානි සිවානි අභයානි ච
තෙන පුත්තක ගච්ඡස්සු; මා සොකාපහතො භව"
(කස්සපත්ථෙරගාථා.) ස්ථානප්‍රකාශකයි.

D. **"යථා මෙ ධනච්ඡෙදො න හොති තථා කරිස්සාමීති."** (ධ. අ. මට්ටකුණ්ඩලීවත්‍ථු.) ආකාරාර්ථයෙහි වේ.

E. **"සචෙ යුජ්ඣිතුකාමොසි** ජයං සමම දදාමි තෙ"
(සූකරජාතක.) පරිකල්පාර්ථයෙහියි.

F. **"යාව සො මත්තමඤ්ඤාසි භොජනස්මිං විහඞ්ගමො**
තාව අද්ධානමාපාදි මාතරං ච අපොසයි."
(සුභජාතක) කාලාර්ථයෙහියි.

G. **"සරෙ හත්‍ථෙහි භඤ්ජිත්‍වා කත්‍වාන කුටිමච්ඡිසං,**
තෙන මෙ සරභඞ්ගොති නාමං සම්මුතියා අහු."
(සරභඞ්ගත්‍ථෙරගාථා.) හෙත්‍වර්ථයෙහියි.

H. **"එය්‍යාසි භන්තෙ පුර'හං ගච්ඡාමි"** (පාරාජිකපාළි.) "මා නැසෙන්ට මත්තෙන් එනුමැනව, ස්‍වාමිනි" යන අර්ථ ඇත්තේයි. '**යාව අහං න ගච්ඡාමි** තාව ත්‍වං එය්‍යාසීති අත්‍ථො"යි ඒ පාඨය අටුවාවෙහි ව්‍යාඛ්‍යාතයි. මේ "පුරාහං ගච්ඡාමි" යන අන්තර්වාක්‍යය කාලාර්ථයෙහි යි.

I. "සො ඉමං ලොකං පභාසෙති අබ්භා **මුත්තොව චන්දිමා"** (අඞ්ගුලිමාලත්‍ථෙර ගාථා) උපමානයෙහි වේ.

**88. යට දැක්වුණු නිදර්ශන වලින්-**

(1) නාමානන්තර්වාක්‍යයක් "ඉති" ශබ්දයෙන් ද,
(2) නාමවිශෙෂණානන්තර්වාක්‍යයක් "ය"- ශබ්දයෙන් ද උප ලක්ෂිතබව ප්‍රකට විය.
(3) ක්‍රියාවිශෙෂණානන්තර්වාක්‍යයෝ වනාහි:

A. යථා, (තථා; එවං.)
C. යත්‍ථ, (තත්‍ථ.)
E. යෙන, (තෙන.)
G. චෙ, සචෙ, යදි.
I. යාවතා, (තාවතා.)
B යදා, (තදා.)
D. යතො, (තතො.)
F. ඉව, විය.
H. යාව, (තාව.)
J. යදා-අථ.
K. සෙය්‍යථාපි (එවමෙව)

යනාදියෙන් උපලක්ෂිත වෙතියි දතයුතු.

---

### අභ්‍යාසය 18.

මේ වාක්‍යයන්හි අන්තර්වාක්‍යයන්ගේ නම් දක්වියයුතු:-

1. "කීදිසො නිරයො ආසි යත්‍ථ දුස්සී අපච්චථ?"
"යො වෙජයන්තපාසාදං පාදඞ්ගුට්ඨෙන කම්පයි
තාදිසං භික්ඛුමාසජ්ජ කණ්හ දුක්ඛං නිගච්ඡසි"
(මහාමොග්ගල්ලානත්‍ථෙරගාථා.)

2. "එවමේතං මහාවීර යථා සමණ භාසසි,
එත්ථ චෝ'තෙ විසීදන්ති පඞ්කමහි'ව ජරග්ගවො"
(මහාමොග්ගල්ලානත්ථේරගාථා)

3. "යදා තෙ විවදිස්සන්ති තදා එහින්ති මෙ වසං."
(සමෝදමානජාතක.)

4. නො චෙ ලභෙථ නිපකං සහායං
සද්ධිංචරං සාධුවිහාරි ධීරං,
රාජාව රට්ඨං විජිතං පහාය
එකො චරෙ මාතඞ්ග රඤ්ඤෙව නාගො.
(ධ. අ. කොසම්බකවත්ථු.)

5. යතො ච ඛො බහුතරං භොජනං අජ්ඣුපාහරි,
තතො තත්ථෙව සංසීදි අමත්තඤ්ඤූ හි සො අහු."
(සුකජාතක.)

6. "යථා සාරදිකං බීජං ඛෙත්තෙ වුත්තං විරූහති
එවං රූහතු තෙ නාසා; පදුමං දෙහි යාචිතො"
(පදුමජාතක 261)

7. "පුරා ආගච්ඡතෙ එතං අනාගතං මහබ්භයං,
සුබ්බචා හොථ සඛිලා අඤ්ඤමඤ්ඤං සගාරවා"
(ඵුස්සත්ථේරගාථා.)

8. "මඤ්ඤෙ සොවණ්ණයො රාසි සොණ්ණමාලා ච නන්දකො
යත්ථ දාසො ආමජාතො ඨිතො ථුල්ලානි ගජ්ජති"
(නන්දජාතක 39.)

9. "සෙය්‍යථාපි නාම සුද්ධං වත්ථං අපගතකාළකං සම්මදෙව රජනං පටිග්ගණ්හෙය්‍ය, එවමෙව තෙසං චතුරාසීතිපාණසහස්සානං තස්මිං යෙව ආසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි. (මහාපදානසුත්ත.)

10. "ආගමෙන්තු තාව භවන්තො චෝරඝාතකා......... යාවාහං තෙසං උද්දිසෙය්‍යාසි ආගච්ඡාමි."
(පායාසිරාජඤ්ඤසුත්ත.)

39. එකිනෙකට යටත් පැවතුම් නැති අමිශ්‍රවාක්‍යයන් හෝ මිශ්‍රවාක්‍යයන් දෙකකින් හෝ වැඩිගණනකින් යුක්තවූයේ සංගතවාක්‍ය නම්.

එවැනි අමිශ්‍රවාක්‍ය දෙකකින් හෝ වැඩිගනණකින් යුක්ත වූයේ සංගතවාක්‍යයයිද මිශ්‍රාමිශ්‍රවාක්‍යවයක් හෝ වැඩිගණනක් ඇත්තේ ද මිශ්‍රවාක්‍යවයක්ම හෝ වැඩිගණනක් ඇත්තේ ද සංකරවාක්‍යයයි ද දෙකොටසකට බෙදීම ද හැකිය.

(1) "ථෙරෙ මූලසිරිං පක්කොසාපෙසි, අථ මහාජනකායො සන්නිපති." (ධ. අ. ආනන්දසෙට්ඨිවත්ථු.) මෙය අමිශ්‍රවාක්‍ය ද්වයකින් යුක්තයි. මේ දෙක වෙන්ව සිට සම්පූර්ණාර්ථයන් ප්‍රකාශ කිරීමට සමර්ථ බැවින් එකක් අනිකට යටත් පැවතුම් ඇත්තේ නොවේ; නමුත් "අථ" යන්නෙන් මේ දෙකේ සම්බන්ධයක් ඇත්තේයයි දක්වේ.

(2.) "අම්හෙ පන තිංසමත්තා ජනා පාණං න හනාම, අදින්නං නාදියාම, මිච්ඡා න චරාම, මුසාවාදං න කථෙම, මජ්ජං න පිවාම, මෙත්තං භාවෙම, දානං දෙම, මග්ගං සමං කරොම, පොක්ඛරණියො ඛණාම, සාලං කරොම" (කුලාවකජාතක.) මෙහි අමිශ්‍රවාක්‍ය දශයක් විද්‍යමානයි. "අම්හෙ" යන්න සියලු වාක්‍යයන්හි කර්තෘ මෙන් යෙදේ.

(3.) භවං හි ආනන්දො තස්ස භොතො ගොතමස්ස දීඝරත්තං උපට්ඨාකො සන්තිකාවචරො සමීපචාරී; භවමෙතං ආනන්දො ජානෙය්‍ය යෙසං සො භවං ගොතමො ධම්මානං වණ්ණවාදී අහොසි, යත්ථ ච ඉමං ජනතං සමාදපෙසි, නිවෙසෙසි, පතිට්ඨාපෙසි" (සුභසුත්ත. දීඝ.) මිශ්‍රාමිශ්‍රවාක්‍යයකි.

(4) "සච'ස්ස ගෙහචාරං ගමිස්සාමි, ඉමිස්සා භරියා මමං දට්ඨුං න සක්ඛිස්සති; යාව'ස්ස භත්තං ආදාය මග්ගං පටිපජ්ජති, තාව ඉධෙව භවිස්සාමි (ධ. අ. උත්තරාවත්ථු.) මිශ්‍රවාක්‍යයකි.

---

## වාක්‍යවිච්ඡේදය.

---

වාක්‍යයන්හි කර්තෘකර්මාදියට අයත් ඒ ඒ කොටස් වෙන් කොට බැලීමෙන් යථාභූතාර්ථය වටහාගැන්ම පහසු වේ.

**40.** යට දක්වූ ත්‍රිවිධ ප්‍රභෙද ඇති සියලු වාක්‍යයන්ම ප්‍රථමයෙන් (1) **උක්තාධීනය** (2) **ආඛ්‍යාතාධීනය** යන දෙකොටසට බෙදිය යුතුවේ.

(1) උක්තකර්තෘට හෝ උක්තකර්මයට අයත් කොටස **උක්තාධීනයයි.**

(2) ක්‍රියාවට අයත් කොටස **ආඛ්‍යාතාධීනයයි.** (කර්මය ද මෙහිම අන්තර්ගතවේ.)

අමිශ්‍රවාක්‍යයන්ට උදාහරණ වශයෙන් දක්වූ (4) වෙනි වාක්‍යය මෙසේ විච්ඡේද කටයුතුවේ:-

(1) උක්තාධිනය:

පාතුභූතසත්තරතනො රාජා කාලිඞ්ගො චක්කවත්ති සබ්බාලඞ්කාරපතිමණ්ඩිතො මාලාවිලෙපනධරො.

(2) ආඛ්‍යාතාධීනය:

(i) එකදිවසං (ii) සබ්බසෙතං කෙලාසකූටපටිභාගං ගජරතනමාරුය්හ (iii) මාතාපිතුන්නං අස්සමපදං පායාසි.

තවත් දුරට විච්ඡේද කිරීමේදී

1. උක්තය
2. උක්තවිශෙෂණය
3. කර්මය
4. කර්මවිශෙෂණය
5. ආඛ්‍යාතය
   { 6. ආඛ්‍යාත විස්තාරය
   { 7. ආඛ්‍යාතපූරණය

යන කොටස්වලට බෙදිය යුතුයි.

සංයොක්ත වාක්‍යය ඒ කොටස්වලට බෙදෙන සැටි මෙසේයි:-

| උක්තය | උක්ත විශෙෂණ | කර්මය | කර්ම විශෙෂණ | ආඛ්‍යාතය | ආඛ්‍යාත විස්තාර |
|---|---|---|---|---|---|
| රාජා | (1) කාලිඞ්ගො<br>(2) චක්කවත්ති<br>(3) පාතුභූත සත්තරතනො<br>(4) සබ්බාලඞ්කාර පතිමණ්ඩිතො<br>(5) මාලාවිලෙපනධරො | අස්සමපදං | මාතාපිතුන්නං | පායාසි | (1) එකදිවසං<br>(2) සබ්බසෙතං කෙලාසකූටපටිභාගං ගජරතනමාරුය්හ |

ආඛ්‍යාතපූරණයක් මෙහි නැත.

---

41. මිශ්‍රවාක්‍යයක් විච්ඡේදකටයුතු ආකාරය:-

"සා තෙසං කථං සුත්වා 'ඉමෙ නිල්ලජ්ජා මයා සද්ධිං අභිරමිත්වා ඉදානි මං මාරෙතුකාමා, ජානිස්සාමි නෙසං කත්තබ්බයුත්තක'න්ති තෙහි මාරියමානා 'අහං යක්ඛිනී හුත්වා යථා මං එතෙ මාරෙන්ති එවමෙවෙතෙ මාරෙතුං සමත්ථා භවෙය්‍ය'න්ති පත්ථනං අකාසි." (ධ. අ. සුප්පබුද්ධකුට්ඨි.)

| උක්තය | උක්ත විශෙෂණ | කර්මය | කර්ම විශෙෂණ | ආඛ්‍යාතය | ආඛ්‍යාත විස්තාර | ආඛ්‍යාත පූරණ |
|---|---|---|---|---|---|---|
| 1. සා | මාරියමානා | පත්ථනං | අහං යක්ඛිනී -පෙ- මාරෙතුං සමත්ථා භවෙය්‍යන්ති | අකාසි | (1) තෙසං කථං සුත්වා (2) ඉමෙ නිල්ලජ්ජා-පෙ-කත්තබ්බ යුත්තකං කාහන්ති (චින්තෙත්වා) (3) තෙහි | |
| 2. ඉමෙ | නිල්ලජ්ජා | මං | | (හොන්ති) | (1) මයා සද්ධිං අභිරමිත්වා (2) ඉදානි | මාරෙතුකාමා |
| 3. (අහං) | | කත්තබ්බ යුත්තකං | තෙසං | ජානිස්සාමි | | |
| 4 අහං | | එතෙ | | භවෙය්‍යං | (1) යක්ඛිනීහුත්වා (2) එවමෙව | මාරෙතුං සමත්ථා |
| 5. එතෙ | | මං | | මාරෙන්ති | යථා | |

මෙහි 1 වෙනි කොටසින් "සා තෙසං කථං සුත්වා ........ තෙහි මාරියමානා.......... පත්ථනං අකාසි" යන ප්‍රධාන වාක්‍යය ද 2 වෙනි කොටසින් 'චින්තෙත්වා' යන අන්තර්ලීන පූර්වක්‍රියාපදයට කර්මවශයෙන් සිටින "ඉමෙ නිල්ලජ්ජා මයා සද්ධිං අභිරමිත්වා ඉදානි මං මාරෙතුකාමා" යන අන්තර්වාක්‍යය ද 3 වෙනි කොටසින් ඒ 'චින්තෙත්වා' යන්නටම කර්මවශයෙන් සිටින "ජානිස්සාමි තෙසං කත්තබ්බයුත්තකං" යන අන්තර් වාක්‍යය ද 4–5 වෙනි කොටස් දෙකින් 'පත්ථනං' යන්නට විශෙෂණවශයෙන් සිටින "අහං යක්ඛිනී හුත්වා යථා මං එතෙ මාරෙන්ති, එවමෙවෙතෙ මාරෙතුං සමත්ථා භවෙය්‍යං" යන අන්තර්වාක්‍යය ද විච්ඡේද කරන ලදී.

---

**42.** ආඛ්‍යාතවිස්තාරය වනාහි ක්‍රියාවිශෙෂණයන්ගෙන් පමණක් යුක්තනොවන බව යට දැක්වූ වාක්‍යවිච්ඡේදයන් බැලීමෙන් වැටහේ. එය සාමාන්‍යයෙන්

(1) කාලප්‍රතිබද්ධ විස්තාර
(2) ස්ථානප්‍රතිබද්ධ විස්තාර
(3) ආකාරප්‍රතිබද්ධ විස්තාර
(4) හෙතුප්‍රතිබද්ධ විස්තාරයයි

කොටස් සතරකට බෙදිය හැක.

**(1) කාලප්‍රතිබද්ධ ආඛ්‍යාතවිස්තාරයට උදාහරණ:-**

A. "න භික්ඛවෙ තථාගතො ඉදානෙව ලොකස්ස අත්ථං චරති, පුබ්බෙපි චරි යෙව." (දුම්මෙධජාතක.)

B. "අජාතසත්තුකුමාරො දෙවදත්තස්ස ගයාසීසෙ විහාරං කාරෙත්වා ............ **දිවසෙ දිවසෙ** පඤ්චථාලිපාකසතානි අභිහරි." (මහිලාමුඛජාතක.)

C. "පාපොපි පස්සති භද්‍රං **යාව** පාපං න පච්චති,
**යදා** ච පච්චති පාපං **අථ** පාපො පාපානි පස්සති"
(ධම්මපද.)

D. "**අජ්ජ** ඛො පනානන්ද **රත්තියා පච්ඡිමෙ යාමෙ** කුසිනාරායං උපවත්තනෙ මල්ලානං සාලවනෙ අන්තරෙන යමකසාලානං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති"
(මහාපරිනිබ්බාණසුත්ත.)

**(අ.) කාලාතිපාතමය ද මෙහි අන්තර්ගතවේ:**

"**සත්ථා හි පඨමගමනෙන කපිලපුරං** ගන්ත්වා **කණිට්ඨභාතිකං නන්දකුමාරං පබ්බාජෙත්වා කපිලපුරා නික්ඛම්ම අනුපුබ්බෙන සාවත්ථිං** ගන්ත්වා විහරන්තෙ ආයස්මා නන්දො ............ අනභිරතො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො අහොසි." (සඞ්ගාමාවචරජාතක.)

මෙහි කළුඅකුරෙන් දැක්වෙන සියල්ල ආඛ්‍යාතවිස්තාරයට අයත් වේ. (මෙය අමිශ්‍රවාක්‍යයකි.)

**(ආ.) පූර්වක්‍රියාවන් අවසානක්‍රියාවට පූර්වකාලයක් ප්‍රකාශ කරන බැවින් එයින් යුත් වාක්‍යාංශයෝ ද කාලප්‍රතිබද්ධ ආඛ්‍යාතවිස්තාරයෙහි ඇතුළත් වෙති.**

"එවං මහාසත්තො ඛුද්දකමක්ඛිකාය පිවනමත්තම්පි **ලොහිතං අනුප්පාදෙත්වා, සත්තරාජානො පලාපෙත්වා කණිට්ඨභාතරං ඔලොකෙත්වා, කාමෙ පහාය, ඉසිපබ්බජ්ජං පබ්බජිත්වා, අභිඤ්ඤා ච සමාපත්තියො** ච **නිබ්බත්තෙත්වා** ජීවිතපරියොසානෙ බ්‍රහ්මලොකූපගො අහොසි." (අසදිසජාතක 181)

(2) ස්ථානප්‍රතිබද්ධ ආඛ්‍යාත විස්තාරයට උදාහරණ:-

A. "එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි."

B. "අථ ඛො රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො .............. උක්කාසු ධාරියමානාසු රාජගහම්හා නීයාසි"

(සාමඤ්ඤඵලසුත්ත.)

C. "ගාමෙ වා යදි වා' රඤ්ඤෙ නින්නෙ වා යදි වා ථලෙ
යත්ථාරහන්තො විහරන්ති, තං භූමිරාමණෙය්‍යකං"

(ධම්මපද.)

D. "යදා යදා යත්ථ යදා යත්ථ යත්ථ යදා යදා
ආජඤ්ඤො කුරුතෙ වෙගං හායන්ති තත්ථ වාලවා"

(24 ආජඤ්ඤජාතක.)

(3) ආකාරප්‍රතිබද්ධ ආඛ්‍යාතවිස්තාරයට උදාහරණ:-

A. "තං තථාවාදිනිං බුද්ධො මමං සො එතදබ්‍රවි:
න හෙ'වං වන්දියා බුද්ධා යථා වන්දසි ගොතමී."
"කථං චරහි සබ්බඤ්ඤූ වන්දිතබ්බා තථාගතා?
කථං අවන්දියා බුද්ධා? තං මෙ අක්ඛාහි පුච්ඡිතො."

(මහාපජාපතිගොතමී අපදාන)

B. "අනුපුබ්බෙන මෙධාවී ථොකථොකං ඛණෙ ඛණෙ
කම්මාරො රජතස්සෙ'ව නිද්ධමෙ මලමත්තනො."

(ධම්මපද.)

C. "දුතියවෙය්‍යාවච්චකොපි පණ්ණෙ ආරොපිතනියාමෙනෙව තෙසං තෙසං ගෙහානි භික්ඛූ පහිණි."

(ධ. අ. පණ්ඩිතසාමණෙර වත්ථු.)

D. "සබ්බං තිස්සකුමාරස්ස වත්ථුම්හි වුත්තනයෙනෙව වෙදිතබ්බං" (ධ. අ. පණ්ඩිතසාමණෙර.)

E. "සාවත්ථියං කිර එකො උපාසකො ධම්මෙන සමෙන අගාරං අජ්ඣාවසති. (ධ. අ. ධම්මිකත්ථෙර.)

F. "ඉමෙ සත්තා නාම යෙභුය්‍යෙන භවනිස්සිතා භවෙසු එව ලග්ගා විහරන්ති."

සීඝං, සනිකං, තුවටං, අද්ධා, සාධුකං, ඛණෙන, තුරිතං, ආදි බොහෝ පද මේ ආකාරප්‍රතිබද්ධ විස්තාරයෙහි වැටේත්.

(අ) A. කාරණය ද B. සහයෝගයෙහි හා C. සහාවයෙහි ක්‍රියාව ද, D. අනුක්තකර්තෘ ද මෙහිම අන්තර්ගත වේ.

A. "එකො කුටුම්බිකො එකස්ස ථෙරස්ස විහාරං කත්වා තං තත්ථ විහරන්තං චතූහි පච්චයෙහි උපට්ඨාසි." "සොපි තෙසං ගතභාවං ඤත්වා ... ...... උභොහි හත්ථෙහි ආලොපෙ කත්වා ගූථං ඛාදි." (ධ. අ. ජම්බුකාජීවක.)

B. "අහං අම්හාකං අය්‍යපුත්තෙන සද්ධිං මහාභිනික්ඛමනං නික්ඛන්තො." (ධ. අ. ඡන්නත්ථෙර.)

C. "කොසලරාජා මහන්තෙන බලෙන ආගන්ත්වා බාරාණසිං ගහෙත්වා තං රාජානං මාරෙත්වා තස්සෙව අග්ගමහෙසිං අත්තනො අග්ගමහෙසිං අකාසි" (අසාතරූපජාතක.)

D. "මයා භතිං කත්වා සාලි ලද්ධා." "අහො! ඉමිනා දුක්කරං කතං" (ධ. අ. පණ්ඩිතසාමණෙර.)

"වුත්තං හෙතං භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන"

(ආ) පදපූරණයෙහිවූ "හන්ද, බලු, හි" ආදි නිපාතද අවධාරණාර්ථයෙහි "එව" ආදියද නිශ්චයාර්ථයෙහි "වත, නූන, කාමං" ආදියද විස්මයෙහි හා ඛේදයෙහි "අහො, හා" ආදියද වාක්‍යවිච්ඡේදයේදී හැරදැමීම හෝ මේ ආකාරප්‍රතිබද්ධවිස්තාරයෙහි ඇතුළත්කිරීම හෝ වටනේය.

(4) හෙතුප්‍රතිබද්ධආඛ්‍යාතවිස්තාරයට උදාහරණ:-

A. "අථ නෙ දෙවී පුච්ඡි: තාතා, කිං කාරණා ආගතත්ථා ති." (ධ. අ. මහාකප්පින.)

B. "එවං සන්තෙපි 'අහං පුබ්බෙ කිඤ්චි අකතත්තා කිඤ්චි න ලභාමී'ති න ජානාසි?" (ධ. අ. පණ්ඩිත සාමණෙර.)

C "අත්තනො සාමිකෙ ... ......දිස්වා චිත්තං එකග්ගං න භවෙය්‍ය, තෙන මග්ගඵලානි පත්තුං න සක්කුණෙය්‍යුං, තස්මා අවිලසඞ්ඛාය පතිසිත්තකාලෙ තාසං තෙ භික්ඛූ ... ...... දස්සෙසි." (ධ. අ. මහාකප්පින.)

(ඉ) යම් අභිමතාර්ථයක් සඳහා යමක් කරනුලැබේ නම් ('පිණිස' 'සඳහා' ආදියෙන් කියවෙන) ඒ අභිමතාර්ථයත් මේ ආඛ්‍යාතවිස්තාරයෙහි ඇතුළත්වේ.

A. "න අත්තහෙතු න පරස්ස හෙතු
න පුත්තමිච්ඡෙ න ධනං න රට්ඨං"
(ධම්මපද.)

B න අරහති භවං කූටදන්තො සමණං ගොතමං දස්සනාය උපසඞ්කමිතුං, සමණොත්වෙව ගොතමො අරහති භවන්තං කූටදන්තං දස්සනාය උපසඞ්කමිතුං."
(කූටදන්තසුත්ත දී. නි.)

C. "චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං" (මහාවග්ගපාළි.)

D. "කිමත්ථාය හොන්තො ආගතො? කිං භික්ඛු නිමන්තෙන්ත තුං?" (විසුද්ධිමග්ග 20.)*

E. "යස්සං අත්ථාය අහං ඝරාවාසෙ වසෙය්‍යං, තෙ උභොපි පබ්බජිතා" (ධ. අ. ධම්මිකථෙර.)

F. "අරහං සුගතො ලොකෙ වාතෙහාබාධිකො මුනි
සචෙ උණ්හොදකං අත්ථි .............. ...... ...
... ..................... තස්ස ඉච්ඡාමි හාතවෙ''.
(බ්‍රාහ්මණසංයුත්ත.)

(ආ.) තුං – තවෙ ප්‍රත්‍යයාන්තයන්ද ආශප්‍රත්‍යයාන්තයන් ද මෙහි ඇතුළත්වන බව සිත තබාගතයුතු.

## ආඛ්‍යාතපූරණය.

43 භූ - හූ - අස ආදි ඇතැම් ධාතූන්ගෙන් නිපන් ක්‍රියාපදයන් සම්පූර්ණාර්ථයක් ප්‍රකාශ නොකරන බැවින් ඔවුන්ගේ අර්ථය පිරවීම සඳහා යෙදෙන පදය හෝ පද ආඛ්‍යාතපූරණයයි කියනු ලැබේ.

"ඉමෙහි ලක්ඛණෙහි සමන්නාගතො නාම අගාරමජ්ඣෙ වසන්තො රාජා හොති චක්කවත්ති. පබ්බජන්තො ලොකෙ විවටච්ඡදෙ සබ්බඤ්ඤු බුද්ධො හොති" යන්න සංහතවාක්‍යයකි. මෙහි "ඉමෙහි ලක්ඛණෙහි සමන්නාගතො" යනපදසමුදාය වාක්‍යවයටම කර්තෘවේ. "අගාරමජ්ඣෙ වසන්තො" යන්න ප්‍රථම වාක්‍යයෙහි ද "පබ්බජන්තො" යන්න ද්විතීය වාක්‍යයෙහිද කර්තෘව විශෙෂණයයි. දෙතැන්හිම 'හොති'යි ක්‍රියාපදයි. හොති (=වේ) යි කීවිට කුමක් වේදැයි ප්‍රකට නැති බැවින් මේ ක්‍රියාව අසම්පූර්ණයි, එබැවින් අර්ථය සම්පූර්ණ කිරීම සඳහා ආඛ්‍යාතපූරණයක් ඕනෑ වේ. ප්‍රථමවාක්‍යයෙහි "රාජා චක්කවත්ති හොති"යි කීවිට ද ද්විතීයවාක්‍යයෙහි "ලොකෙ විවටච්ඡදෙ සබ්බඤ්ඤු බුද්ධො හොති"යි කීවිට ද 'හොති' ක්‍රියාවගේ අර්ථය සම්පූර්ණවේ. එබැවින් මෙහි රාජා චක්කවත්ති, ලොකෙ විවටච්ඡදෙ, සබ්බඤ්ඤු බුද්ධො යනපද ආඛ්‍යාතපූරණ යයි දතයුතු. අන් කිසි කර්තෘවිශෙෂණාදියකට ඒ වචන ඇතුළත් නොකළහැකි බව පරීක්ෂණයෙන් ප්‍රත්‍යක්ෂවෙනවා ඇත.

"ගිහිගෙයි වසන්නේ සක්විතිරජ වේ" කීතැන කර්තෘ ගිහිගෙයි වසන්නායි. සක්විතිරජ යන්න ඒ කර්තෘට විශෙෂණයක් වීමට හැකි ක්‍රමයක් නැත. එය ක්‍රියාවිශෙෂණයක් ද නොවේ. ආඛ්‍යාතවිස්තාරයක් ද නොවේ. හුදෙක් අසම්පූර්ණාර්ථවත් ආඛ්‍යාතපදයාගේ පූරණයකි. හොත්, හවුනි ආදිවූ භූ - හූ ධාතූන්ගෙන් නිපන් ක්‍රියා සැමවිටම ආඛ්‍යාතපූරණයක් ගන්නායයි සැලකියයුතු.

C. "චරථ භික්ඛවෙ චාරිකං බහුජනහිතාය බහුජනසුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං" (මහාවග්ගපාළි.)

D. "කිමත්ථාය භොන්තො ආගතා? කිං භික්ඛු නිමන්තෙතුං?" (විසුද්ධිමග්ග 20.)

E. "යෙසං අත්ථාය අහං ඝරාවාසෙ වසෙය්‍යං, තෙ උභොපි පබ්බජිතා" (ධ. අ. ධම්මිකත්ථෙර.)

F. "අරහං සුගතො ලොකෙ වාතෙහාබාධිතො මුනි
සචෙ උණ්හොදකං අත්ථි ............
............ තස්ස ඉච්ඡාමි හාතවෙ".
(බ්‍රාහ්මණසංයුත්ත.)

(ආ.) තුං- තවෙ ප්‍රත්‍යයාන්තයන්ද ආයප්‍රත්‍යයාන්තයන් ද මෙහි ඇතුලත්වන බව සිත තබාගතයුතු.

## ආඛ්‍යාතපූරණය.

43 භූ- හූ- අස ආදි ඇතැම් ධාතූන්ගෙන් නිපන් ක්‍රියා පදයන් සම්පූර්ණාර්ථයක් ප්‍රකාශ නොකරන බැවින් ඔවුන්ගේ අර්ථය පිරවීම සඳහා යෙදෙනා පදය හෝ පද ආඛ්‍යාතපූරණයයි කියනු ලැබේ.

"ඉමෙහි ලක්ඛණෙහි සමන්නාගතො නාම අගාරමජ්ඣෙ වසන්තො රාජා හොති චක්කවත්ති. පබ්බජන්තො ලොකෙ විවට්ටච්ඡදෙ සබ්බඤ්ඤු බුද්ධො හොති" යන්න සංහතවාක්‍යයකි. මෙහි "ඉමෙහි ලක්ඛණෙහි සමන්නාගතො" යනපදසමූදය වාක්‍යද්වයටම කර්තෘ වේ. "අගාරමජ්ඣෙ වසන්තො" යන්න ප්‍රථම වාක්‍යයෙහි ද "පබ්බජන්තො" යන්න ද්විතීය වාක්‍යයෙහිද කර්තෘව විශේෂණයයි. දෙතැන්හිම 'හොති'යි ක්‍රියාපදයි. හොති (=වේ) යි කීවිට කුමක් වේදැයි ප්‍රකට නැති බැවින් මේ ක්‍රියාව අසම්පූර්ණයි, එබැවින් අර්ථය සම්පූර්ණ කිරීම සඳහා ආඛ්‍යාතපූරණයක් ඕනෑ වේ. ප්‍රථමවාක්‍යයෙහි "රාජා චක්කවත්ති හොති"යි කීවිට ද ද්විතීයවාක්‍යයෙහි "ලොකෙ විවට්ටච්ඡදෙ සබ්බඤ්ඤු බුද්ධො හොති"යි කීවිට ද 'හොති' ක්‍රියාවගේ අර්ථය සම්පූර්ණ වේ. එබැවින් මෙහි රාජා චක්කවත්ති, ලොකෙ විවට්ටච්ඡදෙ, සබ්බඤ්ඤු බුද්ධො, යනපද ආඛ්‍යාතපූරණ යයි දතයුතු. අන්කිසි කර්තෘවිශේෂණාදියකට ඒ වචන ඇතුලත් නොකළහැකි බව පරීක්ෂණයෙන් ප්‍රත්‍යක්ෂ වෙනවා ඇත.

"ගිහිගෙයි වසන්නේ සක්විතිරජ වේ" කීතැන කර්තෘ ගිහිගෙයි වසන්නායි. සක්විතිරජ යන්න ඒ කර්තෘට විශේෂණයක් වීමට හැකි ක්‍රමයක් නැත. එය ක්‍රියාවිශේෂණයක් ද නොවේ. ආඛ්‍යාතවිස්තාරයක් ද නොවේ. හුදෙක් අසම්පූර්ණාර්ථවත් ආඛ්‍යාතපදයාගේ පූරණයකි. හොත්, හවුති ආදිවූ භූ - හූ ධාතූන්ගෙන් නිපන් ක්‍රියා සැමවිටම ආඛ්‍යාතපූරණයක් ගන්නායයි සැලකියයුතු.

45 දීර්ඝමිශ්‍රවාක්‍යයක් මෙසේ විච්ඡේදනටයුතු:

"අථස්ස භරියා අඤ්ඤබාලා එවරූපෙ පාටිහාරියෙ පසාදං අජනෙත්වා තං අක්කොසිත්වා පරිභාසි[illegible] 'රාජතො නාම වණ්ඩා, සකිං කුඩ්ඩා හත්ථපාදච්ඡේදනෙන බහුම්පි අනත්ථං කරොන්තීති' පුත්තෙන ආදාය [illegible] කුලං ගන්ත්වා රඤ්ඤො පක්කොසිත්වා කිං එතන්ති පුච්ඡිතා ආහ; අයං මම සාමිකො තුම්හාකං උපඩ්ඪාන පුප්[illegible] හි සත්ථාරං පූජෙත්වා තුච්ඡහත්ථො ඝරං ආගන්ත්වා තකං පුප්ඵානීති පුච්ඡො ඉදං නාම වදෙති; මයා තස්ස [illegible] ජඩ්ඩිතභාවං ජානාහි." (සුමඞ්ගලාකාරවතු)

| | උක්තාධීනය | | ආඛ්‍යාතාධීනය | | | | |
|---|---|---|---|---|---|---|---|
| | උක්තය | උක්ත විශෙෂණ | කර්මය | කර්ම විශෙෂණ | ආඛ්‍යාතය | ආඛ්‍යාතවිස්තාර | ආ[illegible] පූ[illegible] |
| ප්‍රධාන වාක්‍යය: අථස්ස =පෙ= ජඩ්ඩිතභාවං ජානාහි | භරියා | (1) අස්ස (2) අඤ්ඤබාලා (3) රඤ්ඤො පක්කොසිත්වා කිං එතන්ති පුච්ඡිතා | අයං මම සාමිකො =පෙ= මයා තස්ස ජඩ්ඩිතභාවං ජානාහි | | ආහ | (1) අථ (2) එවරූපෙ පාටිහාරියෙ පසාදං අජනෙත්වා (3) තං අක්කොසිත්වා (4) පරිභාසිත්වා (5) රාජතො නාම =පෙ= කරොන්තීති (වත්වා) (6) පුත්තෙන ආදාය රාජකුලං ගන්ත්වා | |
| අප්‍රධාන වාක්‍ය — 1. රාජතො නාම වණ්ඩා සකිං කුඩ්ඩා හත්ථපාදච්ඡේදනෙන බහුම්පි අනත්ථං කරොන්ති | රාජතො | (1) වණ්ඩා (2) සකිං කුඩ්ඩා | අනත්ථං | බහුං | කරොන්ති | හත්ථපාදච්ඡේදනෙන | |
| 2. අයං මම සාමිකො තුම්හාකං උපඩ්ඪාන පුප්ඵෙහි සත්ථාරං පූජෙත්වා =පෙ= ඉදං නාම වදෙති | සාමිකො | (1) අයං (2) මම (3) තකං පුප්ඵානීති පුච්ඡො | ඉදං | | වදෙති | (1) තුම්හාකං උපඩ්ඪාන පුප්ඵෙහි සත්ථාරං පූජෙත්වා තුච්ඡහත්ථො ඝරං ආගන්ත්වා | |
| 3 මයා තස්ස ජඩ්ඩිත භාවං ජානාහි | (ත්වං) | | මයා තස්ස ජඩ්ඩිතභාවං | | ජානාහි | | |

## අභ්‍යාසය 14.

මෙහි පෙනෙන වාක්‍යයන් යට දක්වූ පිළිවෙළින් විච්ඡේද කටයුතු:

1. "පුණ්ණො ථෙරං දිස්වාව කසිං ඨපෙත්වා පඤ්චපතිට්ඨිතෙන ථෙරං වන්දිත්වා දන්තකට්ඨං කප්පියං කත්වා අදාසි."
(ධ. අ. උත්තරවත්ථු.)

2. "අප්පකා තෙ මනුස්සෙසු යෙ ජනා පාරගාමිනො
අථායං ඉතරා පජා තීරමෙවානුධාවති." (ධම්මපද )

3. "අනුද්ධතො අචපලො නිපකො සංවුතින්ද්‍රියො
සොභති පංසුකූලෙන සීහොව ගිරිගබ්භරෙ"
(මහාකස්සපත්ථෙරගාථා.)

4. "යො ච කොචි මනුස්සෙසු පරපාණානි හිංසති
අස්මා ලොකා පරම්හා ච උභයා ධංසතෙ නරො."
(චාරණත්ථෙරගාථා.)

5. "සො වෙජ්ජො ආගන්ත්වා 'කීදිසං භන්තෙ'ති පුච්ඡි "පුබ්බෙ මෙ අක්ඛීනි වාතා රුජිංසු, ඉදානි අතිරෙකතරං රුජන්තී'ති ආහ." (ධ. අ. චක්ඛුපාල.)

6. "යාවජීවම්පි චෙ බාලො පණ්ඩිතං පයිරුපාසති
න සො ධම්මං විජානාති දබ්බී සූපරසං යථා."
(ධම්මපද.)

7. "අථ නං පිණ්ඩාය චරිත්වා ජීවිතුං සමත්ථකාලෙ කපාලං හත්ථෙ ඨපෙත්වා 'තාත, මයං තං නිස්සාය මහාදුක්ඛං පත්තා, ඉදානි න සක්කොම තං පොසෙතුං, ඉමස්මිං නගරෙ කපණද්ධිකාදීනං පටියත්තභත්තානි අත්ථි, තත්ථ භික්ඛාය චරිත්වා ජීවාහී'ති තං විස්සජ්ජෙසි." (ධ. අ. ආනන්දසෙට්ඨි.)

8. "සත්ථා මූලසිරිං ආමන්තෙත්වා 'ජානාසි එත'න්ති පුච්ඡිත්වා 'න ජානාමී'ති වුත්තෙ 'පිතා තෙ ආනන්දසෙට්ඨී'ති වත්වා අසද්දහන්තං "ආනන්දසෙට්ඨි, පුත්තස්ස තෙ පඤ්චමහානිධිං ආචික්ඛාහී"ති ආචික්ඛාපෙත්වා සද්දහාපෙසි. සො සත්ථාරං සරණං අගමාසි." (ධ. අ. ආනන්දසෙට්ඨි.)

9. "සෙලො යථා එකඝනො වාතෙන න සමීරති
එවං නින්දාපසංසාසු න සමිඤ්ජන්ති පණ්ඩිතා."
(ධම්මපද.)

10. "තස්මිං සමයෙ බාරාණසීවාසිනො දෙවතාමඞ්ගලිකා හොන්ති, දෙවතා නමස්සන්ති; බහූ අජෙළකකුක්කුටසූකරාදයො වධිත්වා නානප්පකාරෙහි පුප්ඵගන්ධෙහි චෙව මංසලොහිතෙහි ච බලිකම්මං කරොන්ති." (දුම්මෙධජාතක 50.)

# 46 පරිවර්තනපරිචය.

1. "අතීතෙ එකො වාණිජො ගද්‍රභභාරකෙන වොහාරං කරොන්තො විචරති. සො ගතගතට්ඨානෙ ගද්‍රභස්ස පිට්ඨිතො භණ්ඩිකං ඔතාරෙත්වා ගද්‍රභං සීහචම්මෙන පාරුපිත්වා සාලි– යව ඛෙත්තෙසු විස්සජ්ජෙති. අථෙකදිවසං සො වාණිජො එකස්මිං ගාමද්වාරෙ නිවාසං ගහෙත්වා පාතරාසං පචාපෙන්තො ගද්‍රභං සීහචම්මං පාරුපිත්වා යවඛෙත්තං විස්සජ්ජෙසි. ඛෙත්තරක්ඛකා 'සීහො'ති සඤ්ඤාය උපගන්තුං අසක්කොන්තා ගෙහං ගන්ත්වා ආරොචෙසුං. සකලගාමවාසිනො ආවුධානි ගහෙත්වා සඞ්ඛෙ ධමෙන්තා භෙරියො වාදෙන්තා ඛෙත්තසමීපං ගන්ත්වා උන්නදිංසු. ගද්‍රභො මරණභයභීතො ගද්‍රභරවං රවි. ගාමවාසිනො තස්ස ගද්‍රභභාවං ඤත්වා අට්ඨීනි භඤ්ජන්තා පොථෙත්වා සීහචම්මං ආදාය අගමංසු." (සීහචම්මජාතකයෙන්)

පරිවර්තනය:-

1. අතීතයේදී එක් වෙළඳෙක් කොටළුවකු පිට පැටවූ බරින් වෙළඳාම් කරමින් හැසිරේ. හෙතෙමේ ගියගියතැන කොටළුවාගේ පිටින් බඩුමිටිය බහා කොටළුවා සිංහසමක් පොරවා හැල්කෙත්– යවකෙත්වලැ හරී. ඉක්බිති එක්දිනක් ඒ වෙළඳ එක් ගම්දොරක් අසලැ වාසයගෙන උදෑසන්බත පිසවන්නේ කොටළුවා සිංහසම පොරවා යවකෙතකට යැවීය. කෙත රකින්නෝ 'සිංහයෙක' යන සඥවෙන් ළඟට පැමිණෙන්ට නොහැක්කාහු ගෙට ගොස් දැන්වූහ. සියළු ගම්වැස්සෝ ආයුධගෙන සක්පිඹිමින් බෙර වයමින් කෙත සමීපයට ගොස් මහත්නාද කළහ. කොටළුවා මරණභයින් බියපත්වූයේ කොටළුහඬින් හැඬී. ගම්වැස්සෝ උහු කොටළුබැව් දැන ඇට පොඩිකරමින් තළා සිංහසම ගෙන ගියාහ.

---

2. එක්කලෙක බරණැස්රජ ප්‍රත්‍යන්තය සංසිඳවීම සඳහා නොකල්හි නික්ම උයනෙහි කඳවුර බැන්දේය. එකල්හි එක් බකමූහුනෙක් උණපඳුරකට ඇතුල්ව සැඟවුණේය. කවුඩෝ ඌ දැක අවුත් "නික්මෙන්නාවූ ඌ අල්වාගන්නෙමු"යි පිරිවැරූහ. ඌ (මහමූණා) ඉර බසිනතෙක් නොසිට කාලිනම නික්ම පලා යන්ට ආරම්භකෙළේය. ඉක්බිති කවුඩෝ ඌ වටකොට ගෙන හොටවලින් කොටමින් බිම හෙළූහ. රජතෙමේ ඇමතියකු

දමිතා "මේ කවුඩෝ කුමක්හෙයින් මහමුණා නසත්ද"යි ඇසීය "මහරජ, නොකල්හි තමන්ගේ වාසස්ථානයෙන් නික්මෙන්නෝ මෙසේ දුකට පැමිණෙත්"යයි ඇමතියා කීය.

පරිවර්තනය:-

2. එකදා බාරාණසිරාජා පච්චන්තං වූපසමනත්ථාය අකාලෙ නික්ඛමිත්වා උය්‍යානෙ ඛන්ධාවාරං නිවෙසෙසි. තදා එකො උලූකො වෙළුගුම්බං පවිසිත්වා නිලීයි. කාකා තං දිස්වා ආගන්ත්වා "නික්ඛමන්තං තං ගණ්හිස්සාමා"ති පරිවාරෙසුං. සො යාව සුරියත්ථඞ්ගමනා අඨත්වා කාලස්සෙව නික්ඛමිත්වා පලායිතුං ආරභි. අථ නං කාකා පරිවාරෙත්වා තුණ්ඩෙහි කොට්ටෙන්තා පාතෙසුං. රාජා එකං අමච්චං ආමන්තෙත්වා "කස්මා ඉමෙ කාකා උලූකං පරිපාතෙන්තී"ති පුච්ඡි. අමච්චො "මහාරාජ, අකාලෙ අත්තනො වසනට්ඨානා නික්ඛමන්තා එවං දුක්ඛං පාපුණන්තී"ති ආහ.

පහත පෙළෙහි සාරය සිංහලට නැගියයුතු:-

3. "අතීතෙ පඨමකප්පිකා සන්නිපතිත්වා එකං අභිරූපං සොභග්ගප්පත්තං ආණාසම්පන්නං පුරිසං ගහෙත්වා රාජානං කරිංසු. චතුප්පදාපි සන්නිපතිත්වා එකං සීහං රාජානං කරිංසු. මහාසමුද්දෙ මච්ඡා ආනන්දං නාම මච්ඡං රාජානං කරිංසු. තතො සකුණගණා හිමවන්තප්පදෙසෙ සන්නිපතිත්වා "මනුස්සෙසු රාජා පඤ්ඤායති, තථා චතුප්පදෙසු චෙව මච්ඡෙසු ච. අම්හාකම්පි රාජානං ලද්ධුං වට්ටති. එකං රාජට්ඨානෙ ඨපෙතබ්බයුත්තකං ජානාථා"ති, තෙ තාදිසං සකුණං ඔලොකයමානා එකං උලූකං රොචෙත්වා "අයං නො රුච්චතී"ති ආහංසු. අථෙකො සකුණො සබ්බෙසං අජ්ඣාසයගහණත්ථං තික්ඛත්තුං සාවෙසි. තස්ස තතිය සාවණාය එකො කාකො උට්ඨාය "තිට්ඨ තාව, එතස්ස ඉමස්මිං රාජාභිසෙකකාලෙ ඊදිසං මුඛං, කුද්ධස්ස කීදිසං භවිස්සති? ඉමිනා හි කුද්ධෙන ඔලොකිතා මයං තත්තකපාලෙ පක්ඛිත්තතිලා විය තත්ථ තත්ථෙව භිජ්ජිස්සාම. ඉමං රාජානං කාතුං මය්හං න රුච්චතී"ති ආහ. (උලූකජාතකයෙනි.)

(සිංහලාර්ථ සඳහා විවරණය බැලියයුතු.)

4. "සත්ථා ඤාතකෙ ආමන්තෙත්වා "මහාරාජ, තුම්හෙ ඤාතකා; ඤාතකෙහි නාම සමග්ගෙහි සම්මොදමානෙහි භවිතුං වට්ටති. ඤාතකානංහි සාමග්ගියා සති පච්චාමිත්තා ඔකාසං න ලභන්ති. තිට්ඨන්තු තාව මනුස්සභූතා, අචෙතනානම්පි රුක්ඛානං සාමග්ගිං ලද්ධුං වට්ටති: අතීතස්මිං හි හිමවන්තප්පදෙසෙ මහාවාතො සාල

වනං පහරි. තස්ස පන සාලවනස්ස අඤ්ඤමඤ්ඤං රුක්ඛ-ගච්ඡ-ගුම්බ-ලතාහි සම්බන්ධත්තා එකරුක්ඛම්පි පාතෙතුං අසක්කොන්තො මත්ථකමත්ථකෙනෙව අගමාසි. එකං පන අඞ්ගණෙ ඨිතං සාඛාවිටපසම්පන්නං මහාරුක්ඛං අඤ්ඤෙහි රුක්ඛෙහි අසම්බන්ධත්තා උම්මූලෙත්වා භූමියං පාතෙසි. ඉමිනා කාරණෙන තුම්හෙහිපි සමග්ගෙහි සම්මොදමානෙහි වසිතුං වට්ටතී''ති.

(රුක්ඛධම්ම ජාතකයෙනි.)

5 "සාවත්ථියං කිරෙකං කුලඝරං ජනපදෙ එකො කුලපුත්තො අත්තනො පුත්තස්ස වාරෙත්වා "අසුකදිවසෙ නාම ගණ්හිස්සාමී''ති දිවසං ඨපෙත්වා තස්මිං දිවසෙ සම්පත්තෙ අත්තනො කුලූපකං ආජීවකං පුච්ඡි: "භන්තෙ, අජ්ජ මයං එකං මඞ්ගලං කරිස්සාම, සොභනං නු ඛො නක්ඛත්ත''න්ති? සො "අයං මං පඨමං අපුච්ඡිත්වා ඉදානි පටිපුච්ඡතී''ති කුජ්ඣිත්වා "අජ්ජ අසොභනං නක්ඛත්තං, මා අජ්ජ මඞ්ගලං කරිත්ථ; සචෙ කරිස්සථ, මහාවිනාසො භවිස්සතී''ති ආහ. තස්මිං කුලෙ මනුස්සා තස්ස සද්දහිත්වා තං දිවසං න ගච්ඡිංසු. නගරවාසිනො සබ්බං මඞ්ගලකිරියං කත්වා තෙසං අනාගමනං දිස්වා යථාකතෙනෙව මඞ්ගලෙන ධීතරං අඤ්ඤස්ස අදංසු. ඉතරෙ පුනදිවසෙ ආගන්ත්වා "දෙථ නො දාරික''න්ති ආහංසු. අථ නෙ සාවත්ථිවාසිනො "ජනපදවාසිනො නාම තුම්හෙ ගහපතිකා පාපමනුස්සා, දිවසං ඨපෙත්වා අවඤ්ඤාය නාගතා; ආගතමග්ගෙනෙව පටිගච්ඡථ; අම්හෙහි අඤ්ඤෙසං දාරිකා දින්නා''ති පරිභාසිංසු. තෙ තෙහි සද්ධිං කලහං කත්වා යථාගතමග්ගෙනෙව ගතා'' (නක්ඛත්තජාතකයෙනි.)

6. "තිස්සමහාරාජාපි දෙවසිකං චෙතියපබ්බතෙ භික්ඛුසංඝස්ස දානං දදමානො "මහාරාජ, කිං එකමෙව ඨානං භජසි? කිං අඤ්ඤත්ථ දාතුං න වට්ටතී''ති? ජනපදෙහි වුත්තෙ, දුතියදිවසෙ අනුරාධපුරෙ මහාදානං දාපෙසි. එකභික්ඛුපි පටිග්ගහණෙ මත්තං න අඤ්ඤාසි. එකමෙකෙන පටිග්ගහිතං ඛාදනීය-භොජනීයං වෙ තයො ජනා උක්ඛිපිංසු. රාජා දුතියදිවසෙ චෙතියපබ්බතෙ භික්ඛුසංඝං නිමන්තාපෙත්වා රාජන්තෙපුරං ආගතකාලෙ "පත්තං දෙථා''ති ආහ. "අලං මහාරාජ, අත්තනො පමාණෙන භික්ඛං ගණ්හිස්සාමා''ති එකභික්ඛුපි පත්තං න අදාසි. සබ්බෙ පමාණයුත්තකමෙව පටිග්ගණ්හිංසු. අථ රාජා "පස්සථ, තුම්හාකං භික්ඛූසු එකොපි මත්තං න ජානාති; කිඤ්චි අවසෙසං නාහොසි; අජ්ජ ගහිතං මන්දං අවසෙසමෙව බහූ''ති තෙසං මත්තඤ්ඤුතාය අත්තමනො ඉතරෙසඤ්ච අමත්තඤ්ඤුතාය අනත්තමනො අහොසි."

(සම්මොහවිනොදනී අටුවාවෙනි)

7. “පිතුමහාරාජා රජ්ජං පටිපජ්ජි. පරසමුද්දා ආගතාගතා භික්ඛූ “කහං වත්තබ්බකනිග්‍රොධත්ථෙරො? කහං වත්තබ්බකනිග්‍රොධත්ථෙරො”ති? පුච්ඡිත්වා තස්ස සන්තිකං අගමිංසු. මහා භික්ඛුසංඝො ථෙරං පරිවාරෙසි. සො මහාභික්ඛුසංඝපරිවුතො අනුපුබ්බෙන මහාවිහාරං පත්වා මහාබොධිං මහාචෙතියං ථූපාරාමං ච වන්දිත්වා නගරං පාවිසි. යාව දක්ඛිණවාරා ගච්ඡන්තස්සෙව නවසු ඨානෙසු තිචීවරං උප්පජ්ජි, අන්තොනගරං පවිට්ඨකාලතො පට්ඨාය මහාසක්කාරො උප්පජ්ජි, ඉති කාලවිපත්තියං තාලඵල- කන්ද-මූල-පණ්ණම්පි දුල්ලභං ජාතං; කාලසම්පත්තියං එවරූපො මහාලාභො උප්පන්නො”ති”

(සම්මොහවිනොදනී අටුවාවෙහි)

8. කූටකණ්ණරාජා කිර ගිරිගාමකණ්ණවාසිං චූළසුධම්මත්ථෙරං මමායති. සො උප්පලවාපිගං වසමානො ථෙරං පක්කොසාපෙසි. ථෙරො ආගන්ත්වා මාලාරාමවිහාරෙ වසති. රාජා ථෙරස්ස මාතරං පුච්ඡි: “කිං ථෙරො පියායතී?”ති. “කන්දං මහාරාජා”ති. රාජා කන්දං ගාහාපෙත්වා විහාරං ගන්ත්වා ථෙරස්ස දදමානො මුඛං උල්ලොකෙතුං නාසක්ඛි. සො නික්ඛමිත්වා බහිපරිවෙණෙ දෙවිං පුච්ඡි “කීදිසො ථෙරො?”ති. “ත්වං පුරිසො හුත්වා උල්ලොකෙතුං න සක්කොසි; අහං කථං සක්ඛිස්සාමි, නාහං ජානාමි කීදිසො”ති. රාජා “මම රට්ඨෙ බලිකාරගහපතිපුත්තං උල්ලොකෙතුං න විසහාමි; මහන්තං වත භො බුද්ධසාසන”න්ති අප්පොඨෙසි” (ඤාණවිභඞ්ග අටුවාවෙහි.)

9. “බ්‍රාහ්මණතිස්සචොරෙ මහතෙ පිතුමහාරාජා ජනතං උස්සාපෙසි. “භයං වූපසන්තං, ජනපදො සම්පන්නො”ති සුත්වා පරසමුද්දතො භික්ඛුසංඝො නාවාය මහාතිත්ථපට්ටනෙ ඔරුය්හ “මහාසොණත්ථෙරො කහං වසතී”ති පුච්ඡිත්වා ථෙරස්ස සන්තිකං අගමාසි. ථෙරො පඤ්චසතභික්ඛුපරිවාරො කාලකනාගමණ්ඩලාරාමවිහාරං සම්පාපුණි.”

“වත්තබ්බකනිග්‍රොධත්ථෙරස්සාපි සාමණෙරකාලෙ බ්‍රාහ්මණතිස්සභයං උදපාදි. සාමණෙරො ච උපජ්ඣායො චස්ස පරසමුද්දං නාගමිංසු, “පණ්ණඛාදකමනුස්සෙ උපනිස්සාය වසිස්සාමා”ති පච්චන්තාභිමුඛා අහෙසුං. සාමණෙරො සත්තාහමත්තං අනාහාරො හුත්වා එකස්මිං ගාමට්ඨානෙ තාලරුක්ඛෙ පක්කං දිස්වා උපජ්ඣායං ආහ “භන්තෙ ථොකං ආගමෙථ, තාලපක්කං පාතෙස්සාමී”ති. “දුබ්බලොසි ත්වං සාමණෙර, මා අභිරුහී”ති. “අභිරුහ

ගිස්සාමි භන්තෙ"ති බුද්ධකවාසිං ගහෙත්වා තාලං ආරුය්හ තාලපිණ්ඩිං ඡින්දිතුං ආරභි. වාසිඵලං නික්ඛමිත්වා භූමියං පති. ථෙරො චින්තෙසි: "අයං කිලමන්තොව රුක්ඛං ආරූළ්හො, කිං නු ඛො ඉදානි කරිස්සතී"ති. සාමණෙරො තාලපණ්ණං ඵාලෙත්වා ඵාලෙත්වා වාසිදණ්ඩකෙ බන්ධිත්වා ඝට්ටෙන්තො ඝට්ටෙන්තො භූමියං පාතෙත්වා "භන්තෙ, සාධු වත'ස්ස සචෙ වාසිඵලං එත්ථ පවෙසෙය්‍යාථා"ති ආහ. ථෙරො "උපායසම්පන්නො සාමණෙරො"ති වාසිඵලං පවෙසෙත්වා අදාසි. සො වාසිං උක්ඛිපිත්වා තාලඵලානි පාතෙසි ............................යාව තාලඵලානි අහෙසුං තාව තත්ථෙව වසිත්වා ඵලෙසු ඛීණෙසු අනුපුබ්බෙන පණ්ණඛාදකමනුස්සානං වසනට්ඨානෙ එකං ඡඩ්ඩිතවිහාරං පවිසිංසු."

(ඤාණවිභඞ්ගට්ඨකථා.)

10. බ්‍රාහ්මණතිස්සචොරෙපි ජනපදං විද්ධංසෙසි .......... .. ... .....සංඝො සබ්බදිසාහි නාගදීපං ගන්ත්වා ජම්බුකොලපට්ටනෙ තිභූමක-මහාඋළුම්පං බන්ධාපෙසි. එකා භූමිකා උදකෙ ඔසීදි; එකිස්සා භික්ඛුසංඝො නිසීදන්තො, එකිස්සා පත්තචීවරානි ඨපයිංසු, සංයුත්තභාණක-චූළසිවත්ථෙරො, ඉසිදත්තත්ථෙරො, මහාසොණත්ථෙරොති තයො ථෙරා තාසං පරිසානං පාමොක්ඛා. තෙසු ච ථෙරා මහාසොණත්ථෙරං ආහංසු: "ආවුසො මහාසොණ, අභිරුහ උළුම්ප"න්ති. 'තුම්හෙ පන භන්තෙ"ති? "ආවුසො, උදකෙ මරණම්පි ථලෙ මරණම්පි එත්තකමෙව, න මයං ගමිස්සාම; තං නිස්සාය පන අනාගතෙ සාසනස්ස පවෙණි ඨස්සති, ගච්ඡ ත්වං ආවුසො"ති "නාහං භන්තෙ තුම්හෙසු අගච්ඡන්තෙසු ගමිස්සාමී"ති යාව තතියං කථෙත්වාපි ථෙරං ආරොපෙතුං අසක්කොන්තා නිවත්තිංසු."

"තස්මිං සමයෙ මහාවිහාරෙ සුඤ්ඤෙ, චෙතියඞ්ගණෙ එරණ්ඩා ජාතා; චෙතියං ගච්ඡෙහි පරිවාරිතං, සෙවාලෙන පරියොනද්ධං. ථෙරො ධරමානකබුද්ධස්ස නිපච්චාකාරං දස්සෙන්තො විය මහාචෙතියං වන්දිත්වා පච්ඡිමදිසාය සාලං පවිසිත්වා ඔලොකෙන්තො "එවරූපස්ස නාම ලාභග්ග-යසග්ගපත්තස්ස සරීරධාතුනිචයට්ඨානං අනාථං ජාත"න්ති චින්තයමානො නිසීදි."

"ඉසිදත්තත්ථෙරොපි අනුපුබ්බෙන චාරිකං චරන්තො අළජනපදං සම්පාපුණි. තත්ථ මනුස්සා නාතිපක්කානි මධුකඵලානි භින්දිත්වා අසිං ආදාය තචං ඡඩ්ඩෙත්වා අගමංසු. ථෙරො "ආවුසො මහාසොණ, භික්ඛාහාරො පඤ්ඤායතී"ති වත්වා පත්තචීවරං ආහරාපෙත්වා චීවරං පාරුපිත්වා පත්තං නීහරිත්වා අඨාසි. තරුණ

දාරකා ථෙරං සිතං දිස්වා, "ඉමිනා කොචි අත්ථො භවිස්සතී"ති වාලුකං පුඤ්ජිත්වා මධුකඵලත්තචං පත්තෙ පක්ඛිපිත්වා අදංසු. ථෙරා පරිභුඤ්ජිංසු. සත්තාහබ්භන්තරං සො යෙව ආහාරො අහොසි. (ඤාණවිභඞ්ග අටුවාවෙනි.)

—:—

# ලෙඛණසම්පාදනය.

1 පොත් වෙළඳකුගෙන් පොතක් තිබේදැයි අසා යැවීමට:-

අභිනවගාමෙ
වාලුකාරාමතො
15. 10. 30.

කොළම්බනගරෙ ජේ. ඩී. ප්‍රනාන්දු
මහාසයානං පෙසිතං.

භවන්තා,

සචෙ තුම්හෙහි කතිපයවස්සානමුපරි මුද්දාපිතා "සුත්තනිපාත පාළි" යාවජ්ජතනා වික්කිණීයන්තෙ තතො මය්හමෙකං පොත්ථකං ඉධ සාසනපණ්ණාගාරතො මූලං දත්වා ගහණත්ථාය පෙසෙථ.

සචෙ තා නිට්ඨිතා තං මය්හං නිවෙදෙථ. අධුනා මුද්දාපිතානං "පෙතවත්ථු-විමානවත්ථු-ථෙරගාථා - ථෙරීගාථානං" වික්කායිත මූලං කිත්තකන්ති ජානිතුමිච්ඡාමි.

භවන්තානං විස්සාසිකො
සීලවංසො සමණුද්දෙසො.

—— ——

2 පිරිවෙණක වසන පැවිදි ශිෂ්‍යයකු විසින් සවකීය උපාධ්‍යාය සථවිරතුමන්ට:—

පෙසියතිදං කොළම්බනගරෙ මණ්ඩලාරාමෙ වසන්තෙන පියනන්දෙන භික්ඛුනා ගාරව බහුමානපුබ්බඞ්ගමං පාදෙ වන්දිත්වා.

භන්තෙ,

තුම්හෙහි කතිපයදිවසානමුපරි මම පෙසිතං සාසනපණ්ණ මලභිං. තත්තෙනානඬං ඉතරං සාසනපණ්ණං පරිවෙණාචරිය-වරස්සාදාසිං

ඉදානි'මස්මිං පරිවෙණෙ අසීතිමත්තා සිස්සා උග්ගණ්හන්ති. අභිනවා සාලාපි නිට්ඨානං ගතා; ආගාමිමාසෙ තස්සා පවෙසන මහුස්සවො ගම්භීරාකාරෙන පවත්තිස්සතෙ. භදන්තාපි තදත්ථාය ඉධ පාපුණිස්සන්තීති මඤ්ඤෙ.

ආගාමිවස්සෙ උග්ගණ්හනත්ථාය බහූ මය්හං පොත්ථකා කිණිතබ්බා; තෙසමත්ථාය මූලම්පි ලද්ධබ්බං; තමත්ථං මය්හං මාතාපිතූනං ඤාතිකානං ච ආරොචෙථ, මය්හං අරොගභාවඤ්ච තෙසං නිවෙදෙථ.

තුම්හාකඤ්ච ඉතරෙසං සබ්බෙසං ආරාමවාසීනං ච සුඛදුක්ඛං අඤ්ඤඤ්ච පවත්තියො ච ජානිතුමිච්ඡාමි.

භද්දන්තස්ස සුවචසිස්සො

පියනන්දො භික්ඛු.

---

3. ඒ උපාධ්‍යායස්ථවිරතුමන් විසින් ස්වකීය ශිෂ්‍ය තැනට:—

ලිඛීයති'දං මෙත්තාපුබ්බඞ්ගමං

පියනන්දස්ස භික්ඛුනො.

සොත්ථ්‍යත්ථු!

ලද්ධමය්හා භවතා පෙසිතං සාසනපණ්ණං. පරිවෙණාධිපතිනා මහාථෙරෙනපි මම සකාසෙ එකං පණ්ණං පහිතං.

පාපමිත්තෙහි සඞ්ගම්ම නගරෙ තත්ථ තත්ථ විචරණමකත්වා සාධුකං සුස්සූසන්තෙන ධම්මවිනයො උග්ගණ්හිතබ්බොති අම්හාකං සතතොවාදෙ භවතා පටිපජ්ජිතබ්බො. න තාව මයා සුතං භවතො තාදිසං අගොචරචරණං, යදා පනාහං සුණාමි තාදිසං තදහං ඛිප්පමෙව තං සඞ්ඝාරාමං ආණාපෙමි උග්ගහං ඨපෙත්වා.

යෙ ත්වං පොත්ථකෙ කිණිතුමිච්ඡසි තෙ ඉධාගතකාලෙ ඉතොව ලභිස්සසි.

අහඤ්චච අඤ්ඤෙ චාරාමවාසිකා සුඛිතො; ත්වම්පි තථෙවාති සද්දහාමි. ඉදානිධ අභිණ්හං දෙවො වස්සති, අඤ්ඤං ආරොචෙතබ්බං නත්ථි

භවතො උපජ්ඣායො

සීලරතනත්ථෙරො.

---

4. මේ පොතේ කර්තෘ ස්විට්සර්ලන්තයේ නැවතී සිටියදී මහාවංශපරිවර්තක "විල්හැල්ම් ගයිගර්" නම් ජර්මන් පඬිතුමාට යැවූ ලිපියක්:—

"පෙසීයති ඉදං ලෙඛනං බුද්ධදත්තෙන ථෙරෙන ඩබ්ලියු. ගයිගර් පණ්ඩිතස්ස (1928) චිත්තමාසස්ස සුක්කපක්ඛ වාදසමියං රවිවාරෙ "ලොකාර්නො" නගරතො.

ජයතු භවං මහායසො!

අහම්පනෙ’කො සීහළභික්ඛු, යතමාසෙ ඉධාගතො “ආර්. ලන්ගේ” නාමකස්ස ගහපතිනො අජ්ඣෙසනම්පටිච්ච; ඉදානි තස්ස සන්තිකෙ වසාමි එතෙන කප්පියකාරකෙන සද්ධිං.

එසො පන ගහපති මයා පාළිභාසං චෙව බුද්ධධම්මඤ්ච උග්ගණ්හිතුමිච්ඡති.

භවතො පන මහායසස්ස නාමං මයා චිරකාලතො පඨාය සුතං පාළිපොත්ථකසමිති (Pali Text Society) වාරතො. භවතා අම්හාකං මහාවංසස්ස සොධනෙන පරිවත්තනෙන ච සීහළානං කතො උළාරො සංගහොපි මයා විදිතො.

මයාපි පාළිපොත්ථකසමිතියා අත්ථාය “සම්මොහවිනොදනී-විනයවිනිච්ඡයා’’දීනං පොත්ථකානං පරිසොධිතත්තා මම නාමම්පි භවං ජානාතීති මඤ්ඤාමි.

ඉමිනා ලෙඛනෙන සහ මයා සම්පාදිතෙ වෙ පොත්ථකෙ භවතො තුට්ඨිපාහතවසෙන පෙසෙමි. තෙ පන භවතො උපකාරවහා න හොන්ති, තථාපි භවන්තෙන මිත්තභාවං පත්ථයන්තො ඉමෙ පෙසෙමි.

පටිසාසනං ඉංග්ලිෂ්භාසාය වා පාළිභාසාය වා පෙසෙතු.

භවතො විස්සාසිකො

බුද්ධදත්තො (ථෙරො)

ලෙඛනානි ඊදිසං පෙසෙතබ්බානි:—

A. P. Buddhadatta
"Buen Retiro"
Locarno.

---

5. මීට පිළිතුරු වශයෙන් සිංහල අකුරෙන්ම ලියා ඒ පඬිතුමා විසින් එවනලද ලිපිය:—

“ඉදං සාසනපත්තං විලියම්ගෙගර් නාම පණ්ඩිතෙන ආයස්මතො බුද්ධදත්තථෙරස්ස සන්තිකං පෙසියති.

ආයස්මතො නාමං සම්මොහවිනොදනී—විනයවිනිච්ඡය—උත්තරවිනිච්ඡයාදීනං පොත්ථකානං පරිසොධිතත්තා චිරකාලතො පඨාය පාකටං මෙ අහොසි. තස්මා ආයස්මතො හත්ථතො පාළිභාසාය විරචිතං ලෙඛනං ලභිත්වා අතීව සන්තුට්ඨො අහොසිං; තං ච තුට්ඨිං දස්සෙතුකාමො අහම්පි ඉදං පටිසාසනං පාළිභාසාය පෙසෙමි. පයොගස්ස පන අභාවෙන මයා කතෙ දොසෙ ඛමතු භවං. පච්ඡිමදෙසවාසිනො හි පණ්ඩිතා පාළිභාසං පොත්ථකෙහි කෙවලං උග්ගණ්හන්ති, න දෙවසිකකථාසල්ලාපෙන.

යං මෙ පොත්ථකමයං ආයස්මතා ලෙඛෙන සද්ධිං පෙසිතං තම්පි අහං පාභතං ධාරෙමි පියඤ්ච මනාපඤ්ච. ඛ ද්‍ර නන ‘ සාධකානං පාළිභාසං උග්ගණ්හිතුමිච්ඡන්තානං තානි පොත්ථකානි ජ් ස්සංසයං බහූපකාරවන්තා භවිස්සන්ති.

1926 මෙ වස්සෙ මම චතුමාසං ලඞ්කාදීපෙ වුසිතභාවං ආයස්මා ජානාතීති මඤ්ඤාමි. න පන තස්මිං කාලෙ අහං ආයස්මන්තං අපස්සිං, න ච මයං සම්මොදනීයං කථං සාරණීයං වීති සාරිම්හ; අනාගතෙ තං කාලෙ භවෙය්‍යාති පත්ථෙමි.

සොත්ථිමා අරොගො ච හොතු ආයස්මා, සුඛඤ්ච ජීවතු.

ආයස්මතො විස්සාසිකො

විලියම් ගෛගර්.

Prof. Dr. Wilh, Geiger.
Munchen-Neubiberg,
Bavaria, Germany.

---

6. දෙවෙනිවර අපවිසින් යවනලද ලිපිය:—

“මහාපඤ්ඤස්ස ඩබ්ලියු ගෛගර් නාමස්ස සන්තිකං පෙසිතම්දං.

සොත්ථි භවතු!

පච්ඡිමදෙසියෙන භවතා මෙධාවිනා සීහළක්ඛරෙහි පාළිභාසාය ලිඛිතං සාසනපණ්ණං දිස්වා අතිවිය විම්හිතමානසො වාචෙත්වා පීතියා ඵුට්ඨො අහොසිං.

සච්චමෙව යං භවතා තම්හි ලෙඛෙන වුත්තං: පරිවෙණෙය අසන්ති පාළියා වාක්‍යරචනා අතිදුක්කරාති න පන තෙ සුලභා පච්ඡිමෙ ගෙය සක්කොන්ති පාළිසාසනානි ලිඛිතුං අඤ්ඤත්‍ර භවතාති මඤ්ඤාමි.

1926 මෙ වස්සෙ භවතො මහායසස්ස ලඞ්කාදීපං සම්පත්තභාවං තදා ජානිං, තථාපි කාරණෙන විනා භවන්තං පස්සිතුං න උස්සහිං. සචාහං තදා ජානිතුං අසක්ඛිස්සං භවන්තස්ස බලපිටිය ගාමෙ ගුණසෙඛරම්භන්තිතො වංසධාතගමනං, අම්හාකං සම්මුඛීභාවො සුකරො අභවිස්ස මය්හං ජාතභූමි චෙව පිරිවෙණට්ඨානඤ්ච තදනන්තරභූතො අම්බලංගොඩනිගමො හොති. ගුණසෙඛරො පන මන්තී මය්හං විස්සාසිකම්මිත්තෙසු එකො.

ඉදම්පන මය්හං පඨමාගමනං පච්ඡිමදෙසම්පති. සචා’හං පටිබලො භවෙය්‍යං ආගමෙ ගිම්හෙ භවන්තානං රට්ඨම්පි පස්සිතුං භවතාපි මහාපඤ්ඤෙන සම්මුඛීභවිතුං පත්ථෙමි.

සුඛී භවතු අරොගො නිද්දුක්ඛො සද්ධිං පුත්තදාරෙහි

භවතො විස්සාසිකො

බුද්ධදත්තො.

Buen Retiro
Via Circonvallazione,
Locarno,

# අර්ථවිවරණ.

උදාහරණ වශයෙන් දැක්වූ ඇතැම් පාලිපාඨයන්ගේ අර්ථාදිය මෙහි දක්වනු ලැබේ.

## 10 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි :—

1. "ස්වාමීනි, යම් හෙයකින් මේ ලෝකයෙහි ස්ත්‍රීතොමෝ දුර්වර්ණ වේද, විරූප වේද, දක්මට අප්‍රිය තැනැත්තියක් වේද, දිළිඳු වේද, අල්පධන-අල්පභෝග ඇත්තියක් වේද, ඒ හේතුව ප්‍රත්‍යය කවරේද?"

2. "කඩුගත් අත් ඇතියකු හා කථාකරන්නේය, පිශාචයකු හාත් කථාකරන්නේය, නමුත් තනිවූයේ හුදකලාවූ ස්ත්‍රියක් සමග කථානොකරන්නේය."

3. "මහණෙනි, ස්ත්‍රීතොමෝ කරුණු දෙකක් සම්බන්ධයෙන් තෘප්තනොවූවා පසුනොබසින්නී කලුරිය කරයි."

4 ආනන්දය, ස්ත්‍රිය ක්‍රෝධකරන සුලුය, ඊර්ෂ්‍යාකරන සුලුය, මසුරුය, දුෂ්ප්‍රාඥය; ආනන්දය, මාගම සභාවක නොහිඳිනීය, කර්මාන්ත නොමයොදවන්නීය යන්නට හෙතුව මේය.

## 11 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි.

3. "වෛරී මනුෂ්‍යයන් අතුරෙහි වෛර නැත්තෝව එකාන්තයෙන් ඉතා සැපසේ ජීවත්වෙමු."

4. "දැඩිකොට නොහඩව, වහා පොදිය බඳුව."

7. "ඔහු සකසා වලඳවා ඔහුගේ පාත්‍රය මනාකොට සෝදා නොයෙක් අග්‍රරසභොජනයෙන් පුරවා 'මේ පිණ්ඩපාතය උන්වහන්සේට දුනමැනවැ'යි කීය."

1. "මසුරු සිටහු මොහොතකින් දමනයකොට සම්බුදුන් වහන්සේට හමුකොට සෝවාන් ඵලයෙහි පිහිටුවිය."

2. "කිම කොවැ පෙරප්‍රේමින් දුකසේ දරුවකු වදූ."

3. "දැන් මගේ සිත නිවියාක් වන්නේය, සැපසේ ද නිදන්ට ලබන්නෙමි.

## 12 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

9. එක් ධනවතෙක් තමාගේ පුතුන් සිවුදෙන අතුරෙන් එක එකාට රුපියල් දහස බැගින් ද ගවයන් සියය බැගින් ද දුන්නේය.

10. ලඞ්කාවීපය පාලනය කරන්නෝ නොයෙක් බදුවලින් වර්ෂයකදී රුපියල් දෙලොස් කෝටියක් ද අසූලක්ෂයක් ද ලබත්.

### 16 වෙනි අඞ්කය හා සම්බන්ධයි:

7. තිස්සය, දැඩිමහලු භික්ෂූන්ට මේ සියලු වත් කරන්ට වටී, ඒ භික්ෂූන් කමාකරව.

8. හෙතෙම කිම්ද අත් තැනකින් පලාගියේය.

9. ඒ ගෙයි සියලු දාසයෝ ද කම්කරුවෝද විශාඛාවන් සතුවූවෝය.

මේ භින්න හා සමාන ගින්නක් නම් නැතැයි මෙසේ මේ කාරණයෙහි ඕ නිදෙස් ම විය.

10. අත්දෙකින් දණදෙකේ එල්ලී තතනමින් (කෙඳිරි ගාමින්) "ගෙයි කිසිවක් ඇද්ද"යි ඇසීය.

### 17. සමාසවිශේෂණ හා සම්බන්ධයි:

1. "හෙතෙම නහර ඉල්පුණු සිරුරු ඇත්තේ අලසබැවින් මැඩුණේ කසන හොරිවලින් ගැවසුණේ විය."

2. "ගැල් අසූවක (පුරවන) තරම් කිහිරිදර ගෙන්වා පුරවා."

3. 'සියල් සුදු ඇත්පැටියා දුන් තනිව හැසිරෙන ඇතා සැරියුත් තෙරුන්වහන්සේ වූහ.'

4. "කළු බත්කිස ඇති (=දත්වලද අවසන්වූ) තෙරුන් හා මිහිරි පිළිසඳරකොට (=තොරතුරු කථාකොට) මෙසේ කීය."

5. මධුර නාද ඇති කරවීක පක්ෂිතෙමේ මිහිරි රසැති මීඅඹ ගෙඩිය මුවතුඩින් (=හොටයෙන්) ඇන වැගිරෙන රසය ආස්වාදනය කොට (=බී) සියලු වනය ආශ්‍රිත (වැ වසන) සත්වසමූහය මත්කරමින් නාදකෙරේ.

6. "පහළවූ සත්රුවන් ඇති කාලිඞ්ග චක්‍රවර්ති, රජතෙමේ එක්දිනක් සියලු අලඞ්කාරයෙන් සැරසුනේ මල්විලවුන් දූරුයේ සඞ්ඛධවලවූ කෛලාසකූටය (=හිමවතු මිදිදියෙන් වැදුණු කන්දකි) ට සමානවූ හස්තිරත්නයට නැගී මවුපියන්ගේ ආශ්‍රම පදයට ගියේය."

7. සැවැත්නුවර අනේපිඬු – විශාඛාදි පස්කෙළක් පමණ ආර්‍ය්‍යශ්‍රාවකයෝද දෙකෙළක් පමණ යහපත් පෘථග්ජනයෝ (=මාර්ගඵල නොලැබූ සම්‍යක්දෘෂ්ටිකයෝ) ද සුවඳ මල් ආදිය ගෙන රැස්වූහ.

8. "සත්රුවන්මුවා ගරුදිවැටක් කරවා රන් (සුණු) මිශ්‍ර වැලි අතුරවා පවුරකින් වටකරවා සප්තරත්නමය දෙරකොටු වක් කරවිය."

9. "තිස්යොදුන් මග ගොස් උස් රළ බිඳීමෙන් රම්‍යවූ ගඞ්ගානදිය එතරකොට (=නදියෙන් එතරව) උතුම් රජගෙවල් ඇති රජගහ නමැති අතිමනොඥ නගරයට පිවිස එහි ඓශ්වර්‍ය්‍ය මදයෙන් මත්වූ ජනයාට පරිහාස (=කවට්කම්) කරන්නාසේ සත්හුන් ඉදුරන් ඇත්තේ සත්හුන් සිත්ඇත්තේ පිඬුපිණිස හැසිර........ බබලමින් වැඩහුන්නේය."

10. "ශක්‍රතෙමේ විජයුත්තර නමැති එක්සියවිසියොදුන් දිගැති ලොකකුහරය පතුරුවන නාදඇති සක පිඹිමින් සිටියේය.

18 වෙනි අඩ්කය හා සම්බන්ධයි :

8. මහාපුරුෂතෙමේ වැටකෙය්යා – හෝපලු – සපුආදි නොයෙක් ගස්සමූහයන්ගෙන් සැරසුණු මුව–අස්–ඇත්–වග ආදි සිවුපාසමූහයන් විසින් හැසිරෙනලද සුරාසුරාදි නොයෙක් සියගණන්අමනුෂ්‍යයන් විසින් සෙවුනාලද නානාවිධරත්න යන්ව ආකරවූ හෝ නානාවිධරත්නාකරඇති දෙව්–කිඳුරු–නගින්ට රඟමඩලක් වැනිවූ හිමවතට බැසගත්තේය.

9. මොහඳුරු නසන දහම් පහන් දල්වන ලොවට යහපත සලසන දීපඞ්කර නමැති නිරුත්තරවූ සම්‍යක් සම්බුද්ධයන්වහන් සේ උත්තම–මනොඥදර්ශනඇති ජනයන්ගේ ඇස් හා සිත් ඇදගන්නා සුදර්ශනමහාවිහාරයෙහි වැඩවසත්.

10. හෙතෙමේ මනාව හැඳි මනාව පෙරවි සත්හුන් ඉඳුරන් ඇති සන්හුන් සිත්ඇති මහාපුරුෂලක්‍ෂණ–අනුව්‍යඤ්ජන (=කුඩා ලක්‍ෂණ)–ව්‍යාමප්‍රභාවන්ගෙන් යුක්තවූ සවණ බුදුරැස් විහිදුවමින් ආර්‍ය්‍යසමූහයා විසින් පිරිවරනලද්දුව සැරසූ මඟට බැස්සාවූ දෙව් මිනිසුන් විසින් පුදනුලබන දීපඞ්කරසර්වඥයන්වහන්සේ දැක යටිකුරුව් මඩමත්තෙහි හොත්තේය.

11. මහත් මහත් පර්වතකූටයෝ දුමමින් දල්වෙමින් අහ සින් අවුත් බෝසතුන් හරු පැමිණ දිව්‍යමල්ගුළිබවට පත්වූහ.

## 24 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

1. යෙහෙකි, ස්වාමීනි, අදහස්වූ පරිදි කළමැනව.
2. හොඳයි, සොඳුර, එක් අරමුණක් දැක මට කියන්නෙහිය.

3. ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙමේ "එසේය ඇවැතැ"යි ඒ භික්ෂුවට අස්වා (=පොරොන්දුවී) භාග්‍යවතුන්වහන්සේ වෙත එළඹියේය.

## 26 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

1. පදුමරජතෙමේ බරණැස රාජ්‍යය කරවයි, මුළු දඹදිව කළඹා දන්දෙයි, හෙතෙම තා දැක සතුටුවන්නේය, සතුටුවූයේ බොහෝ ධනය දෙන්නේය.

2. බොලව්, කුමක්හෙයින් සිටිව්ද? මේ කුමරු අල්වාගනිව්, නසව්, පලවා හරිව්.

3. භාග්‍යවත්තෙමේ ඇලාගේ වචනය මේතෙහි නො කෙළේය, ඇස් හැර නොබැලුවේය, විවේකසැපයම අනුභවකර මින් හුන්නේය.

4. තිස්දෙනෙක්වූ අපි පරපණ නොනසමු, නුදුන්දෙය නොගනිමු, වරදසේ නොහැසිරෙමු, බොරු නොකියමු, මත්පැන් නොබොමු, මෙත් වඩමු, දන් දෙමු, මග සමකරමු, පොකුණු සාරමු, සාලාවන් සාදමු.

## 27 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

3. සම්බුද්ධයන්වහන්සේ අග්ගාළවචෛත්‍යස්ථානයෙහි වසන කල්හි බොහෝ උපාසිකාවෝ ද භික්ෂුණීහු ද බණ ඇසීම පිණිස විහාරයට යෙති, කල්ගතවෙනකල්හි උපාසිකාවෝත් භික්ෂුණීහුත් නොගියාහ; භික්ෂූහු ද උපාසකයෝ ද වූහ.

4. රජ ද රජකුමරුවෝ ද ජනපදයෙහි නියුක්ත පුරුෂ තෙමේ ද භාණ්ඩාගාරිකයාද පිළිවෙළින් කළුරියකොට පිරිස සමග ස්වර්ගයෙහි උපන්හ.

## 28 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

1. ඉක්බිති උදේනරජුගේ අන්තඃපුරස්ත්‍රීසමූහය ආයුෂ්මත් ආනන්දස්ථවිරයන්වහන්සේ යම්තැනක ද එතැනට එළඹියේය. ආයුෂ්මත් ආනන්දස්ථවිරතෙමේ එකත්පසෙක හුන් උදේන රජුගේ අන්තඃපුරස්ත්‍රීසමූහය ධර්මකථාවෙන් අතිශයෙන් සතුටු කරවිය. ඉක්බිති අන්තඃපුරස්ත්‍රීසමූහය ආයුෂ්මත් ආනන්දස්ථවිර තුමන්ට උතුරුසළු පන්සියයක් දුන්නේය.

31 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

2. වැද්දා කොටුවෙන් නික්ම මුවා මස්කොට (හමගසා මස් උපුටා) සිනි මොලවා මිහිරිමස් පිස සා පැන් බී ඉතිරි මස් සාදින් ගෙන ගෙට ගියේය.

3. හෙතෙම යන්නේ ගැල් මුදවා වටේ ගැල් තැබීමෙන් (=හෙවත් ගැල්වලල්ලෙන්) කඳවුරක් බඳවා කලින්ම මිනිසුන්ට ද කවා මිනිසුන් මැද ගොනුන් ලඟගවා තෙමේ භටනායක යන් ගෙන කඩුගත්අත් ඇතිව සිටියේම අරුණ නැංවිය.

4. පසුද උදෑසනම සියලු වැඩ නිමවා ගොනුන් කවා දුඊල කරත්ත හැරදමා ශකටීමින් ගැල් ගන්වා මිලඅඩු බඩු ඉවත දම්මවා අගනා බඩු නංවවා අදහස්කලතැනට ගොස් බඩු විකුණා සියලු පිරිස ගෙන නැවත තමාගේ නුවරවම ගියේය.

32 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

1. යහලුවෝ වූ ඒ දෙදෙන බණඇසීමට යන මහාජනයා සමග ජේතවනයට ගොස් එකෙක් ධර්මකථාව ඇසීය, එකෙක් තමාට ගතයුතු දෙයක් බැලුවේය.

33 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

(2.) මල්ගඳ උඩුසුලඟට නො ඒ.

(3.) කවරෙක් මූලංවට නොපැමිණේද?

(4.) වෙනි වාක්‍යයේ අර් සමාසවිශෙෂණ පිළිබඳ 6 වෙනි අධ්‍යායෙහි දක්වනලදී.

37 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

කර්තෘවිශෙෂණානනවර්‍ථවාක්‍යාදහරණ:

A. පක්ෂිහු යම් වෘක්ෂයක් ආශ්‍රිතවෙත්ද ඒ මේ ගස ගිනි මුදයි (=පිටකෙරේ.)

C. සබ්‍රහ්මචාරීන් කෙරෙහි ගෞරවයක් යමකු කෙරෙහි විද්‍යමාන නොවේ ද හෙතෙම සද්ධර්මයෙන් දුරුවේ; කුමක් මෙන්ද යත්? අහසින් පොළොව දුරවන්නාක් මෙනි.

කර්මවිශෙෂණානනවර්‍ථවාක්‍යාදහරණ:

A. යමෙක් පැහැදුණේ සවකීය චිත්තයෙන් මාගේ ශාසනය කිර්තනය කෙළේද, මම ඔහු කිර්තනය කරමි, කියන්නාවූ මාගේ (වචනයන්) අසව්.

B. යමෙක් අසත්පුරුෂයකුට අනුග්‍රහ කෙරේද, අසත් පුරුෂයකු සේවනය කෙරේද, (ඒ අසත්පුරුෂතෙමේ) ඔහුම ආහාරයකොටගනී (හෙවත් ඔහු විනාශයට පමුණුවයි.) නැවත ප්‍රාණවත් භාවයට පමුණුවනු ලැබූ ව්‍යාඝ්‍රයා (උඩට පණදුන් අයම මරන්නාක්) මෙනි.

### ක්‍රියාවිශේෂණාඛ්‍යාතවාක්‍යෝදාහරණ:

A. යම්තැනක එක් බලලෙක් (කැමක්) ලබාද එහි දෙවෙනි බලලෙක් පහලවේ.

B. යම්කලෙක පිරිසිදු සුදුපැහැති පියාපත්වලින් යුත් කෙකිනියෝ කාලමේඝයාගේ භයින් තැතිගත්තාහු වාසස්ථාන සොයමින් (සවකීය ස්වකීය) වාසස්ථානයන්ට පලායෙත් ද, එකල්හි අජකරණීනදිය මා අභිරමනය කරවයි.

C. පුත්‍රය, යම් යම් දිශාවෙක්හි සුභික්ෂස්ථානයෝ වෙත් ද ක්ෂේමස්ථානයෝ නිර්භයස්ථානයෝ වෙත් ද ඒතැන්හි යව; ශෝකයෙන් පෙළුනේ නොවෙව.

D. යම්සේ මාගේ ධනවිනාශය නොවේ ද එසේ කරන්නෙමි.

E. මිත්‍රය, ඉදින් යුධකරනුකැමැත්තෙහි නම් තට ජය දෙමි.

F. ඒ පක්ෂිතෙමේ යම්තාක්කල් භොජනයෙහි ප්‍රමාණය දත්තේද ඒතාක් ජීවිතයාත්‍රාවට පැමිණියේය, මවත් පොෂණය කෙලේය.

G. සර නමැති තෘණයන් අත්වලින් කඩා කුටියක් (පැලක්) කොට විසුවෙමි; එහෙයින් මට සරභඞ්ග යන නාමය සම්මුතියෙන් විය.

### 13 වෙනි අභ්‍යාසය හා සම්බන්ධයි:

1. යම්තැනක දූසිනමැත්තා පැසුණි නම් ඒ නරකය කෙබඳු වීද?

මාරය, යම් භික්ෂුනමක් වෛජයන්තප්‍රාසාදය පයැ මාපටැගිල්ලෙන් කම්පාකෙළේද එබැනි භික්ෂුනමකාට ලංව (හිරිහැර කොට) දුකට පත්වන්නෙහි.

2. මහාවීරවූ ශ්‍රමණයන්වහන්ස, යම්සේ කියෙහිද එය ස්මය, ඇතැම් කෙනෙක් මඩෙහි මහලු ගවයෙක් මෙන් මෙහි දෙත්.

3. යම්කලෙක ඔවුහු විවාදකරන්නාහුද එකල්හි මාගේ සයට එන්නාහ.

4. ඉදින් විශ්‍රීවත්වූ සමඟහැසිරෙන යහපත් පැවතුම් ඇති මිත්‍රයකු නොලබන්නේ නම් රජකු රාජ්‍යය හැර (හැසිරෙන් නාක්) මෙන් ද වනයෙහි ඇත්රජකු මෙන් ද හුදකලාව හැසි රෙන්නේයි.

5. යම්හෙයකින් බොහෝවූ ආහාරය අනුභවකෙළේද එහෙයින් එහිම ගිලාබැස්සේය (=විනාශයට පැමිණියේය); හෙතෙම අමාත්‍යඥ විය. "යම්කලෙක" "එකල" යයිද 'යතො' 'තතො' නිපාතවයට මෙහිදී අර්ථ කිය හැක.

6. යම්සේ සරත්කාලයෙහි හටගත් බීජය කෙතෙහි වපුරනලද්දේ වැඩේද එමෙන් තාගේ නාසිකාව වැඩේවා; ඉල් වනලද්දේ පියුමක් දෙව.

7. මේ අනාගතමහත්භය පැමිණෙන්ට මත්තෙන් අන්‍යෝන්‍යයන්ව ගෞරව ඇත්තෝ ද සුවචයෝ ද මෘදුවචන ඇත්තෝ ද වව්.

8. දූසියගෙන් උපන් නන්දකදූසතෙමේ යම්තැනක සිටි යේ පරුෂවචන බෙණේ ද එහි රන්රුස ද රන්මාලා ද ඇතැයි ගිම.

9. යම්සේ පහවූ කිලුටුඇති ශුඩවූ වස්ත්‍රය මනාකොට ම රැඳීම (සායම) පිළිගනීද එමෙන්ම ඒ අසුනාරදකසක් ප්‍රාණීන්ට ඒ අස්නෙහිදීම කෙලෙස්රජස්රහිතවූ කෙලෙස් කිලුටුනැති ධර්ම ඥනය පහළවිය.

10. භවත් චොරඝාතකයෙනි, යම්තාක් මම ඔවුන්ට (මා) දක්වා එන්නෙම් ද එතාක් බලාපොරොත්තුවෙත්වා.

### 39 වෙනි අඩකය හා සම්බන්ධයි:

(1.) සථවිරතෙමේ මූලසිරිඝිටුහු කැඳවිය; ඉක්බිති මහා ජනයා රැස්විය.

(2.) වෙනි වාක්‍යයේ අර්ථ 26 වෙනි අඩකය යට දක්වනලදී.

(3.) භවත් ආනන්දතෙමේ බොහෝකලක් ඒ භවත් ගෞතම යන්ගේ උපස්ථායක විය, අතැවැසි සමගහැසිරෙන්නෙක් විය; (එබැවින්) "භවත් ගෞතමතෙමේ යම් ධර්මකෙනෙකුන්ගේ වර්ණනාව කියන්නෙක් වීද, යම් ධර්මයෙක්හි මේ ජනසමූහයා සමාදන කරවීද, වාසයකරවීද, පිහිටුවීද" යන මේ කාරණය භවත් ආනන්දතෙමේ දන්නේය.

(4.) ඉදින් ඔහුගේ ගෙදෙරට යන්නෙම් නම් ඔහුගේ භාර්යාතොමෝ මා දකින්ට නොහැකිවන්නීය; යම්තාක් (ඕතොමෝ) ඔහුට බත්ගෙන මගට බසින්නීද ඒතාක් මෙහිම වන්නෙමි.

41 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

ඕතොමෝ ඔවුන්ගේ කථාව අසා "ලජ්ජා නැති මොවුහු මා හා අභිරමනයකොට දූත් මා මරන්ට කැමතිවෙති, මොවුන්ට කටයුතුදේ දන්නෙමි"යි (සිතා) ඔවුන් විසින් මරනුලබන්නී "මම යකින්නක්වී යම්සේ මොවුහු මා මරත්ද එසේම (මම) මොවුන් මරන්ට සමර්ථවෙම්වා"යි ප්‍රාර්ථනයක් කෙළේය.

42 වෙනි අධ්‍යාය හා සම්බන්ධයි:

(1) කාලප්‍රතිබද්ධආඛ්‍යානවිස්තාර:

A. මහණෙනි, තථාගතතෙමේ දූත් පමණක් ලොකයාට වැඩපිණිස හැසිරෙන්නේ නොවේ, පෙරදීත් හැසුරුණේමය.

B. අජාසත්කුමාරතෙමේ දෙව්දත්හට ගයාශීර්ෂයෙහි විහාරයක් කරවා දවසක් පාසා ථාලිපාක (දන්අඹුක්කු) පන්සියයක් එළවිය.

C. යම්තාක් පාපය නොපැසේද ඒතාක් පව්කාරයා යහපත දකී, යම්කලක පාපය විපාකදේ නම් එකල්හි පාපියා අයහපත දකී.

D. ආනන්දය, අදරැ පැදුම්යම කුසිනාරාව අසල මල්ල යන්ගේ උපවත්තනසල්වෙනෙහි යුග්මශාලවෘක්ෂයන් අතරෙ හිදී තථාගතයන්වහන්සේගේ පිරිනිවීම වන්නේය.

(අ.) සර්වඥයන්වහන්සේ පළමු ගමනින් කපිලපුරයට වැඩ බාලසොහොයුරු නන්දකුමරු පැවිදිකරවා කපිලපුරයෙන් නික්ම පිළිවෙළින් සැවැතට ගොස් වැඩවසනකල්හි ආයුෂ්මත්

නන්ද තෙමේ (ශාසනයෙහි) නොඇලුණේ පඬුවන්පැහැඇත්තේ නහර ඉල්පුණු සිරුරැ ඇත්තේවිය.

(ආ.) මෙසේ බොධිසත්ව තෙමේ කුඩා මැස්සකු බොන පමණක් ලේ නොසොල්වා, සත්රජුන් පලවා හැර, බාලසොහොයුරා බලා, අභිඥාවන් ද සමාපත්තීන් ද උපදවා දිවිකෙළවර බඹලෝගතවිය.

## (2) ස්ථානප්‍රතිබද්ධආඛ්‍යාතවිස්තාර:

B. ඉක්බිති වනාහි මගධාධිපතිවූ වෛදෙහියගේ පුත්‍රවූ ආජාතසත්තුරජතෙමේ උල්කාවන් (පත්දම්) දරණකල්හි රජ ගෙහෙවින් නික්ම ගියේය.

C ගමක හෝ වේවා, වනයක හෝ වේවා, පහත්බිම් පෙදෙසක හෝ වේවා, උස්බිම්පෙදෙසක හෝ වේවා, යම් තැනෙක්හි රහත්හු වෙසෙත්ද එය රම්‍යවූ භූමියයි.

D. යම් යම් කලෙක්හි යම් යම් තැනෙක්හි ආජානීයඅශ්වයා වෙගය උපදවාද එතැන්හි සාමාන්‍යඅශ්වයෝ (වෙගයෙන්) පිරිහෙත්.

## (3) ආකාරප්‍රතිබද්ධආඛ්‍යාතවිස්තාර:

A. එසේ කියන්නාවූ ඒ මට සභිඥතෙමේ මෙසේ කිය: "ගෞතමිය, තී යම්සේ වඳින්නෙහිද බුදුවරයෝ එසේ වැන්ද යුත්තෝ නොවෙති"යි.

සභිඥයන් වහන්ස, (එසේනම්) දැන් තථාගතයෝ කෙසේ වැන්ද යුත්තාහුද? බුදුවරයෝ කෙසේ නොවැන්දයුත්තාහුද? අසනලද්දේ එය මට කිවමැනව.

B. රන්කරුවා රිදීයෙහි මලය ටිකෙන්ටික වරින්වර දුරු කරන්නාසේ පණ්ඩිතතෙමේ පිළිවෙළින් තමාගේ මලය දුරු කරන්නේය.

C. දන් නියම්කළ පුරුෂයාද පත්‍රයෙහි ලියූ පිළිවෙළින්ම ඔවුනොවුන්ගේ ගෙවලට භික්ෂූන් යැවීය.

E. සැවැත්නුවර එක් උපාසකයෙක් දැහැමින් සෙමෙන් සිහිගෙයි වෙසේලු.

F. මේ සත්වයෝ නම් බොහෝසේ භවාශ්‍රිතවූවාහු භවයන් හිම ඇලී වෙසෙත්.

### (4) හේතුප්‍රතිබද්ධ අධ්‍යාහාරවිස්තර:

B. එසේවූකල්හිත් "මා පෙර කිසිවක් නුදුන්බැවින් කිසිවක් නොලබමි"යි නොදන්නෙහිද?"

(ආ) A, තමා පිණිස හෝ අනුන් පිණිස හෝ පුත්‍රයකු කැමති නොවන්නේය, ධනය (කැමතිනොවන්නේය), රටද (කැමතිනොවන්නේය.)

(ආ) B, භවත් කූටදන්තතෙමේ ශ්‍රමණගෞතමයන් දකිමට එළඹීමට සුදුසුනොවේ; ශ්‍රමණගෞතමතෙමේම භවත් කූටදන්තයන් දකිමසඳහා එළඹීමට සුදුසුවේ.

(ආ) C. මහණෙනි, බොහෝ ජනයාට හිතපිණිස බොහෝ දෙනට සැපපිණිස ලෝකයට අනුකම්පාපිණිස දෙවිමිනිසුන්ට වැඩ හිතසැපපිණිස චාරිකාවෙහි හැසිරෙව්.

D. පින්වත්හු කුමක් පිණිස ආවාහුද? භික්ෂූන්ට නිමන්ත්‍රණයක් කරන්මද?

E. යම්කෙනෙකුන් පිණිස මම ගිහිගෙයි වසන්නෙම්ද ඒ දෙදෙනම පැවිදිවූහ.

F. ලෝකයෙහි අග්‍රවූ සුන්දරස්ථානයට පැමිණි භූපතිතෙමේ වාතරෝගයෙන් රෝගීය; ඉදින් උණුපැන් තිබේ නම් උන්වහන්සේ සඳහා ගෙනයන්ට කැමැත්තෙමි.

### 45 වෙනි අභ්‍යාසය හා සම්බන්ධයි.

ඉක්බිති ඔහුගේ අඥතවූ භාර්‍යාතොමෝ මෙවැනි පෙළහැරෙහි ප්‍රසාද නොඋපදවා ඔහුට පරුෂවචනකියා තර්ජනවචනකියා චණ්ඩවූ රජවරු එනාහි වරක් කිපියාහු අත්පාසිඳීම් ආදියෙන් බොහෝත් අනර්ථ කෙරෙත්"යයි (කියා) දරුවන් ගෙන රජගෙට ගොස් රජ්ජුවිසින් කැඳවා මේ කුමක්දැයි අසනලද්දී මෙසේ කීය: "මේ මාගේ ස්වාමිතෙමේ ඔබවහන්සේට උපස්ථානකරන මල් වලින් සර්වඥයන්වහන්සේ පුදා හිස් අත් ඇතිව ගෙට අවුත් "මල් කොහිදැ"යි විචාරනලද්දේ මෙය කියයි. මාවිසින් ඔහු ගරහලද බව දනුමැනවි.

### 14 වෙනි අභ්‍යාසය හා සම්බන්ධයි.

1. පූර්ණතෙමේ තෙරුන් දකම සිතැම නවතා පසඟ පිහිටුවීමෙන් තෙරුන් වැඳ දුහැටි කැපකොට දුන්නේය.

2. යම්කෙනෙක් පරතීරගාමීහු වෙත්ද ඔවුහු මිනිසුන් අතුරෙහි දුර්ලභවෙති; අවශෙෂ සත්වසමූහයා වනාහි මෙතෙරම අනුව දුවයි,

3. උඩගුනොවූ චපලනොවූ වීර්‍ය්‍යවත්වූ සංවරකළ ඉඳුරන් ඇති (භික්ෂුතෙමේ) පර්වතගුහාවෙක්හි සිංහයකු මෙන් හොබී.

4. මනුෂ්‍යයන් අතුරෙහි යම්කිසිවෙක් අන්‍යයන්ගේ ප්‍රාණ සත්ව හිංසාකෙරේද ඒ මනුෂ්‍යතෙමේ මෙලොවින් ද පරලොවින් ද යන දෙකෙන්ම පිරිහේ.

5. ඕතොමෝ වෙද අවුත් "සොඳුර කෙබඳුදැ"යි අසනලද්දී "පෙර මගේ ඇස් ටිකක් රිදුණාහ, දැන් අතිශයෙන් රිදෙත්" යයි කීය.

6. ඉදින් අඥානතෙමේ ජීවිතාන්තය දක්වාත් පණ්ඩිතයකු සෙවනයකෙරේද සැන්ද ව්‍යඤ්ජනරසය නොදන්නාසේ හෙතෙම ධර්මය නොදනී.

7. ඉක්බිති සිහමතෙහි හැසිර ජීවත්වන්ට සමර්ථකලැ කබලක් අතේ තබා "දරුව, අපි තා නිසා මහත් දුකකට පැමිණියෙමු, දැන් තා පොෂණය කරන්ට නොහැක්කෙමු. මේ නුවර දුගී-මගී ආදීන්ට පිළියෙළකළ බත් ඇති, එහි භික්ෂාව පිණිස හැසිර ජීවත්වෙව"යි ඔහුට කියා ඔහු හැරියේය.

8. සර්වඥතෙමේ මූලසිරිසිටුහු අමතා "මොහු අඳුනන්නෙහිදැ"යි අසා "නොදනිමි"යි කීකල්හි "තාගේ පියවූ ආනන්දසිටුතෙමේ"යයි කියා (එය) නොඅදහන්නහුට "ආනන්දසිටාණෙනි, තාගේ පුත්‍රයාට පස්මහනිදන් කියව"යි (නිදන්) කියවා ඇදහැවිය. හෙතෙම සර්වඥයන්වහන්සේ සරණකොට ගියේය.

9. යම්සේ සිදුරු රහිතවූ ගල්පර්වතය වාතයෙන් නොසෙල්වේ ද එමෙන් නුවණැත්තෝ නින්දා ප්‍රශංසාවන්හි නොසැලෙත්.

10. එකල්හි බරණැස්වැස්සෝ දෙවතාවන්ගෙන් අභිවෘද්ධිය පතන්නෝ වෙත්, දෙවියන් නමදිත්; බොහෝ එළු-තිරෙළු-කුකුල්-හුරු ආදීන් මරා නන්වැදෑරුම් මල්පුවදින් ද මස් ලෙයෙන් ද බිලියම් කරත්.

### පරිවර්ත්තපරිචය හා සම්බන්ධයි:

3. පෙර ප්‍රථමකල්පික (මනුෂ්‍ය) යෝ රැස්ව එක්පරු විශිෂ්ටරූපවත් සෞභාග්‍යයෙන් අගතැන්පත් ආයුෂසම්පන්න පුරුෂයකු (තෝරා) නෙත රජකළහ. සිවුපාමෝ ද රැස්ව එක්

සිංහයකු රජකළහ. මහමුහුදු මත්ස්‍යයෝ ආනන්ද නම් මසකු රජකළහ. ඉක්බිති පක්ෂිසමූහයෝ හිමවත්පෙදෙසෙහි රැස්ව ''මිනිසුන් අතරෙහි රජෙක් විද්‍යමානවේ, සිවුපාවුන් අතරෙහිත් මසුන් අතරෙහිත් එසේමය. අපටත් රජකු ලබන්ට වටී, රජ තනතුරෙහි තැබියයුතු එකකු දනිව්''යයි ඔවුහු එවැනි පක්ෂියකු බලන්නාහු එක් බකමූණකුට කැමතිවී "මේතෙම අපට රුචි වේ"යයි කීහ. ඉක්බිති එක් පක්ෂියෙක් සියලුදෙනාගේ අදහස (=කැමැත්ත) ගැන්ම සඳහා තුන්වරක් ඇස්විය; ඔහුගේ තෙවෙනි ඇස්වීමේදී එක් කවුඩෙක් නැගිට "පිතාන් තවතුව, මේ රාජාභිෂේකකාලයෙහි මොහුගේ මූණ මෙබඳුය, කිපුණුහුගේ මූහුණ කෙබඳු වන්නේද? කිපුණු මොහු විසින් බලනුලබන අපි රත් කබලෙහි දැමූ තල මෙන් එතැන එතැනම පුපුරන්නෙමු. මොහු රජකරන්ට මට රුචිනොවේ''යයි කීය.

4. සම්බුදුයන්වහන්සේ නෑයන් අමතා, මහරජවරුනි, තෙපි නෑයෝය, නෑයන් නම් සමගිවූවන් සතුටුවූවන් වියයුතුය, නෑයන්ගේ සමගිය ඇතිකල සතුරෝ අවකාශ නොලබති; මිනිසුන්ගේ තබා සිතිවිලිනැති වෘක්ෂයන්ගේත් සමගියක් ලබන්ට වටී: අතීතයෙහි වනාහි හිමවත්පෙදෙස සල්වනයකට මහාවාතයක් වැදුණේය, ඒ සල්වනය ගස්-පැල-පඳුරු-වැලින් එකිනෙක සම්බන්ධව සිටිබැවින් එක්ගසකුදු හෙළන්ට නොහැකිවූයේ (ගස්වල) මුදුනෙන් මුදුනෙන් ගියේය. හිස් බිම් පෙදෙසක පිහිටි කුඹාඅතු මහඅතුවලින් යුත් එක්මහරුකක් අන් ගස් හා සම්බන්ධනැතිබැවින් මුලිනුදුරා බිම හෙළීය. මේ කරුණෙන් තොපත් සමගිව සතුටුවෙමින් විසියයුතුය.

"තිඨන්තු තාව මනුස්සභූතා" යන්න වචන අනුවගොස් "මිනිස්සු සිටිත්වා"යි සිංහලට නැගුවහොත් එහි යථාර්ථය හෙළි නොවේ. එබැවින් මෙවැනි තැන්හි පාලිවිභක්ති අනුව නොගොස් ස්වභාෂාව්‍යවහාරයට ගැළපෙනසේ පරිවර්තනයකිරීම ශිෂ්‍යයන් විසින් විශේෂයෙන් සිත තබාගතයුත්තකි.

"තුම්හෙහි සමග්ගෙහි සම්මොදමානෙහි වසිතුං වට්ටති" යන්නත් සිංහලට ගැළපෙනසේ "තොපත් සමගිව සතුටුවෙමින් විසියයුතුය"යි නගානිබෙන අයුරු බැලියයුතු.

5. ජනපදයෙහි (පිටිසර) වසන එක් කුලපුත්‍රයෙක් සැවැත් නුවර එක් කුලදුවක් තමාගේ පුතුට පවරා (=ආවාහකොට දීමට පොරොන්දු ලබාගෙන) 'අසවල් නම් දවසෙහි ගෙනයන්නෙමි'යි දවසක් තබා එදවස පැමිණිවිට තමාගේ ගෙට එළඹෙන ආජීවක

යකුගෙන් "ස්වාමීනි, අපි අද එක් මඞ්ගලයක් කරන්නෙමු, නැකත හොබනේදැ"යි ඇසීය. හෙතෙම "මේතෙමේ පළමු වෙන් මා නොවිචාරා දූත් අසන්නේය"යි කිපී "අද නැකත නොහොබනේය, අද මගුල් නොකරව්, ඉදින් කරන්නාහු නම් මහත් විනාශයක් වන්නේයයි කීය. ඒ ගෙයි මිනිස්සු ඔහුගේ (කීම) අදහා එදවස නොගියාහ. නුවරවැස්සෝ මගුල සම්බන්ධ සියලු වැඩ කොට ඔවුන් නොඑනබව දැන කලමගුලෙන් ම දුවණි යන් අනෙකෙකුට දුන්හ. අනිකෝ (පිරිසරයෝ) පසුදා අවුත් "අපට දැරිය දෙව්" යයි කීහ. ඉක්බිති සැවැත්වැසියෝ "දනව් වැසි ගෙහිමියෝ වූ තොපි පව්ටු මිනිස්සුය, දවස නියම කොට (නැවත) නොසලකා හැර නාහ; ආ මගින්ම හැරී පලයව්, අප විසින් දැරිය අනෙකෙකුට දෙනලද්දීය"යි ඔවුන්ට පරිභව කළහ. ඔවුහු ඔවුන් හා කලහ කොට ආ මගින්ම ගියහ.

6. තිසස (සඬාතිසස?) මහරජතුමා දවස්පතා සෑගිරියෙහි භික්ෂුසංඝයාට දන් දෙන්නේ "මහරජ, කුමක්හෙයින් එක් තැනක්ම සේවනය කෙරෙහිද, අන්තැනෙක්හි දන් දෙන්ට නොවටීදැ"යි රටවැසියන් විසින් කියනලද්දේ දෙවෙනි දවස්හි අනුරාධපුරයෙහි මහදන් දෙවීය. එක් භික්ෂුනමක්වත් පිළිගැන් මෙහි පමණ නොදත්තේය. එක් එක්නම පිළිගත් ඛාද්‍ය-භොද්‍ය යන් දෙතුන්දෙනෙක් ඉස්සූහ. රජතුමා දෙවෙනිදා සෑගිරියෙහි භික්ෂුසංඝයාට ආරාධනා කරවා ඇතුල්රජගෙට පැමිණිකල්හි "පාත්‍ර දුනමැනවැ"යි කීය "මහරජ, ඕනෑනැත; තමාගේ ප්‍රමාණයෙන් භික්ෂාව ගන්නාහ"යි (කියා) එක් භික්ෂුනමක්වත් පාත්‍රය නොදුන්නේය. සියලුදෙනාවහන්සේ ප්‍රමාණයෙන් යුත් භොජනයම ගත්හ. ඉක්බිති රජතුමා 'බලව්, තොපගේ භික්ෂූන් අතරෙහි එක් නමක්වත් පමණ නොදනී, ඊයේ කිසිවක් ඉතිරි නොවීය; අද ගත් දේ ස්වල්පය, ඉතිරි දේ බොහෝය"යි (කියා) ඔවුන්ගේ පමණ දැන්මෙහි තුටුසිතැත්තේ අවශේෂයන්ගේ පමණ නොදැන්මෙහි නොසතුටු සිතැත්තේ විය.

7. පිංමෙහරජ (=වළගම්බා රජ) තුමා රාජ්‍යයට පැමිණියේය; මුහුදට එතරින් ආ භික්ෂූහු "වත්තබ්බකනිග්‍රෝධස්ථවිරතුමා කොහේද? වත්තබ්බකනිග්‍රෝධස්ථවිරතුමා කොහේදැ"යි අසා උන්වහන්සේ සමීපයට ගියහ. මහාභික්ෂුසමූහයක් තෙරුන් පිරිවැරීය. හෙතෙම මහභික්ෂුසඟවිසින් පිරිවරනලද්දේ ක්‍රමයෙන් මහාවිහාරයට පැමිණ මහාබෝධිය ද මහසෑය ද ථූපාරාම චෛත්‍යයද වැඳ නුවරට ඇතුල්වීය. දකුණු දොරටුව දක්වා යන කල්හිම නවතැනකදී තුන්සිවුරු උපන්නේය. ඇතුළු

නුවරට පිවිසිතැන් පටන් මහත් සත්කාරය උපන්නේය. මෙසේ විපත්තිකාලයේදී තල්ගෙඩි-අල-මුල්-කොළත් දුර්ලභ විය, සම්පත් කාලයේදී මෙවැනි මහාලාභය උපන්නේය.

8. **කූටකණ්ණරජතුමා** "ගිරිගම් කොණ" වැසි **චූලසුධම්ම** තෙරුන්ට මමත්වය කරයි, හෙතෙම උපුල්වැව වසන්නේ තෙරුන් කැඳවීය. තෙරුන්වහන්සේ අවුත් මාලාරාම විහාරයෙහි වසත්. රජ තෙරුන්ගේ මවගෙන් "ස්ථවිරතුමා කුමක් ප්‍රියකෙරේද"යි ඇසීය. "මහරජ, අල"යයි (ඈ කීය.) රජ අල (තම්බා) ගෙන්වා ගෙන විහාරයට ගොස් තෙරුන්වහන්සේට දෙන්නේ මුහුණ බලන්ට අසමර්ථවීය. හෙතෙම නික්ම පිරිවෙණෙන් පිටදී "තෙරුන්වහන්සේ කෙබඳුද"යි බිසවගෙන් ඇසීය. "ඔබතුමා පුරුෂයෙක් වී උඹ බලන්ට අසමර්ථවූයේය, (ස්ත්‍රියක්වූ) මම කෙසේ සමර්ථවන්නෙම්ද"යි (බිසව) කීය. රජතුමා 'මගේ රටෙහි බඳුගෙවන ගෘහපතියකුගේ පුත්‍රයකු මුණ ඔසවා බලන්ට අසමර්ථවෙමි, බුද්ධශාසනය වනාහි ඒකාන්තයෙන් උත්තමය"යි (කියා) අත්තල ගැසීය.

9. බමුණුතිස් සොරු මළකල පිතෘමහාරජතෙමේ ඡත්‍ර නැංවිය. "බිය සංසිඳුණේය, රට සමෘද්ධය"යි අසා භික්ෂුගණයා පරතෙරින් නැව් නැගී මාතොටපටුනෙහි බැස "මහාසොණ ස්ථවිර කොහි වෙසේද"යි අසා තෙරුන් සමීපයට ගියේය. තෙරුන්වහන්සේ පන්සියයක් භික්ෂූන් පිරිවරකොට ඇත්තානුකාලකගම මණ්ඩලාරාම (වට්ටාරම) විහාරයට පැමිණියහ.

වත්තබ්බකනිග්‍රොධතෙරුන් සාමණේරකලැ බමුණුතිස් බිය පහළවිය. සාමණේරතුමා ද ඔහුගේ උපාධ්‍යායස්ථවිරතුමා ද මුදින් එතර නොගියාහ. "කොළ කන මිනිසුන් ආශ්‍රයකොට වසන්නෙමු"යි පිටිසරට අභිමුඛවූහ. සාමණේරතෙමේ සතියක් පමණ නිරාහාර වැ එක් ගම්පෙදෙසක තල්ගසක ඉදුණු තල් ගෙඩි දැක "ස්වාමීනි, ටිකක් නැවතුනමැනව, තල්ගෙඩි හෙළමි"යි උපාධ්‍යායයන්ට කීය. "සාමණේරය, තෝ දුර්වලවෙහි, නොනගුව"යි. "ස්වාමීනි, නගින්නෙම්මය"යි (කියා) කුඩා පිහියක් ගෙන තල්ගසට නැඟ තල්වල්ල කපන්ට පටන්ගත්තේය. පිහියා තලය ගැලවී බිම වැටුණේය. "මෙතෙමේ වෙහෙසෙමින් ම ගසට නැගුණේය, දැන් කුමක්නම් කරන්නේද"යි ස්ථවිරතුමා සිතී. සාමණේරතුමා තල්කොළ ඉර ඉරා පිහියාමිටේ බැඳ ගැට ගස ගසා බිමට බා "ස්වාමීනි, පිහියාතලය මෙහි ඔබනසේක්නම් යෙහෙකැ"යි කීය. ස්ථවිරතුමා "සාමණේරයා උපාය දන්නෙ

නැ"යි (සිතමින්) පිහියාවලය ඇතුල්කොට දුනී. හෙතෙම පිහිය ඔසවා තල්ගෙඩි හෙළීය. යම්තාක්කල් තල්ගෙඩි විද්‍යමාන වූවහු ද ඒතාක් එහි වැස ගෙඩි අවසන්වූ පසු පිළිවෙළින් (ගොස්) කොළ කන මිනිසුන් වසනතැනක හැරදමූ එක් විහාරයකට ඇතුල්වූහ.

6. බ්‍රාහමණතිස්සසොරු රට වැනසීය. සංඝතෙමේ සියලු දෙසින් නාගදීපයට ගොස් දඹකොළපටුනෙහි තෙමහල් මහ පහුරක් බැන්දවීය. (පහුරේ) එක් තට්ටුවක් ජලයෙහි හැලුණේය, එකක භික්ෂුසමූහයා උන්නේය, එකක පාත්‍ර සිවුරු තැබූහ. සංයුත්තභාණක චූලසීව ස්ථවිරය - ඉසිදත්තස්ථවිරය - මහාසොණස්ථවිරය යි තෙරතුන්නමක් ඒ පිරිස්වලට අධිපති වූහ. ඒ තුන්නම අතුරෙන් තෙරදෙනමක් මහාසොණතෙරුන්ට "ඇවත, මහාසොණ, පහුරට නැගෙව"යි කීහ. "ස්වාමිනි, ඔබ වහන්සේලා (කුමක් කරන්ට ද)?" "ඇවත, ජලයේදී මියයාමත් ගොඩදී මියයාමත් මෙපමණක්මය (=එකසැරිමය), අපි නොයන්නෙමු; තා නිසා වනාහි අනාගතයෙහි ශාසනයාගේ පරම්පරාව පවතින්නේය, ඇවත තෝ යව"යි. "ස්වාමිනි, ඔබවහන්සේලා නොයනකල්හි මමත් නොයන්නෙමි"යි. තුන්වර දක්වා කියාත් තෙරුන් නංවන්ට නොහැක්කාහු නැවතුණාහ.

ඒ කාලයෙහි මහාවිහාරය හිස් විය, මහසැමළුවෙහි එරඬු ගස් පැළවූහ; චෛත්‍යය පැලෑටියෙන් ගැවසුණේ සෙවෙලෙන් වැසුණේ විය. ස්ථවිරතුමා ජීවමාන බුදුන්ට ගෞරව දක්වන්නාසේ මහසැය වැඳ බටහිරදෙස ශාලාවට පිවිස බලමින් "මෙවැනි අග්‍රලාභයටත් අග්‍රකීර්තියටත් පැමිණි බුදුරදුන්ගේ ශරීරධාතු නිදන්කළතැන අසරණවිය"යි සිතමින් හුන්නේය.

ඉසිදත්තස්ථවිරතුමා ද පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙන්නේ අළුදනව්වට පැමිණියේය, එහි මිනිස්සු ඉතා තොඉඳුණු මීගෙඩි පලා ඇට ගෙන පොතු දමා ගියහ. ස්ථවිරතුමා "ඇවත, මහාසොණ, භික්ෂාහාරයක් පෙනේ"යයි කියා පාසිවුරු ගෙන්වා ගෙන සිවුර පොරවා පාත්‍රය පිටතට ගෙන සිටියේය. කුඩා දරුවෝ වැඩසිටි තෙරුන් දැක "මෙයින් කිසි ප්‍රයොජනයක් ඇතැ"යි (සිතා) වැලි පිසදමා මීගෙඩිපොතු පාත්‍රයෙහි දමා දුන්හ. තෙරවරු අනුභවකළහ. සත්දිනක් පමණ එයම ආහාරය විය.

## ලෙඛණසම්පාදනය පිළිබඳයි:

### 1. වෙනි ලිපිය:

භවත්හි,

ඉදින් යුෂ්මතුන් විසින් අවුරුදු කීපයකට පෙර මුද්‍රාපිතවූ **සූත්‍රනිපාත**පාලිය අද දක්වාත් විකුණනුලැබේ නම් මට එයින් එක් පොතක් මෙහෙ තැපැල් කන්තෝරුවෙන් මුදල්දී ගැනීමට එවනුමැනවි.

ඉදින් ඒ පොත් අවසන්නම් ඒබව මට දන්වනු යෙහෙකි. ලඟදී මුද්‍රණයකරවූ "පෙතවත්ථු-විමානවත්ථු-ථෙරගාථා-ථෙරීගාථා"වන්ගේ විකුණනමිල කොතෙක්ද" යි දැනගන්ට කැමැත්තෙමි.

---

### 2. වෙනි ලිපිය:

කොළඹ මණ්ඩලාරාමයෙහි වසන පියනන්දභික්ෂු විසින් ගෞරව බුහුමන් පෙරටුකොට පා වැඳ මෙය එවනු ලැබේ.

ස්වාමීනි,

ඔබවහන්සේ විසින් කීපදිනකට පෙර මට එවූ ලියුම ලදිමි. එහි ඇතුල්කොට තිබුණු ඉතිරි ලිපිය පිරිවෙණේ ආචාර්‍ය්‍යයන්වහන්සේට දුනිමි.

දැන් මේ පිරිවෙණෙහි අසූවක් පමණ ශිෂ්‍යයෝ උගනිත්. අලුත් ශාලාවත් නිමාවට පැමිණියාය. එය ගෙවදින මහෝත්සවය ලබන මාසයේදී ගම්භීරාකාරයෙන් පවත්වනු ලැබේ. ස්වාමීන්වහන්සේත් ඒ සඳහා මෙහි පැමිණෙන්නාහයි සිතිමි.

ලබන වර්ෂයෙහි ඉගනීම පිණිස මාවිසින් බොහෝ පොත් මිලදී ගතයුතු වෙති, ඒවා සඳහා මුදල් ද ලැබියයුතුය; ඒ කාරණය මාගේ මවුපියන්ට ද සොහොයුරන්ට ද කියනු මැනවි, මා නිරෝගිබවද ඔවුන්ට දන්වනු මැනවි.

ස්වාමීන්වහන්සේගේත් ආරාමවැසි ඉතිරි සියලුදෙනාගේත් සැපදුක් හා අන් පවත් දැනගන්ට කැමැත්තෙමි.

ස්වාමීන්වහන්සේගේ කීකරු ශිෂ්‍ය,

..............................

---

3. වෙනි ලිපිය:

සෙත්වේවා.

පින්වතා එවූ ලියුම මාවිසින් ලද්දේය. පරිවෙණාධිපති මහාස්ථවිරයන් විසින් ද මාවෙත ලියුමක් එවනලදී.

පවිටු මිතුරන් හා එක්ව නුවර තැන තැන හැසිරීම නොකොට මහාසේ ඇහුම්කන් දෙන්නාහු විසින් ධර්මවිනය ඉගනියයුතුය යන අපගේ නිත්‍ය අවවාදය භවතා විසින් පිළිපැදියයුතුය. මෙතාක් මාවිසින් භවතාගේ එවැනි නුසුදුසුතැන හැසිරීමක් නොඇසනලදී, යම්කලක මම එවැනි දෙයක් අසම් ද එකල්හි මම වහාම ඉගනීම නවත්වා නා ස්වකීයාරාමයට අණවමි (=එන්ට නියම කරමි.)

යුෂ්මතා යම් පොත් මිලට ගන්ට කැමත්තේ නම් ඒවා මෙහි ආකල මෙහිදී ම ලබන්නෙහි.

මම ද ඉතිරි ආරාම්වැසියෝ ද සුවපත්ව වසමු. යුෂ්මතාත් එසේම යයි අදහසයි. මෙහි දැන් නිතර වැසි වසී. වෙන දැන් ලියයුත්තක් නැත.

---

4 වෙනි ලිපිය:

මේ ලිපිය බක්මස පුරදෛලොස්වක් ලත් රිවිදින බුද්ධදත්තස්ථවිරයන් විසින් ඔබලිව්. ගයිගර් පඬිතුමාට ලොකාර්නෝ නුවරින් යවනුලැබේ:

උදාරාධ්‍යාශය ඇති පින්වතා දිනේවා!

මම වනාහි "ආර්. ලන්ගේ" නමැති ගෘහපතියකුගේ ආරාධනය නිසා පසුගිය මාසයේදී මෙහි පැමිණි සිංහලභික්ෂුනමකි. දැන් එක් කැපකරුවකු සමග ඔහු වෙත වසමි. මේ ගෘහපති තෙමේ මගෙන් පාලිභාෂාවත් බුද්ධධර්මයත් ඉගෙනගන්ට කැමතිවේ.

පාලිපොත් මුද්‍රාපකසමිතිය (එංගලන්තයේ) මගින් භවත් මහාත්මාගේ නම මාවිසින් බොහෝකලක සිට දන්නාලදී. භවතා විසින් අපේ "මහාවංශය" ශුද්ධකිරීමෙන් හා (අන්‍ය භාෂාවකට) පරිවර්තනය කිරීමෙන් සිංහලයන්ට කළ උදාරසංග්‍රහයත් මාවිසින් දන්නාලද්දේමය.

මාවිසින් ද පාලිපොත්සමිතිය උදෙසා "සම්මොහවිනොදනී-විනයවිනිච්ඡයා"දි පොත් ශුද්ධකරනලදබැවින් භවතා මාගේ නමත් දන්නේයයි හඟිමි.

මේ ලිපිය සමඟ මාවිසින් සම්පාදිත වූ පොත් දෙකක් භවතාට තුටුපඬුරු වශයෙන් එවමි. ඒ පොත් පින්වතාට උපකාර නොඑළෙවත්, නමුත් පින්වතා හා මිත්‍රභාවය පතමින් මේවා එවමි.

පිළිතුරු හසුන ඉංග්‍රීසිභාෂාවෙන් හෝ පාලිභාෂාවෙන් හෝ එවියයුතු.

පින්වතාගේ විශ්වාසිකවූ

..................................

ලියුම් මෙසේ එවියයුත්තාහ :—

..................................

..................................

## 6. වෙනිලිපිය:

මේ හසුන්පත "විලියම් ගෛගර්" නම් පණ්ඩිතයා විසින් ආයුෂ්මත් බුද්ධදත්තස්ථවිරයන්වහන්සේ වෙත එවනලැබේ:

"සම්මොහවිනොදනී – විනයවිනිච්ඡය – උත්තරවිනිච්ඡයා"දි පොත් ශුද්ධකළබැවින් ඔබවහන්සේගේ නාමය බොහෝකලක පටන් මට ප්‍රකට එකක් විය. එබැවින් ආයුෂ්මතුන්වහන්සේ වෙතින් පාලිභාෂාවෙන් ගැලපූ ලියුමක් ලැබ අතිශයින් සතුටූ වීමි. ඒ තුෂ්ටිය දක්වනු කැමති මම ද මේ පිළිතුරු ලියුම පාලි භාෂාවෙන් එවමි. පුරුද්දක් නැතිබැවින් මා කරන දෙෂයන් ගැන පින්වතුන්වහන්සේ සමාවෙත්වා. බටහිරදෙස වැසි පණ්ඩිතයෝ පාලිභාෂාව හුදෙක් පොත්වලින් උගනිති, දිනපතා කථාබස් කිරීමෙන් ඉගෙන නොගනිති.

ආයුෂ්මතුන් වහන්සේ විසින් ලිපිය සමඟ යම්පොත් දෙකක් මට එවනලද්දේ ද එයත් මම ප්‍රියවූ ද මනාපවූ ද පඬුරක් කොට දරමි. (=සිත තබාගනිමි.) ඒ පොත් පාලිභාෂාව ඉගෙනගනු කැමති බොහෝ ශිෂ්‍යයන්ට එකාන්තයෙන් බොහෝ උපකාර එළවන්නාහු වෙති.

1926 වෙනි වර්ෂයෙහි මා සිවුමසක් ලක්දිවැ විසූබව ආයුෂ්මතුන්වහන්සේ දනිත්යයි සිතමි; ඒකාලයේදී මම සවාමීන්වහන්සේ නුදුටුවෙමි, අපි සතුටුවියයුතු සිහිකටයුතු කථා නොකෙළෙමු. එය අනාගතකාලයෙහි වන්නේයයි ප්‍රාර්ථනාකරමි.

ආයුෂ්මතුන්වහන්සේ සුවපත්වූවෝ නිරෝගීවූවෝ වෙත්වා; යැපසෙත් වෙසෙත්වා.

**6 වෙනි ලිපිය:**

මේ ලිපිය ඩබ්ලිව්. ගෛගර් නමැති මහාප්‍රාඥයා වෙත යවන ලද්දකි.

සෙත්වේවා !

පශ්චිමදෙශීයවූ පණ්ඩිත භවතා විසින් සිංහල අකුරෙන් පාලිභාෂාවෙන් ලිවූ හසුන්පත දැක අතිශයෙන් විස්මිතයිතැත්තේ කියවා ප්‍රීතියෙන් පිරුණේ වීමි.

භවතා විසින් ඒ ලිපියෙහි "පුරුද්දක් නැතිවිට පාලියෙන් වාක්‍ය රචනාකිරීම අතිදුෂ්කරය"යි කීම ඇත්තක්මය. පින්වතා හැර පාලිහසුන් ලියන්ට සමර්ථයෝ පශ්චිමදෙශයෙහි සුලභ නොවෙතියි හඟිමි.

1926 වෙනි වර්ෂයෙහි භවත් මහාත්මා ලක්දිවට පැමිණිබව එදා දැන සිටියෙමි, නමුත් කරුණක් නැතිව පින්වතා දැකීමට උත්සාහ නොකෙළෙමි. ඉදින් එකල්හි පින්වතා බලපිටියේ ගුණසේකර මුදලිතුමාගේ වාසස්ථානයට පැමිණිබව මම දැන ගත්තෙම් නම් අපගේ හමුවීම පහසුවෙන්ට තිබුණේය. මගේ උපන්ගමත් ස්ථිරවාසස්ථානයත් ඊට අනතුරුව පිහිටි අම්බලංගොඩ නියම්ගමය; ගුණසේකර මැතිතුමාත් මාගේ විශ්වාසික මිත්‍රයන් අතුරෙන් කෙනෙකි.

මේ වනාහි පශ්චිමදෙශයට මාගේ පළමු පැමිණීමය; ඉදින් මම සමර්ථවන්නෙම් නම් ඉදිරියට පැමිණෙන ග්‍රීෂ්මසෘතුවේදී භවතුන්ගේ රට දැකීමටත් මහාප්‍රාඥවූ භවතා හමුවීමටත් පතමි.

පුත්‍රදාරවන් හා නිරෝගී නිදුක් වේවා.

# උපග්‍රන්ථය.

## භාෂාරීති.

ඒ ඒ භාෂාවන්හි අන්‍ය භාෂාවන් හා අසමානවූ ඇතැම් යෙදුම් විද්‍යමාන වෙති. ඒ විශේෂ යෙදුම් 'භාෂාරීති' නාමයෙන් හඳුන්වනු ලැබේ.

සිංහල අනුව යොදන්ට යාමෙන් පාලියෙහි වරදිනතැන් හා පාලියෙහි විශෙෂව පවත්නා යෙදුම් ද හැකිතරමක් මෙහි දක්වනු ලැබේ.

**1. ද්විතීයා–චතුර්ථීන් පිළිබඳවයි:**

සිංහලෙහි කර්මවිභක්තියෙහිත් සම්ප්‍රදානවිභක්තියෙහිත් 'ට' ප්‍රත්‍යය යෙදේ, නමුත් කර්මයෙහි ට–ප්‍රත්‍යය ගත්‍යර්ථධාත්වාදීන්ගේ යොගයේදී පමණකි. ඇතැම් ශිෂ්‍යයෝ "ගසට නගී; ගමට යයි; ඔහුට ගසයි; ගෙට දුවයි" යනාදි වාක්‍යයන්හි විද්‍යමානවන්නේ කිනම් විභක්තියක්දැයි නොදැන "රුක්ඛස්ස ආරුහති" "ගාමස්ස ගච්ඡති" යනාදී වශයෙන් පාලියට නගත්. එය යුතු නොවේ. මේ තැන්හි විද්‍යමානවන්නේ කර්මවිභක්තිය බැවින් ඒ වාක්‍යයන් "රුක්ඛං ආරුහති, ගාමං ගච්ඡති" ආදිවශයෙන් නැගියයුතු.

"යාචකයා ට ආහාර දේ" යන තැන සම්ප්‍රදානවිභක්තිබැවින් "යාචකස්ස භොජනං දෙති"යි පෙරළියයුතුයි. සම්ප්‍රදාන විභක්තිය යෙදෙන්නේ කිනම් කිනම් අර්ථයන්හිදැයි "පාලිභාෂාවතරණ iii පොතේ 38–40 පිටු බැලීමෙන් දතහැක. ගමනාර්ථ ධාතුයොගයෙහිදී චතුර්ථිය පාලියෙහි දුර්ලභව යෙදේ. "අප්පා සග්ගාය ගච්ඡති" (=ස්වල්පජනතාවක් ස්වර්ගයට යේ) යන ධම්මපද පාඨය උදාහරණයි.

**2. තෘතීයාව යෙදියයුතු තැනක්:**

"මේ විල රක්ෂසයකු විසින් අධිගෘහීතවූවක් වියයුතුය" යන වාක්‍යයෙහි 'විල" කුමන විභක්තියෙන් දැයි අප්‍රකටයි. එය තෘතීයාවෙන් යෙදේ. "රක්ඛසපරිග්ගහිතෙන ඉමිනා සරෙන භවිතබ්බං"යි දෙවධම්මජාතක අටුවායි.

**3. ෂෂ්ඨිය යෙදියයුතු තැනක්:**

"ඔහු එහි වසනබව සැමතැන ප්‍රකටවිය" යනතැන "තස්ස තත්ථ වසනභාවො සබ්බත්ථ පාකටො අහොසි"යි ('ඔහු' යන්න 'තස්ස'යි ෂෂ්ඨියෙන් යුක්තකොට) නැඟියයුතු "මය්හං විතානං

කොට්ඨාසානං යුත්තභාවං වා අයුත්තභාවං වා එසා රුක්ඛදෙවතා ජානාති" (=මම කොටස් දෙකක් දියයුතුබව හෝ නොදියයුතුබව අර රුක්දෙවියා දනී.) "එතෙසං ඛාදිතභාවං වා අඛාදිතභාවං වා ජානාථ" (=ඒවා කෑබව හෝ නොකෑබව දනුමැනව.) මේ වාක්‍යවලම කූටවාණිජජාතකයෙනි.

"ගොපාලකො දිවසස්ස ද්වෙ වාරෙ පච්චෙකබුද්ධස්ස උපට්ඨානං ගච්ඡි" (=ගොපල්ලා දවසට දෙවරක් පසේබුදුන්ගේ උපස්ථානයට ගියේය) යන තැන "දිවසස්ස" ෂෂ්ඨියයි. "ද්වෙ වාරෙ" ද්විතීයාවයි. මේ ෂෂ්ඨිය යෙදියයුතු තවත් තැනකි.

**4. ප්‍රථමාව යෙදියයුතු තැන තෘතීයාවක්:**

"ඉධෙකච්චො අත්තනා දානං දෙති, පරං න සමාදපෙති" (=මෙහි ඇතැමෙක් තමාම දන්දෙයි, අනුන් සමාදන් නොකරවයි. ධ. අ. 301.) මෙය සිංහලෙහි නැති රීතියක්සේ පෙනේ. තවත් උදාහරණ මෙසේයි:-

(1) කුද්දාලපණ්ඩිතො පඨමං අත්තනා පබ්බජිත්වා පච්ඡා පරිසං පබ්බාජෙත්වා අසම්පදං භාජෙත්වා අදාසි.

(කුද්දාලජාතක 70.)

(2) අත්තනො සත්තුං අත්තනා ව පොසෙසි."

(දීඝට්ඨකථා, 96)

(3) කථං හි නාම අත්තනා අගණ්හන්තා මය්හම්පි අදත්වා පක්කමිස්සන්ති" (බ්‍රහ්මසංයුත්තට්ඨකථා i-169)

(4) "යන්නූනාහං අත්තනා ච අත්තනො අනභිරතිං විනොදෙත්වා අභිරතිං උප්පාදෙය්‍යං." (භික්ඛුසංයුත්ත.)

**5. සිංහලෙහි සප්තමිය නොයෙදෙන තැනක්:**

"ඔහුගේ කෙස්වැටිය අල්වාගත්හ" කියා හෝ "ඔහු කෙස් වැටියෙන් අල්වාගත්හ" යි සිංහලෙහි යෙදෙත නමුත් පාළියෙහි එවැනි තැන්හි බොහෝවිට සප්තමිය යෙදී තිබේ:

(1) "ද්වාරපාලො............වංසපෙසිකාහි පොථෙත්වා ගීවාය ගහෙත්වා නීහරි." (=දොරටුපාලයා හුණපතුරුවලින් තලා බෙල්ලෙන් ගෙන බැහැරකෙළේය.) (2) "යො අඤ්ඤො ඉමං සමාන රූපො............ආගච්ඡති, තං සීසෙ පහරිත්වා නීහරෙය්‍යාථ." (3) "සො............ගන්ත්වා ගොණෙ නාසාරජ්ජුයං ගණ්හි. (4) ගහපතිකො............අසනිං පාතෙන්තො විය ඛන්ධෙ පහරිත්වා රථං ආරුය්හ අගමාසි. (5) ගහපතිකො ඔතරිත්වා ගොණස්ස

ගහෙත්වා නාමෙත්වා කප්පරප්පහාරෙහි කොට්ටෙත්වා ගලෙ ගහෙත්වා............ඛිපිත්වා පක්කාමි." මේ වාක්‍ය පසම ඉල්ලීස ජාතකයෙහි.

(2) පිට්ඨියං පහරිත්වා=පිටට ගසා. (3) නාසාරජ්ජුයං ගණ්හි= නාසලණුවෙන් අල්වාගත්තේය. (4) ඛන්ධෙ පහරිත්වා=පිටිකරට ගසා. (5) කෙසෙසු ගහෙත්වා = හිසකෙස්වලින් ගෙන. ගලෙ ගහෙත්වා=බෙල්ලෙන් අල්වාගෙන.

6. 'මට වැටහේ" ආදිය සිංහලෙහි සම්ප්‍රදාන විභක්තියෙන් යෙදෙන නමුත් පාළියෙහි ඇතැම් තැනක දුතියාවෙන් යෙදේ:

(1.) "උපමා මං ආවුසො සාරිපුත්ත පටිභාති" (=ඇවැත, ශාරිපුත්‍රය, මට උපමාවක් වැටහේ) ම. අනඞ්ගණසුත්ත.

(2.) "සාධු වතායස්මන්තංයෙව සාරිපුත්තං පටිභාතු එතස්ස භාසිතස්ස අත්ථො" (ඛන්ධසංයුත්ත) (3) "පටිභන්තු තං චුන්ද බොජ්ඣඞ්ගා." (මහාචුන්දත්ථෙරබොජ්ඣඞ්ග) (4.) "ධම්මාපි මං නප්පටිභන්ති භගවතො ගෙලඤ්ඤෙන." (මහාපරිනිබ්බාණසුත්ත.) වෛයාකරණිකයෝ මේ යෝගයට පටිභායොගයයි කියත්. එබැවින් මේ දුතියාව යෙදීම පති ආදි නිපාතයන් සහිත ක්‍රියාපද ඇතිකල්හියයි සැලකියයුතු. එසේ නැතිතැන චතුර්ථියෙන් යෙදීතිබෙන බව:

"අනඞ්ගණස්ස පොසස්ස නිච්චං සුචිගවෙසිනො
වාලග්ගමත්තං පාපස්ස අබ්භාමත්තං ව ඛායති"

(=නිතර පරිශුද්ධභාවය සොයන්නාවූ කිලුටු රහිත පුද්ගලයාට අස්ලොම් අගක් පමණවූ පාපය වලාකුළක් පමණ මහත්ව වැටහේ.) යන සාරිපුත්තත්ථෙරගාථාවෙන් පෙනේ.

7. උත්තමාර්ථය ප්‍රකාශකරන වරශබ්දයට සමානාර්ථඇති 'වරං" යන නිපාතපදයක් ද විද්‍යමානවේ. ("වරං මන්දප්පියෙ ව්‍යයං" යි අභිධානප්පදීපිකායි):--

(1) "වරමස්සතරා දන්තා, ආජානීයා ච සින්ධවා
කුඤ්ජරා ච මහානාගා; අත්තදන්තො තතො වරං."

(=දැමුණු අශ්වතරයෝ ද ආජානෙයසෛන්ධවයෝ ද උසස් වර්ගයේ ඇත්තු ද උතුම්වෙති; ආත්මය දමනය කොළේ ඊට වඩා උතුම්.) ධම්මපද.

(2) 'වරං තෙ භික්ඛු තිණ්හෙන ගොවිකත්තෙන කුච්ඡි පරිකන්තො, නත්වෙව රතනක්ඛාරතිම්සායං කුච්ඡිහෙතු

පිණ්ඩාය චරණා" (=මහණ, නියුණුවූ ගෙරිකපන කැත්තෙන් තාගේ බඩ පලනලද්දේ උතුම්, බඩ නිසා රත්‍රි අන්ධකාරයෙහි යම් පිඬුපිණිස හැසිරීමක් වේ නම් එය උතුම් නොවේ.) ලටුකිකොපමසුත්ත. ම. (3) "වරමෙතං පිණ්ඩපාතං දූසා ච, නාමමතරා වා භුඤ්ජෙය්‍යුං." (ධ. අ. 615.)

8. මාරුසිරිමේදී මාරුවට දෙනදෙය ද්විතියාවෙන් ද මාරු කොට ගනුලබන දෙය තතියාවෙන් ද සිටිනබව පෙනේ:

(1.) අසන්ථුතං මං චිරසන්ථුතෙන,
නිමිනාති භොතී අධුවං ධුවෙන;
මයාපි භොතී නිමිනෙය්‍ය අඤ්ඤං;
ඉතො අහං දූරතරං ගමිස්සං." (චුල්ලධනුග්ගහජා.)

(=සොඳුර, නී බොහෝ කලක් සේවනයකළ ස්ථිරවූ ස්වාමියා හා අස්ථිරවූ ආශ්‍රය නොකළාවූ මා මාරුකොළෙහිය; මාත් අනිකකු මාරුකරනවා ඇත; එබැවින් මම මෙයින් ඉතා දූරට යන්නෙමි.)

(2.) "පාණෙන තෙ පාණං අහං නිමිස්සං" (=මම මාගේ ප්‍රාණය හා ඔබගේ ප්‍රාණය මාරුකරමි.) ජයද්දිසජාතක.

(3.) "අජරං ජීරමානෙන, තප්පමානෙන නිබ්බුතිං
නිමිස්සං පරමං සන්තිං යොගක්ඛෙමං අනුත්තරං."

(=දිරන දෙයින් නොදිරන දෙයද, තැවෙන දෙයින් නිවුණු දෙයද මාරුකරන්නෙමි; කාමයොගාදීයෙන් නිර්භයවූ නිරුත්තර වූ උත්තමවූ ශාන්තිය ලබන්නෙමි.) සුමෙධපණ්ඩිතගාථා.

9. විතීයාව යෙදියයුතු තැන ප්‍රථමාවක්:

(1) "සරසි ත්වං දබ්බ එවරූපං කාතා" (=දබ්බය, තෝ මෙවැන්නක් කෙළේ සිහිකෙරෙහිද?) (2) "නාභිජානාමි සුපිනන්තෙනපි මෙථුනං ධම්මං පතිසෙවිතා" (=සිහිනෙනුත් මෛථුනධර්මය සේවනයකොළේ නොදනිමි.) පාරාජිකපාළි. කළබව සිහිකෙරෙහිද? කළබව නොදනිමියි කියයුතුතැනි. "නාභිජානාමි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙතා" (=දැන දැන ප්‍රාණියකු ජීවිතයෙන් තොරකොළේ නොදනිමි.) අඞ්ගුලිමාලසුත්ත.

10. "ඡබ්බග්ගියා භික්ඛූ මහානාමෙ සක්කෙ උපනය්හිංසු" (=ෂඩ්වර්ගීය භික්ෂූහු මහානාමශාක්‍යයා කෙරෙහි වෛර බැන්දහ.) පාචිත්තියපාළි. සිංහලෙහි ඔහු හා වෛර බැන්දහයි කියයුතු තැනයි.

11. "අඥාතයා හා සහායබවක් නැත"යි සිංහලෙහි යෙදෙන තැනුත් පාළියෙහි "නත්ථි බාලෙ සහායතා," "නත්ථි චොරෙ සහායතා." ආදිවශයෙන් සප්තමිය යෙදී තිබේ.

12. නාමනිශ්‍රාව යෙදියයුතු තැන සප්තමිය:

"අසු හි ඛො ගොතම පුරිසො මනසාකටෙ ජාතසංවඩ්ඪො, තස්ස සබ්බානෙව මනසාකටස්ස මග්ගානි සුවිදිතානි" (=භවත් ගෞතමය ඒ පුරුෂයා මනසාකටයෙහි ඉපද වැඩුණේ වේ, ඔහු විසින් මනසාකටයට යන සියලු මාර්ගයෝ මනාකොට දන්නා ලදහ.) තෙවිජ්ජසුත්ත. දීඝ.

13. සිංහලෙහි 'මෙන්, වැනි' නිපාතයන් හා ප්‍රථමාව නො යෙදෙන තැනුත් පාළියෙහි යෙදේ.

(1) "නාහං චුන්ද අඤ්ඤං එකසඞ්ඝම්පි සමනුපස්සාමි එවං ලාභග්ගයසග්ගප්පත්තං යථරිවායං භික්ඛුසංඝො" (=චුන්දය, මේ භික්ෂුසමූහයා මෙන් ලාභයෙන් හා යසසින් අග්‍රතැන් පැමිණි එක් සමූහයකුත් නොදකිමි.) පාසාදිකසුත්ත. දීඝ.

(2) "සබ්බිත්ථියො සිඛිරිව සබ්බභක්ඛා" (=සියලු ස්ත්‍රීහු ගින්නමෙන් සියලුදේ කන්නියෝය.) කුණාලජාතක.

---

## ඒ ඒ තැන්හි යෙදියයුතු ක්‍රියාපදාදිය.

1. ආපණං පසාරෙය්‍ය (=කඩයක් දමයි.)

"දුස්සවණිජ්ජං වා සමණො ආනන්දො කරිස්සති, පග්ගාහිකසාලං වා පසාරෙස්සති" (=ශ්‍රමණ ආනන්දතෙමේ රෙදි වෙළඳාමක් හෝ කරන්නේය, රෙදිකඩයක් හෝ විවෘත කරන්නේය.) චුල්ලවග්ගපාළි.

2. සක්ඛිං අපදිසති (=සාක්ෂිකොට දක්වයි, නමදෙයි.)

"අයං භන්තෙ ලොකෙ අග්ගපුග්ගලං සත්ථාරං අපදිසති" (=ස්වාමීනි, මේතෙමේ ලෝකයෙහි අග්‍රපුද්ගලවූ ශාස්තෘන් වහන්සේ සාක්ෂිකොට දක්වයි.) ධ අ. 233, ඝොසකවත්ථු.

3. පටිසෙජති (=තරහ කරයි)

"අයං කූටජටිලො අත්තනො පමාණං න ජානාති; අම්හාකං අය්‍යෙන සද්ධිං පටිසෙජති" (=මේ වඤ්චකජටිලයා තමාගේ ප්‍රමාණය නොදනී; අපගේ ආර්යයන් හා තරහ කරයි.)

සොණනන්දජාතක.

4 විදංසෙති (=විදහා දක්වයි.)

"මායාකාරො වා මායාකාරන්තෙවාසී වා මහාපථෙ මායං විදංසෙය්‍ය" (=මායාකාරයෙක් හෝ මායාකාරයකුගේ අතැවැසියෙක් හෝ මහාමාර්ගයෙහි මායාව විදහා දක්වන්නේය.) ඛන්ධසංයුත්ත.

5. "ඛීණාසවභික්ඛූ යෙව එකූනපඤ්චසතෙ පරිග්ගණ්හි" (=එකුන්පන්සියයක් ක්ෂීණාශ්‍රවභික්ෂූන්ම තේරුවේය.)

විනය-දීඝ-අටුවා.

6. "කොසියා බහුං නිබ්බාහි" (=කොසාපූවෙහි තඹුව දැමීය )

විනයමහාවග්ග.

7. "සක්‍යා ඛො පන අම්බට්ඨ රාජානං ඔක්කාකං පිතාමහං දහන්ති" (=අම්බට්ඨය, ශාක්‍යයෝ ඔක්කාකරජු මුත්තණුවන් කොට තබත් හෝ කියත්.) අම්බට්ඨසුත්ත. දීඝ

8. "තස්ස රාජා ඔක්කාකො කුපිතො ..................... ඛුරප්පං සන්නය්හි" (=ඉක්ෂ්වාකුරජතෙමේ ඔහුට කිපියේ ශරය (දුනු තෙහි) යෙදුවේය.) අම්බට්ඨසුත්ත.

9. "අපවදෙනෙව භවං සොණදණ්ඩො වණ්ණං, අපවදති මන්තෙ" (=භවත් සොණදණ්ඩතෙමේ කුලය ඉවත්කොට කියයි, මන්ත්‍රයන් ප්‍රතික්ෂෙප කරයි.) සොණදණ්ඩසුත්ත.

## රීති.

10. "තිට්ඨන්තු තාව මනුස්සභූතා, අචෙතනානම්පි රුක්ඛානං සාමග්ගිං ලද්ධුං වට්ටති" (=මනුෂ්‍යවූවන් ගැන කියනු කිම, චෙතනාරහිත වෘක්ෂයන්ගේද සමගිය ලබන්ට වටී.) රුක්ඛධම්මජාතක.

11. "න ත්වං තාත රට්ඨපාල, කස්සචි දුක්ඛස්ස ජානාසි" (=දරුව, රට්ඨපාල, තෝ කිසි දුකක් නොදන්නෙහි.) රට්ඨපාලසුත්ත.

12. "පබ්බජිතෙන ච පන තෙ මාතාපිතරො උද්දසෙතබ්බා." (=පැවිදිවූ තාවිසින් මවුපියවරු දක්වියයුත්තාහ. හෙවත් මවුපියන්ට තා දක්වියයුතුය.) රට්ඨපාලසුත්ත. දීඝනිකායේ පායාසිරාජඤ්ඤ සූත්‍රයෙහිද මේ වචනය විද්‍යමානයි.

13. "භික්ඛූ ඝටීකාරස්ස කුම්භකාරස්ස නිවෙසනං උත්තිණමකංසු" (භික්ෂූහු ඝටීකාර කුම්භකාරයාගේ ගෙය තෘණරහිත කළහ. වහලේ සෙවිලිකොට තිබුණ තණකොළ ගලවා ගෙන ගියහ යන අර්ථයි.) ඝටීකාරසුත්ත. මජ්ඣිම.

14. "බහුන්නං වත නො භගවා දුක්ඛධම්මානං අපහත්තා, බහුන්නං..............සුඛධම්මානං උපහත්තා" (=භාග්‍යවත් තෙමේ අපගේ බොහෝ දුක් දුරුකරන්නා ය, බොහෝ සැප එළවන්නාය.) ලටුකිකොපමසුත්ත. මජ්ඣිම.

15. "අච්චයො මං භන්තෙ අච්චගමා," (=ස්වාමීනි දෝෂයතෙම මා ඉක්මවා ගියේය.) මවිසින් වරදක් කරනලදී යන අර්ථ ඇත්තේයි. භද්දාලිසුත්තාදි.

16. "තස්ස පායං එවරූපී පණ්ණාපණ්ණවියා න උපෙති" (=ඔහුට මෙබඳු වූ මිලගණන් අඤමින් හෙවවුකිරීම යෝග්‍ය නොවේ.) කීටාගිරිසුත්ත.

"පණවියා" නම් බඩුවක මිලගණන කීමයි; "ඔපණවියං" නම් රුපියල් විස්ස යයි කීවිට 15 ව දෙමියි කීම මෙන්) කී ගණන අඩුකොට ඉල්ලීමයි. "පණවියා ච ඔපණවියා ච පණ්ණාපණවියා"යි සමාසකටයුතු.

17. "ඉධෙකච්චං භික්ඛුං පවය්හ පවය්හ කාරණං කාරෙන්ති" (=මෙහි ඇතැම් භික්ෂු නමකට නිග්‍රහකොට කොට හිරිහැර කරත් හෝ නඩු විසඳති.) භද්දාලිසුත්ත. ම. ස්වල්ප දෝෂයක් ඇතිකල්හිත් නිග්‍රහ කරමින් අධිකරණය වහා නොනිමෙන සේ විනිශ්චය කෙරෙත් යන අර්ථයි.

18. "සො භික්ඛූහි වුච්චමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති=අප= න ලොමං පාතෙති" (=ඒතෙම භික්ෂූන් විසින් විචාරනු ලබන්නේ අනිකෙකින් අනිකක් වසමින් හැසිරේ; ලොම් නොහෙළයි) භද්දාලිසුත්ත. ම. "අනිකෙන් අනික වැසීම" නම් "තෝ ඇවැතට පැමිණියෙහිදැ"යි ඇසූවිට "මම පාටලිපුත්‍රයට ගියෙමි" යනාදි වශයෙන් කිසි සම්බන්ධයක් නැති නොගැළපෙන උත්තර දීමයි. "ලොම් නොහෙළීම" නම් අන්‍යයන්ට අනුවර්තීක නොවීමයි; තමන්ට භයක් පැමිණිවිට හෝ අන්‍යයන් බියකිරීම සඳහා ලොම් පුප්පාගැනීම බලල් ආදී සතුන්ගේ සිරිතකි; විරුඞ සත්වයා හා එකඟ නොවන බව එයින් ප්‍රකාශවේ; ලොම් පහත හෙළීම විරුඞභාවය දුරුකිරීමේ ලකුණකි.

19. "තෙ මයා පුට්ඨා න සම්පායන්ති, අසම්පායන්තා මමඤ්ඤෙව පටිපුච්ඡන්ති" (=ඔවුහු මාවිසින් විචාරනලද්දහු සම්පාදනය කොට කියන්ට නොහැකිවෙත්, එසේ නොහැක්කාහු මාම පෙරළා විචාරත්.) පාථිකසුත්ත. දීඝ.

20. "සමණං ගොතමං ආරබ්භ පාණං ආරභන්ති" (=ශ්‍රමණ ගෞතමයන් උදෙසා ප්‍රාණීන් නසත්.) ජීවකසුත්ත. ම.

21. "එකමෙකං ච භික්ඛුං පච්චෙකදුස්සයුගෙන අච්ඡාදෙසි." (=එක් එක් භික්ෂුව වෙන් වෙන් වස්ත්‍ර යුග්මයකින් ඇන්දවීය) අට්ඨකනාගරසුත්තාදි. එක් එක් භික්ෂුනමට සිවුරු පිණිස වස්ත්‍ර දෙක බැගින් දුන්නේය යන අර්ථයි.

22. රතනත්තයගුණං අනුස්සරන්තස්සෙව ගච්ඡන්තස්ස චොරා මග්ගෙ පරියුට්ඨිංසු" (=රත්නත්‍රය ගුණ සිහිකරමින් යනකල්හි ම සොරු මාර්ගයෙහි හාත්පසින් නැගී සිටියහ.) මාර්ගය අවුරාගෙන සිටියහ යන අර්ථයි. ජනනමාණවක විමානවත්ථු.

23. "කුක්කුරො ජිඝච්ඡාදුබ්බල්‍යපරෙතො ගොඝාතකසූනං පච්චුපට්ඨිතො අස්ස" (=බල්ලා බඩසයින් හා දුර්වලත්වයෙන් යුක්තවූයේ ගවයන් මරන්නාගේ මස්ලොඹුව හරා එළඹ සිටියේ වන්නේය.) පොතලියසුත්ත. ම. මස්ලොඹුව නම් මස් තබා කපන ලීකොටයයි.

24. "ගාවී තරුණවච්ඡා ථම්භං ච ආලුම්පති, වච්ඡකං ච අපවිනාති" (=තරුණවස්සකු ඇති දෙන්නොමෝ තණ ද කයි, වස්සා දෙස ද බලයි.) කොසම්බියසුත්ත. මජ්ඣිම. 'ථම්භ'= තණ පඳුරට නමෙකි; සංස්කෘතයෙහි "ස්තම්බ"යයි පෙනේ, එය ගොයම් දණ්ඩට නමකි. පාළියෙහිත් 'ථම්බ' වියයුතු යයි හඟිමු.

25 ඔදිස්ස වා අනොදිස්ස වා සද්දං න කරොන්ති" (=කෙනෙකු නියමකොට හෝ නියම නොකොට ශබ්ද නොකරත්=හඬ නොනඟත්) මජ්ඣිමට්ඨකථා 429.

26. "අද්ධා ඛො තෙ අග්ගිවෙස්සන ආසජ්ජ උපනීය වාචා භාසිතා." (=අග්ගිවෙස්සන, තා විසින් එකාන්තයෙන් මා ගටා මා ළඟ එළඹා මේ වචන කියනලදී.) මහාසච්චක සුත්ත. ම.

27 ඔකප්පනියමෙතං භොතො ගොතමස්ස" (=භවත් ගෞතම වහන්සේගේ මේ වචනය ඇදහියයුතුය.) මහාසච්චක සූත්‍රාදිය.

28 "අහඤ්චෙව ඛො පන සබ්බසො අජද්ධුකං පටිපජ්ජෙය්‍යං" (=මම සියලු ආකාරයෙන් නිරාහාරබව ප්‍රතිපදකෙරෙම් නම්.) මහාසච්චකසුත්ත. ම.

29. "අම්හො කිංමෙවිදං හරීයති ජජ්ජජ්ජං විය?" (=එම්බා ඔහොංඥ මහොංඥ දෙයක් මෙන් මේ කුමක් ගෙනයනු ලැබේද?) අනඞ්ගණසුත්ත. ම.

30. "තුම්හෙ පි තෙන ආදිස්සා භවෙය්‍යාථ" (=ඒ කාරණකොට ගෙන තෙපිත් පෙන්වියයුත්තෝ හෝ ගර්හාලැබියයුත්තෝ වන්නෙව්.) ධම්මදායාදසුත්ත. ම.

31. "සකුණග්ඝි ලාපං සකුණං සහසා අජ්ඣප්පත්තා අග්ගහෙසි" (=උකුස්සා හදිස්සියෙන් මැඩගෙන කැටකුරුල්ලා අල්වා ගත්තේය.) සතිපට්ඨානසංයුත්ත.

32. "අථ ඛො භගවා කිස්මිඤ්චිදෙව පකරණෙ භික්ඛුසංඝං පණාමෙත්වා" (=ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ කිසියම් කාරණයෙක්හි භික්ෂුසංඝයා නෙරපා.) ඛන්ධසංයුත්ත.

33 "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො ජරුදපානං වා ඔලොකෙය්‍ය පබ්බතවිසමං වා......... අපකස්සෙව කායං අපකස්සෙව චිත්තං." (=මහණෙනි, යම්සේ පුරුෂයෙක් තෙම ශරීරය අනික් අතට ඇදගෙන හෙවත් බරකොට ගෙන සිතත් අනික් අතට ඇදගෙන දිරූ ලිඳක් හෝ ප්‍රපාතයක් හෝ බලන්නේද.) කස්සපසංයුත්ත. පාලු ලිඳේ හෝ ප්‍රපාතයෙහි ඇද වැටෙත යන බියෙන් ශරීරයත් සිතත් පස්සට ඇදගෙන එබී බැලීම අදහස් කරනලදී.

34. ඉධ භන්තෙ ද්වෙ භික්ඛූ සම්පයොජෙසුං, තත්‍රෙකො භික්ඛු අච්චසරි" (=ස්වාමීනි, මෙහි භික්ෂූහු දෙනමක් කලහකළහ. ඔවුනතුරෙන් එක් භික්ෂු නමක් සීමාව ඉක්මයා වචන කීය.) සක්කසංයුත්ත.

35. "කුම්මො .................. සොණ්ඩිපඤ්චමානි අඞ්ගානි සකෙ කපාලෙ සමොදහිත්වා අප්පොස්සුක්කො තුණ්හීභූතො සඞ්කසායති" (=ඉදිබුතෙමේ හොටය පස්වෙනිකොට ඇති අවයවයන් ස්වකීය කබලතුළ බහාගෙන උත්සුකනොවූයේ නිශ්ශබ්දවූයේ නිසොල්මනේ වසයි ) සළායතනසංයුත්ත.

36. "එථ මෙ ආවුසො ඉමං කායං මඤ්චකං ආරොපෙත්වා බහිද්ධා නීහරථ පුරායං කායො ඉධෙව විකිරති සෙය්‍යථාපි භුසමුට්ඨි" (=ඇවැත්නි මාවෙත එව් මේ සිරුර බොල්මිටක් මෙන් මෙහිම විසිරෙන්ට මත්තෙන් මේ සිරුර ඇඳක තබා පිටත ගෙනයව්.) සළායතනසංයුත්ත

37. "තෙසං රසං පඨවිං අඞ්ගුලියා සායතං අච්ඡාදෙසි" (=රස පොළොව හෙවත් පෘථිවිරසය ඇඟිල්ලෙන් ගෙන ආස්වාදනය කරන ඔවුන්ට එය රුචිජනකවිය.) අග්ගඤ්ඤසුත්ත.

38. "ඉමෙ මච්ඡෙ ගහෙත්වා පාදග්ඝනකානි අඩ්ඪග්ඝනකානි කහාපණග්ඝනකානි ච උද්දානානි කරෙහි" (=මේ මසුන් ගෙන සතරෙන් කොටසක් අගනාවූද අඩකහවණුවක් අගනාවූද කහවණුවක් අගනාවූද (මාලු) වැල් අවුණව. පණ්ඩිතසාමණෙරවත්ථු. 'උද්දානගාථා' යන තැනද එක්කොට ඇවිණීම උද්දාන නමැයි දතයුතු.

39. "අඤ්ඤතරස්මිං ආවාසෙ වස්සූපගතානං භික්ඛූනං ගාමො චොරෙහි වුට්ඨාසි" (=එක්තරා ආවාසයක වස් එළඹි භික්ෂූන්ගේ ගම සොරුන් කරණකොට නැංගේය.) මහාවග්ගපාළි. සොරුන් ගම පැහැරීම නිසා ගම්වැසි සමූහය ගම හැර ගියේය යන අර්ථයි.

40. "රාජගහකො නෙගමො සාලවතිං කුමාරිං ගණිකං වුට්ඨාපෙසි" (=රජගහවැසි ගෘහපතිසමූහය සාලවතී කුමරිය ගණිකාවක් කොට නැංවිය හෙවත් ගණිකාස්ථානයෙහි තැබීය.) මහාවග්ගපාළි.

41. "සාලවතී ගණිකා න චිරස්සෙව පදක්ඛිණා අහොසි නච්චෙ ච ගීතෙ ච වාදිතෙ ච; අභිසටා අත්ථිකානං අත්ථිකානං මනුස්සානං; පටිසතෙන ච රත්තිං ගච්ඡති" (=සාලවතී ගණිකා තොමෝ නොබෝකලකින්ම නෘත්‍යයෙහිත් ගීතයෙහිත් වාදිතයෙහිත් දක්ෂවිය; කැමති කැමති මනුෂ්‍යයන් විසින් එළඹෙන ලද්දී විය; රැයකට සියය බැගින් ගෙන යයි හෙවත් එක්රැයකට කහවණු සියයක් ගෙවූවිට ඈ කිසියම් පුරුෂයකු වෙත යයි.) මහාවග්ගපාළි.

42. "සබ්බසන්ථරිං සන්ථාගාරං සන්ථරිත්වා" (=මන්ත්‍රණශාලාව හැමතැන වැසුණු එකක් වනමෙන් අතුරා.) සෙඛසුත්තආදි.

43. "නනු එවං සන්තෙ තස්ස පුරිසස්ස අප්පාටිහීරකතං භාසිතං සම්පජ්ජතීති" (=එසේවූකල්හි ඒ පුරුෂයාගේ කීම ආශ්චර්යවත් නොවූවක් නොවන්නේද?). චූළසකුලුදායි සුත්ත. ම.

44. 'ඉන්දසාලගුහා විසමා සන්තී සමා සම්පාදි, සම්බාධා සන්තී උරුන්ද්‍රා සම්පාදි" (=ඉන්ද්‍රසාලගුහාතොමෝ විසමවූවා සම බවට පැමිණියාය, අවකාශමඳවූවා මහත්බවට පැමිණියාය.) සක්කපඤ්හසුත්ත. සමනොවූ ගුහාව සමවිය, කුඩාවූ ගුහාව මහත්විය යන අර්ථයි.

45. "අකම්හන්තෙ පාපං කම්මං අකාසිං ගාරය්හං මොසල්ලං" (=ස්වාමීනි, මම ගර්හාකටයුතු මොහොලකින් ගැසියයුතු ලාමක ක්‍රියාවක් කෙළෙමි.) චතුක්කඞ්ගුත්තර. "ගාරය්හං භස්මපුටං" යන්නත් මේ සූත්‍රයෙහිම විද්‍යමානයි; අලුපොදිය කින් දමාගැසියයුතු වරද "භස්මපුට" නම්. (ඇතැම් මුද්‍රිත පොත්වල එය "අස්සපුට"යයි වරදවා තිබේ.)

46. "අලං යොජනගණනානිපි දස්සනාය ගන්තුං අපි පුටංසෙනාපි" (=බත්මුලක් උරයෙහි එල්වාගත්තහු විසිනුත් දැකීම සඳහා යොදුන් බොහෝ ගණනක් වුවත් යාමට සුදුසුය.) චතුක්කඞ්ගුත්තර.

47. "සෙය්‍යථාපි භික්ඛවෙ චණ්ඩස්ස කුක්කුරස්ස නාසාය පිත්තං භින්දෙය්‍යුං. එවං හි සො භික්ඛවෙ කුක්කුරො භීය්‍යොසොමත්තාය චණ්ඩතරො අස්ස" (=මහණෙනි, යම්සේ චණ්ඩවූ බල්ලකුගේ නාසයෙහි පිත බිඳින්නාහුද, එසේ මහණෙනි, ඒ බල්ලා බොහෝසේ චණ්ඩතර වන්නේද.) චුල්ලවග්ගපාළි. බල්ලකුගේ නාසයට පිත ඇල්ලුවිට බල්ලා චණ්ඩත්තපුරු වේ යන අර්ථ ගතයුතු. පිත ඇල්ලීමනම් වලස් ආදි අන් සතකුගේ පිත ගෙන බල්ලාගේ නාසයතුළ දැමීමයි.

48. "මා ඛො තුම්හෙ ආයස්මන්තා එසො අසජ්ජි" (=මේතෙම ආයුෂ්මත් වූ තොප නොදිනාවා හෙවත් තොප නොපරදවාවා.) චුල්ලවග්ගපාළි.

49. "භික්ඛුනීසංඝස්ස චීවරත්ථාය ඡන්දකං සංහරිත්වා අඤ්ඤතරස්ස පාවාරිකස්ස ඝරෙ නික්ඛිපිත්වා.........එතදවොචුං" (=භික්ෂුණී සමූහයාට සිවුරු පිණිස සම්මාදම් එකතුකොට එක්තරා පලස් සාදන්නකුගේ ගෙයි තබා මෙසේ කීහ.) පාචිත්තියපාළි.

50. "සෙය්‍යථාපි භගිනි පුරිසො හත්ථිං දත්වා කච්ඡෙ සජ්ජෙය්‍ය, එවමෙව ඛො ත්වං භගිනි භගවතො මංසං දත්වා මයි අන්තරවාසකෙන සජ්ජසි." (=සොහොයුරිය, යම්සේ පුරුෂයෙක් ඇතකු දී (ඌගේ බඳෙහි බඳිනු ලබන) පොරොද්දෙහි ඇලේද හෙවත් පොරොද්ද දීමෙහි පසුබසීද එමෙන් තී භාග්‍යවතුන් වහන්සේට මස්දන්දී මා ඉල්වූකල අඳනයෙහි ගැටේහි හෙවත් එය දීමට පසුබටවෙහි.) පාරාජිකපාළි.

51. "තස්ස අකාමස්ස බිලං ඔලග්ගෙය්‍යුං" (=නොකැමැති වූම ඔහට කොටස එල්වන්නාහුය.) එසුකාරීසුත්ත, ම. එක්

මිනිසකු මස් කොටසක් ගැනීමට නොසෑමැතිවූනමුත් සමඟ ගිය අන්‍යයෝ ඔහු නොකැමැතිකල්හිම ඔහුට මස් කොට සක් වෙන් කොට එල්ලා තැබූහ

52. "අජ්ඣුමාරිකං වාසං කුලපුත්තො මරිස්සති" (=මේ කුල පුත්‍රතෙමේ අනාථමරණයක් ම මැරෙන්නේය හෙවත් නිරාහාරයෙන් මරණයට පැමිණෙන්නේය.) අඞ්ගුත්තරඅඨක.

53. "මා ච වාතාතපෙ චාරිත්තං අනුයුඤ්ජි" (=සුළඟෙහිත් අව්වෙහිත් හැසිරීමෙහි නොයෙදෙව=අව් සුළං ඇතිවිට නො හැසිරෙව) සුනක්ඛත්තසුත්ත. ම.

54. "තස්සා මෙ අට්ඨමී රත්ති යතො තණ්හා සමූහතා" (=යම් දිනක පටන් තෘෂ්ණාව නසනලද්දීද, ඒ මට අටවෙනි රාත්‍රියයි) සාමාවෙටිනාථා. තෘෂ්ණාව නැසූතැන්පටන් අට දිනක් ගතවීය යන අර්ථ ගතයුතු.

55. "භික්ඛුනියො වුට්ඨාපිතං පවත්තිනිං ද්වෙ වස්සානි නානුබන්ධන්ති" (=භික්ෂුණීහු තමන් උපසම්පන්නකරවූ උපාධ්‍යාය සප්විරිය දෙවසක් මුළුල්ලේ අනුව නොයත්.) පාචිත්තියපාළි.

56. "අක්ඛධුත්තො පඨමෙනෙව කලිග්ගහෙන පුත්තම්පි ජීයෙථ, දාරම්පි ජීයෙථ, සබ්බසාපතෙය්‍යම්පි ජීයෙථ, උත්තරිම්පි අනුබන්ධං නිගච්ඡෙය්‍ය" (=අක්ෂධූර්තයා හෙවත් සූදුකාරයා ප්‍රථම පරාජයෙන් ම පුත්‍රයාගෙන් ද පිරිහෙන්නේය, භාර්‍ය්‍යාව ගෙන් ද පිරිහෙන්නේය, සියලු සම්පත්තින් ද පිරිහෙන්නේය, මත්තෙහිත් ණයහෙවීමට බැඳෙන්නේය.) බාලපණ්ඩිත සුත්ත. ම. පුත්‍රයා ඔට්ටුවට හෝ ඇපයට තබා සූදුකෙළ පැරදුණුවිට පුත්‍රයාගෙන් පිරිහේ; භාර්‍ය්‍යාදීන්ගෙන් පිරිහීමත් එසේම දතයුතු.

57. "පොට්ඨපාදං පරිබ්බාජකං සමන්තතො වාචාසන්නිතොදකෙහි සඤ්ජම්භරිං අකංසු" (=පොට්ඨපාදපරිව්‍රාජකයා වචන නමැති ශස්ත්‍රවලින් හා කෙවිටිවලින් හාත්පසින් අතර රහිතව ගැවසීගත්තක්හු කළහ. පොට්ඨපාදසුත්ත. ඔහු වටකොටගෙන ශස්ත්‍ර හා කෙවිටිවලට සමානවූ තියුණු වචනවලින් අවකාශයක් නැතිවනසේ පහරදුන්හයිදතයුතු.

58. "යස්ස පෙස්සන මිගො පලායති තස්සෙව ගීවා" (=යමකුගේ පාශීවයෙන් මුවා පලායේ නම් වන්දිය ඔහුටය.) ජයද්දිසජාතක. මුවකු විදීමට වටකළවිට යමකු සිටිතැනින් මුවා පලායේ නම් ඔහු විසින් ඒව වගකියයුතුය නොහොත් වන්දි ගෙවියයුතුය යන අර්ථ ඇත්තේයි.

59. "අජ්ඣාචරිම්හ නන්දස්ස, භොතො සන්තිකමාගතා" (=පින්වත්හුගේ සමීපයට පැමිණි අපි නන්දයාගේ ඉල්ලුම්කාරයෝ හෙවත් නන්දයා වෙනුවෙන් ඉල්ලීමක් කිරීමට ආවෝවෙමු.) සොණනන්දජාතක.

60. "සො මය්හං හදයං ච රුජති කායො ච බාධතීති කිඤ්චි පච්චාහාරං අකත්වා ............... වදති." (=හෙතෙම "මගේ හෘදය රිදේ, ශරීරය පීඩාකෙරේය"යි කියා ප්‍රත්‍යාහාරයක් නොකොට හෙවත් මගහැරීමට හේතුවක් නොදක්වා ......... කියයි.) සක්කසංයුත්තට්ඨකථා. මගහැරීමට හෝ නිවරද වීමට හේතු දැක්වීම ප්‍රත්‍යාහාරයයි. ඉංග්‍රීසියෙහි excuse යන වචනය මේ පාලිවචනය හා සමානාර්ථ ඇත්තේයි. සිංහලෙහි ඒ අර්ථය ප්‍රකාශකරන එක් වචනයක් ඇද්දැයි නොදනිමු.

61. "තමෙනං දක්ඛො ගොඝාතකො ................... අට්ඨිකඞ්කලං සුනික්කන්තානං නික්කන්තානං ............. උපච්ඡුභෙය්‍ය" (=දක්ෂවූ ගොඝාතකයෙක් යහපත්සේ හිරුවක්කොට හීරූ ඇට හැකිල්ලක් ඌවෙත විසිකරන්නේය.) පොතලියසුත්ත, ම. මස් සියල්ල සූරාගත් ඇටය "සුනික්කන්තංනික්කන්ත" නම්වේ.

# පාලි-සිංහල වචනමාලා

| | |
|---|---|
| පු. පුල්ලිංගය. | නි. නිපාත. |
| ඉ. ඉත්ථිලිංගය. | ක්‍රි.වි. ක්‍රියාවිශෙෂණ. |
| න. නපුංසකලිංගය. | පූ. ක්‍රි. පූර්වක්‍රියා. |

ක්‍රියාපද පහසුවෙන් ඇඳිනියහැකි බැවින් සියල්ලකින් අඩංගු නොවේ.

අක්කොසති=ආක්‍රොශ කෙරේ.
අක්කොසිත්වා=පරුෂවචන කියා.
අක්ඛාති=කියයි.
අක්ඛි=ඇස. න.
අග්ගමහෙසී=අග්‍ර මෙහෙසිය. ඉ.
අග්ගි=ගින්න. පු.
අග්ගික්ඛන්ධ=ගිනිකඳ. පු.
අගමාසි=ගියේය.
අගාර=ගෙය. පු. න.
අගුණ=අගුණය. පු.
අඞ්ගණ=පිට්ටනිය. න.
අචපල=ස්ථිර ගති ඇති. 3.
අචලසද්ධා=නොසැලෙන ශ්‍රද්ධාව. ඉ.
අචෙතන=සිත් නැති. 3.
අච්ඡරා=දෙව්ගන. ඉ.
අච්ඡිස්සං=සිටියෙමි.
අජ්ජ=අද. නි.
අජිම්ග=එළුවා. පු.
අජ්ඣාසය=අදහස. පු.
අජ්ඣුපාහරි=අනුභව කෙළේය.
අජ්ඣෙසනා=ආරාධනය. න.
අජ්ඣොගාහි=බැසගත්තේය.
අඤ්ඤ=අන්. 3.
අඤ්ඤත්‍ර=හැර. නි.
අට්ඨාසි=සිටියේය.
අට්ඨිත=නොසිටි. 3.
අත්තමන=සතුටු සිතැති. 3.

අතිමනොහර=අතිශයෙන් මනොඥ. 3.
අතිත්ත=තෘප්තියට නොපැමිණි. 3.
අත්ථාය=පිණිස; වැඩපිණිස.
අත්ථි=ඇත.
අදින්න=නුදුන්. 3.
අද්ධාන=දීර්ඝමාර්ගය. පු.
අද්ධිකා=මගියා.
අධිප්පෙත=අදහස්කළ. 3.
අදාසි=දුන්නේය.
අනත්ථ=අනර්ථය. පු.
අන්තොගධ=ඇතුළත්. 3.
අන්ධබාල=අඥාන. 3.
අනත්තමන=නොසතුටු සිතැති. ?.
අනභිරත=නොඇලුණු. 3.
අනුන්නත=උඩඟු නොවූ. 3.
අනුධාවති=අනුව දුවයි.
අනුපුබ්බෙන=පිළිවෙළින්.
අනුබන්ධිත්වා=ලුහුබැඳ.
අනුභවන්ත=අනුභව කරන; අනුභව කරමින්. 3.
අප්පක=ස්වල්ප වූ. 3.
අප්පග්ඝ=අගය අඩු. ?.
අප්පටිවාන=නැවතීමක් නැති. 3.
අප්ඵොටෙසි=අත්පොළසන් දෙයි

අපච්චථ=පැසුණේය.
අපෙති=පහවෙයි.
අපොසයි=පොෂණය නොකෙළේය.
අබ්භාමුත්ත=වලාගැබින් මිදුණු. 3.
අභවිස්ස=නොවන්ට තිබුණේය.
අභය=නිර්භය ස්ථානය. න.
අභිඤ්ඤා=සෘද්ධිවිධඥානාදිය. ඉ.
අභිණ්හං=නිතර. නි.
අභිනව=අලුත්. 3.
අභිරමිත්වා=අභිරමණය කොට.
අභිරම්‍ය=සිත්කලු 3.
අභිරූහති=නගී.
අභිරූප=ශොභනා රූ ඇති. 3.
අම්බ=අඹ. පු.
අමච්ච=ඇමතියා. පු.
අමත්තඤ්ඤු=පමණ නොදන්නා. [පු.
අරඤ්ඤ=වනය. න.
අරහති=සුදුසුවේ.
අරහන්ත=රහතන්වහන්සේ. පු.
අරියගණ=ආර්ය සමූහය. පු.
අරුණ=අරුණාලෝකය. පු.
අරොගභාව=නිරෝගිබව. පු.
අවකුජ්ජ=යටිකුරු. 3.
අවඤ්ඤා=අවමන් කිරීම. 3.
අවන්දිය=නොවැන්දසුතු. 3.
අවසෙස=ඉතිරි. 3.
අස්ස=අශ්වයා. පු.
අස්ස=වන්නේය.
අස්සම=ආශ්‍රමය. පු.
අස්සමපද=ආශ්‍රම ප්‍රදේශය. න.
අසක්කොන්ත=නොහැකිවන. 3
අසද්දහන්ත=නොඅදහන. 3.
අසි=වෙහි.
අසන්ත=අසත්පුරුෂයා. පු.
අසොක=හෝපලු. පු.
ආගච්ඡති=එයි.
ආගච්ඡන්ත=එන; එමින්. 3
ආගත=ආ. 3
ආගන්ත්වා=අවුත්.
ආගමෙති=බලාපොරොත්තුවේ.
ආගාමිමාස=එන මාසය. පු.
ආගාමිවස්ස=ලබන වස. පු. න.
ආචරියානී=ආචාර්යයාගේ භාර්යාව හෝ ආචාර්ය ස්ත්‍රී. ඉ.
ආචික්ඛි=කීයේය.
ආචික්ඛාපෙත්වා=කියවා.
ආජඤ්ඤ=උසස් වර්ගයේ අශ්වයා. [පු.
ආතුර=රෝගී. පු. ත්‍රි.
ආපජ්ජි=පැමිණියේය.
ආපාදි=පැමිණියේය.
ආබාධික=රෝගසහිත. 3.
ආම=එසේය. නි.
ආමජාත=දාසියගෙන් උපන්. පු.
ආමන්තෙත්වා=අමතා.
ආයස්මා=ආයුෂ්මත් තෙමේ.
ආයාම=දිග. පු.
ආරකා=දුරින්. නි.
ආරභි=පටන්ගත්තේය.
ආරාම=ආරාමය. පු.
ආරුහිත්වා=නැගී.
ආරූළ්හ=නැඟි. 3.
ආරොචෙති=දැනුම්දෙයි.
ආරොපෙත්වා=නංවා.
ආලය=වාසස්ථානය. පු.
ආලසියාභිභූත=අලසකමින් මැඩුණු. 3.
ආලොප=පිඩ. පු.
ආවුසො=ඇවැත. නි.
ආසජ්ජ=නැපී; ගටා; ළංව. පු. ක්‍රි.
ආසන=ආසනය. න.
ආහරති=ගෙනඒ.
ආහරාපෙත්වා=ගෙන්වා.
ඉච්ඡති=කැමතිවේ.

ඉතර=ඉතිරි; අනෙක්. ත්‍රි.
ඉදානි=දැන්. නි.
ඉරියාපථ=ඉරියව්ව. පු.
ඉස්සරියමද=ආධිපත්‍යයෙන් හටගත් මානය. පු.
ඉස්සුකී=ඊර්ෂ්‍යාකරන්නා. පු.
ඊදිස=මෙබඳු. ත්‍රි.
උක්කාචයිත්වා=නැග; උපුටා.
උක්කා=ගිනිහුල; පන්දම. ඉ.
උක්ඛිපි=එසවීය.
උක්ඛිපිත්වා=ඔසවා.
උග්ගණ්හාති=උගනී.
උච්ච=උස්. ත්‍රි.
උට්ඨාපෙසි=නැංවීය; නැගිටුවීය.
උට්ඨාය=නැගිට. පු. ක්‍රි.
උණ්හෝදක=උණුදිය. න.
උත්තරාසඞ්ග=උතුරුසළුව. පු.
උත්තරිත්වා=එතරකොට.
උත්තුඞ්ග=උස්. ත්‍රි.
උද්දිස්ස=උදෙසා. පු. ක්‍රි.
උදක=ජලය. න.
උදපාදි=හටගත්තේය.
උන්නදති=මහත් නාදකෙරේ.
උප්පජ්ජති=උපදී.
උප්පල=උපුල්. න.
උපග=එළඹුණු. ත්‍රි.
උපජ්ඣාය=අවවාදදෙන ගුරුවරයා. පු.
උපට්ඨාක=උපස්ථාන කරන්නා. පු.
උපට්ඨාති=එළඹ සිටී; උපස්ථාන කෙරේ
උපනිබන්ධති=ලංකොට බඳී.
උපනිස්සාය=නිසා; ආශ්‍රයකොට පු. ක්‍රි.
උපලබ්භති=විද්‍යමාන වේ.
උපසඞ්කමි=එළඹි.
උපසෙවති=සේවනයකෙරේ.
උපාසක=එළඹෙන්නා පු.
උපෙති=එළඹේ.
උභ=දෙදෙන. ත්‍රි.
උම්මිලෙත්වා=ඇස් දල්වා.
උම්මූලෙත්වා=මුලින් උදුරා.
උය්‍යාන=උයන. න.
උල්ලොකෙතුං=උඩ බලන්ට. නි.
උස්සහති=උත්සාහකෙරේ.
උළාර=මහත්. ත්‍රි.
උළුම්ප=පහුර. පු.
උළූක=බකමූණා. පු.
එකග්ග=එකඟවූ. ත්‍රි.
එකඝන=සිදුරු රහිතව ඝනව සිටි. ත්‍රි.
එකච්ච=ඇතැම්. ත්‍රි.
එකචාරික=තනිව හැසිරෙන. ත්‍රි.
එරණ්ඩ=එරඬු. පු.
එත්තක=මෙපමණ. ත්‍රි.
එවරූප=මෙබඳු. ත්‍රි.
එවං=මෙසේ. නි.
එහින්ති=එන්නාහ.
ඔකිරිත්වා=විසුරුවා.
ඔතාර=සිදුර; දොස. පු.
ඔතාරෙත්වා=බා.
ඔරොධ=අන්තඃපුරස්ත්‍රී සමූහය. පු.
ඔලම්බිත්වා=එල්ලී.
ඔලොකිත=බැලූ. ත්‍රි.
ඔලොකෙති=බලයි.
කක්ඛළ=රළු. ත්‍රි.
කච්චි=කිමෙක්. නි.
කච්ඡුපරිකිණ්ණ=කසනගොරියෙන් ගැවසුණු. ත්‍රි.
කණ්ඩුකච්ඡු=දද හැම්පිදි ආදී. ඉ.
කණ්හ=මාරයා. පු.
කණ්ණසුඛාභාසිත=බාලගෙනාගෙ සුරා පු
කත්තබ්බයුත්තක=කළයුතුදේ න

කත්වා=කොට
කත=කළ; කරනලද. 3.
කතම=කවර. 3.
කතභත්තකිච්ච=ආහාර
අනුභව කළ. 3
කති=කියක්. 3.
කතිපය=කිහිප. 3.
කථෙති=කියයි.
කදා=කවදා. නි.
කපණ=දිළිඳු. 3.
කපාල=කබල. පු.
කම්මන්ත=කර්මාන්තය. පු.
කම්මකර=කම්කරුවා පු.
කම්මාර=ලෝකරුවා, පු.
කයිරා=කරන්නේය.
කරොති=කරයි; සාදයි.
කලලපිණ්ඩ=මඩ පිඩ. න
කස්සක=ගොවියා. පු.
කසති=සීසායි.
කසි=හීය; සීසෑම. ඉ.
කාක=කවුඩා. පු.
කාකී=කවුඩු දෙන, ඉ
කාජ=කද, පු.
කාරෙති=කරවයි; සාදවයි.
කාලිඞ්ග=කාලිඟුරට උපන්, 3.
කාළ=කළු. 3.
කිච්ඡෙන=දුකින්; දුකසේ.
කිඤ්චි=කිසිවක්. නි.
කිණාති=මිලදී ගනී.
කිණිතබ්බ=මිලදී ගතයුත්ත. න.
කිත්තක=කොපමණ. 3.
කිත්තයති=වර්ණනා කෙරේ.
කින්නර=කිඳුරා. පු.
කිලමන්ත=වෙහෙසෙන;
වෙහෙසෙමින්. 3.
කීදිස=කෙබඳු. 3.
කීළිත්වා=ක්‍රීඩා කොට.

කුක්කුටී=කිකිළි. ඉ.
කුටි=කුඩා ගෙය; පැල. ඉ
කුටුම්බික=පවුල්කාරයා. පු.
කුජ්ඣිත්වා=කිපී.
කුද්ධ=කිපුණු. 3.
කුරුතෙ=කරයි.
කුල=පවුල. න.
කුලූපක=කුලයට එළඹෙන. 3.
කුහිං=කොහි. නි.
කූටගොණ=කුළුගොනා. පු
කෙතක=වැටකෙයියා. පු.
කෙලාසකූට=හිමවතෙහි රිදී
දීගෙන් යුත් පර්වතයක්. පු. න.
කොට්ටෙන්ත=කොටමින්. 3
කොට්ඨ=කොටුව. පු.
කොධන=කිපෙන සුලු. 3.
කොමල=මෘදු. 3.
ඛග්ගහත්ථ=කඩුගත් අත් ඇති 3.
ඛණති=සාරයි.
ඛත්තියානී=ක්ෂත්‍රිය ස්ත්‍රී. ඉ.
ඛදිර=කිහිරි. පු.
ඛන්ධාවාර=කඳවුර. පු.
ඛමාපෙති=ක්ෂමා කරවයි.
ඛාදති=කයි.
ඛාදාපෙති=කවයි.
ඛාදිත්වා=කා.
ඛිප්පං=වහා. නි.
ඛීණාසව=දුරුකළ ආශ්‍රව
ඇත්තා. පු.
ඛුද්දක=කුඩා. 3.
ඛෙත්ත=කෙත. න.
ගච්ඡ=කුඩා ගස. පු.
ගච්ඡති=යයි.
ගජ්ජති=ගර්ජනය කෙරේ.
ගජරතන=හස්තිරත්නය. න.
ගණ්ඩි=ගෙඩිය (ශබ්ද නැගීම
සඳහා ලීයක් සාරු කළ
එකකි.)

ගණ්හාති=ගනී.
ගත=ගිය. 3
ගතභාව=ගිය බව. පු.
ගද්‍රභ=කොටළුවා. පු.
ගන්ධකාමී=ගඳ කැමති. 3.
ගන්ධූපග=ගඳපුතු දෙය. 3.
ගයාසීස=බුද්ධගයාවට නුදුරු පෙදෙසක් න
ගවේසති=සොයයි.
ගහපතානී=ගෘහපත්නිය. ඉ.
ගහිත=ගන්නාලද. 3,
ගාම=ගම. පු.
ගාරව=ගෞරවය. පු.
ගායිත=ගායනාකරනලද්ද. න.
ගාවී=ගවදෙන. ඉ.
ගාහාපෙත්වා=ගන්වා.
ගිරිගබ්භර=පර්වත ගුහාව න
ගුම්බ=පඳුර පු.
ගුහා=ගුහාව. ඉ.
ගූථ=අශුචි. පු. න.
ගේහ=ගෙය. පු. න.
ගෝණ=ගොනා. පු.
ගෝතමී=ගෞතම ගෝත්‍ර ඇත්තී. ඉ.
ඝට්ටෙන්ත=ගළපමින් 3.
ඝර=ගෙය. න.
ඝරාවාස=ගිහිගෙයි විසීම. පු
ඝාස=ආහාරය. පු.
චක්කවත්ති=සක්විති රජ. පු
චණ්ඩ=දරුණු. 3.
චතුප්පද=සිවුපාවා. පු.
චන්දිමා=චන්ද්‍රයා. පු.
චම්පක=සපු. පු.
චරති=හැසිරේ.
චරමාන=හැසිරෙමින්. 3.
චරහි=දූන්. නි.
චාරිකා=ඇවිදීම. ඉ.

චින්තෙත්වා=සිතා.
චෙතිය=චෛත්‍යය. න.
චෙතියපබ්බත=සෑගිරිය; මිහින්තලා කන්ද. පු.
චොර=සොරා. පු.
චොරඝාතක=සොරුන් මරන්නා. පු.
ඡඩ්ඩිතභාව=හැරදැමූ බව. පු.
ඡඩ්ඩෙත්වා=හැරදමා.
ඡත්ත=කුඩය. න.
ඡබ්බණ්ණ=වර්ණ සයක් ඇති 3.
ඡළභිඤ්ඤ=අභිඥා සයක් ඇති. 3.
ඡින්දති=සිඳී; කපයි.
ජගතිරුහ=වෘක්ෂය. පු.
ජණ්ණුක=දනහිස. පු.
ජන=ජනයා. පු.
ජනපද=රුහුණ වැනි පෙදෙසක්.
ජය=දිනීම. පු.
ජරග්ගව=මහලු ගවයා. පු.
ජානපද=දනව්වැස්සෝ. පු.
ජානන්ත=දන්නාවූ; දන්මින්. 3.
ජානාති=දනී.
ජාමාතා=දුවගේ සැමියා. පු. (ජාමාතු-ශබ්දය.)
ජිව්හා=දිව. ඉ.
ජීවති=ජීවත්වේ.
ජීවිතපරියොසාන=ජීවිතයාගේ කෙළවර. න.
ඤත්වා=දැන.
ඤාතක=නෑයා. පු.
ඤාති=නෑයා. පු.
ඨපිත=තැබූ. 3.
ඨපෙතබ්බයුත්තක=තැබිය යුතු. 3.
ඨිත=සිටි. 3.
ඨිතක=සිටි. 3.
ඩසති=ඩසී.

තච=පොත්ත. පු.
තජ්ජිත=තැතිගත්. 3.
තජ්ජෙති=තර්ජනය කරයි.
තත්තකපාල=රත්වූ කබල. පු
තත්ථ=එහි.
තථාගත=සර්වඥයන්වහන්සේ; සත්ත්වයා පු
තපස්සිනී=තපස් ඇත්තී. ඉ.
තරඞ්ගභඞ්ග=රළ බිඳීම. පු.
තරති=එතරවේ.
තරුණී=තරුණිය. ඉ.
තරුසණ්ඩ=ගස් සමූහය. පු.
තාලපක්ක=තල්ගෙඩිය. න.
තාලපිණ්ඩි=තල්වල්ල. ඉ.
තාව=ඒතාක්. නි.
තික්ඛත්තුං=තුන්වරක්. නි.
තිබ්බ=තියුණු. 3.
තිට්ඨති=සිටී.
තිල=තල. න.
තීර=තෙර; ඉවුර. න.
තුච්ඡ=හිස්. 3.
තුච්ඡහත්ථ=හිස් අත් ඇති. 3.
තුට්ඨ=සතුටුවූ. 3.
තුට්ඨි=සතුට. ඉ.
තුට්ඨිපාභත=සතුටුපඬුර. න.
තුණ්ඩ=හොටය. න.
තුරඟ=අශ්වයා. පු.
තුස්සති=සතුටුවේ.
ථම්භ=ටැඹ; කණුව පු.
ථල=ගොඩබිම; උස්බිම. න.
ථාලිපාක=දසදෙනෙකුන්ට සෑහෙන ආහාරය; අඩුක්කුව. පු
ථිර=ස්ථිර; ශක්තිමත්. 3.
ථෙනිත=සොරකම්කරනලද. 3.
ථෙර=ස්ථවිර; වැඩි වයස් ඇත්තා. පු
ථොක=ස්වල්පය. න.

දක්ඛිණ=දකුණු. 3.
දට්ඨුං=දකින්ට. නි.
දණ්ඩ=ලීය. පු.
දදමාන=දෙන; දෙමින්. 3.
දදෙය්‍ය=දෙන්නේය.
දබ්බි=හැන්ද. ඉ.
දස්සන=දැකීම. න.
දස්සෙතුකාම=දක්වනු කැමති. 3
දසසතනයන=(දහසක් ඇස් ඇති) ශක්‍රයා. පු.
දහර=ළදරු. 3. තරුණ භික්ෂු නම. පු.
දල්හ=දැඩි. 3.
දලිද්ද=දිළිඳු. 3.
දානව=අසුරයා. පු.
දානවෙය්‍යාවටික=දන් විධායකයා පු.
දායක=දෙන්නා. පු.
දාරක=දරුවා. පු.
දාරිකා=දැරිය. ඉ.
දාරුභණ්ඩ=ලී බඩු. න.
දාස=දාසයා. පු.
දින්න=දුන්; දෙනලද 3.
දිස්වා=දැක.
දීඝ=දිග්. 3.
දීඝරත්තං=බොහෝකලක් නි.
දීපිනී=දිවිදෙන. ඉ.
දුක්කර=කිරීමට අපහසු 3.
දුප්පඤ්ඤ=නුවණමද. 3.
දුබ්බණ්ණ=දුර්වර්ණවූ. 3.
දුරූප=නපුරු රූ ඇති 3.
දෙව=දෙවියා; මේඝය. පු
දෙති=දෙයි
දෙවසිකං=දවස්පතා. ක්‍රි. වි.
දෙවී=රජ මෙහෙසිය. ඉ.
දෙසෙති=දේශනාකරයි.
ධන=ධනය. න.
ධනච්ඡෙද=ධන විනාශය. පු.

ධනවන්තු=ධනවත්. ති.
ධම්මචක්ඛු=දහම් ඇස. න.
ධම්මසවණ=බණ ඇසීම. න.
ධම්මීකථා=දහම් කථාව. ඉ.
ධමනි=නහරය. ඉ.
ධමයන්ත=පිඹින; පිඹිමින්. ති.
ධමෙන්ත=පිඹිමින්. ති.
ධංසෙන=පිරිහෙන.
ධාරෙති=දරයි.
ධාවති=දුවයි.
ධාවන්ත=දුවන; දුවමින්. ති
ධීතා=දූ. (ධීතු-ශබ්ද). ඉ.
ධීර=පණ්ඩිතයා. පු.
ධුර=භාරය; නනතුර; වියගස. පු.
ධූපායන්ත=දුම්දමමින්. ති.
ධොවති=සෝදයි.
නක්ඛත්ත=නැකත. න.
නදී=ගඟ. ඉ.
නනන්දා=නැනා. ඉ.
නභ=අහස. පු. න.
නමස්සති=වඳී.
නරදෙව=සර්වඥ තෙමේ. පු.
නහායන්ත=නාමින්; නාන. ති.
නහාසිත්වා=නාලා.
නානග්ගරස=නොයෙක් අග්‍ර රස ඇති. ති.
නාග=ඇතා; නයා. පු.
නාරී=ස්ත්‍රී. ඉ.
නාවා=නැව. ඉ.
නික්ඛම්ම=නික්ම. පූ. ක්‍රි.
නික්ඛමි=නික්මියේය.
නිගච්ඡති=ලබයි; පැමිණේ.
නිධාපෙත්වා=නිමවා.
නිට්ඨිත=නිමාවට පැමිණි. ති.
නිත්ථුනන්ත=කෙඳිරිගාමින්. ති.
නිද්දොස=දොස් නැති. ති.
නිද්ධමති=දුරුකෙරේ.
නින්දා=නින්දාව. ඉ.
නින්න=පහත් බිම. න.
නිපක=විශාරදයා. පු.
නිපජ්ජාපෙත්වා=හොවා.
නිබ්බත්තෙත්වා=උපදවා.
නිබ්බුත=නිවුණු. ති.
නිබද්ධං=නිතර. නි.
නිමන්තාපෙත්වා=නිමන්ත්‍රණය කරවා.
නිමුජ්ජිත්වා= (දියෙහි) ගිලී.
නියුත්ත=යෙදුණු. ති.
නිරය=නරකය. පු.
නිල්ලජ්ජ=ලජ්ජා නැති. ති.
නිලීයි=සැඟවුණේය.
නිවත්ති=නැවතුණේය.
නිවේදෙති=දැනුම්දෙයි.
නිවෙසෙසි=වාසය කරවිය.
නිස්සංසයං=සැකරහිතව. න.
නිස්සාය=නිසා. පූ. ක්‍රි.
නිස්සිත=ආශ්‍රිතවූ. ති.
නිසින්න=හුන්. ති.
නිසීදති=හිඳී.
නිසීදාපෙත්වා=හිඳුවා.
නීච=පහත්. ති.
නීයාති=පිටවයේ.
නීල=නිල්පැහැති. ති.
නීහරිත්වා=පිටතට ගෙන.
නෙගම=නියම්ගම්වැසි. ති.
නෙත්වා=ගෙනගොස්.
නෙති=ගෙනයයි.
නෙලභ=වස්සා. පු.
පක්ක=පැසුණු ගෙඩිය. න.
පක්කොසාපෙති=කැඳවවයි.
පක්කොසිත්වා=කැඳවා.
පකිත්තෙති=වර්ණනා කරයි.
පක්ඛිත්ත=බැහූ; දැමූ. ති
පක්ඛිනී=පක්ෂිදෙන. ඉ.

පක්ඛී=පක්ෂියා. පු.
පග්ඝරිත=වැගුරුණු. 3.
පඞ්ක=මඩ. පු. න.
පච්චති=පැසේ.
පච්චන්ත=පිටිසර. පු.
පචති=පිසයි.
පච්ඡාසමණ=පස්සෙන් යන ශ්‍රමණයා. පු.
පජ්ජලන්ත=දැල්වෙන; දැල්වෙමින්. 3
පච්ච[illegible]=පසග. පු.
පජා=සත්ව සමූහය. ඉ.
පඤ්ඤවා=නුවණැත්තා. පු. (පඤ්ඤවන්තු-ශබ්දය)
පඤ්ඤපෙති=පණවයි.
පඤ්ඤායති=පෙනේ.
පටිග්ගහණ=පිළිගැනීම. න.
පටිගච්ඡති=හැරියයි.
පටිගණ්හාති=පිළිගනී.
පටිපජ්ජති=පිළිපදී, (මගට) බසී.
පටිබල=සමර්ථවූ. 3.
පටිභාග=සමානවූ. 3.
පටියත්ත=පිළියෙළකළ. 3.
පටිවාත=උඩුසුළඟ. න.
පටිසුත්වා=පොරොන්දුවී.
පටිසාසන=පිළිතුරු හස්න. න.
පඨවි=පොළොව. ඉ.
පණ්ඩරච්ඡද=සුදු පියාපත් ඇති. 3.
පත්ත=පැමිණි. 3. පාත්‍රය. පු.
පත්තුං=පැමිණෙන්ට. නි.
පතිට්ඨාපෙති=පිහිටුවයි.
පතිමණ්ඩිත=සැරසුණු. 3.
පත්ථනා=ප්‍රාර්ථනාව. ඉ.
පත්ථයන්ත=පතමින්. 3.
පත්වා=පැමිණ.
පදුම=පියුම. න.
පප්පොති=පැමිණෙයි.
පබ්බජිත=පැවිද්ද. පු. පැවිදිවූ. 3.
පබ්බජිත්වා=පැවිදිවී.
පබ්බතකූට=පර්වත මුදුන. න.
පබ්බතපාද=පර්වතය පාමුල. පු.
පබ්බාජයති=පිටුවහල්කරයි.
පබ්බාජෙත්වා=පැවිදිකරවා; (රටින්) පිටුවහල්කරවා.
පභාසෙති=බබුළුවයි.
පමුඤ්චති=පිටකරයි; මුදයි.
පයිරුපාසති=සේවනය කරයි.
පයොජෙති=යොදවයි.
පරසමුද්ද=මුහුදින් එතෙර (පෙදෙස). පු.
පරික්ඛිපිත්වා=වට කොට.
පරිචය=පුරුද්ද. පු.
පරිදහති=(වස්ත්‍ර) අඳී.
පරිදෙවමාන=විලාප කියමින්. 3.
පරිදෙවති=විලාප කියයි.
පරිපාතෙති=නසයි.
පරිබ්බාජක=තැන තැන ඇවිදින ශ්‍රමණවර්ගයක්. පු.
පරිභාසිත්වා=තර්ජන වචන කියා.
පරියොනද්ධ=හාත්පසින් වසා ගනු ලැබූ. 3.
පරිවත්තන=පෙරළීම. න.
පරිවාරෙති=පිරිවරයි.
පරිසමජ්ඣ=පිරිස මැද.
පරිසා=පිරිස. ඉ.
පරිහාසන්ත=පරිහාස (කවට කම්) කරමින්. 3.
පලාපෙති=පලවාහරී.
පලෙහිති=පලායන්නේය.
පවත්ති=ප්‍රවෘත්තිය. ඉ.
පවිසිත්වා=පිවිස; ඇතුල්ව.
පවෙණි=පරම්පරාව. ඉ.
පස්සති=බලයි. දකී

පස්සිතුං=බලන්ට. නි.
පසන්න=පැහැදුණු. 3.
පසංසා=ප්‍රශංසාව. ඉ.
පසාදෙත්වා=පහදවා.
පහට=ගසනලද. 3.
පහරි=ගැසුවේය.
පහරිත්වා=ගසා.
පහිණි=යැවීය; එවීය.
පහිත=යැවූ; එවූ. 3.
පංසුකූල=කසලගොඩේ තිබී අවුලාගත් (වස්ත්‍රය.) න.
පාකට=ප්‍රකට. 3.
පාකාර=ප්‍රාකාරය; තාප්පය. පු.
පාටිහාරිය=ප්‍රාතිහාර්ය්‍ය. න.
පාණ=ප්‍රාණය. පු.
පාතරාස=උදෑසන් බත. පු.
පාතුභූත=පහළවූ. 3.
පාතෙතුං=හෙළන්ට. නි.
පාතෙසි=හෙළීය.
පාදඞ්ගුළ=පයේ මාපටැඟිල්ල. පු.
පානීය=පැන්. න.
පාප=පාපියා. පු.
පාපකාරිනී=පව්කරන්නී. ඉ.
පාපකාරී=පව්කරන්නා. පු.
පාමොක්ඛ=ප්‍රධාන. 3.
පායාසි=ගියේය.
පාරගාමී=පරතෙරට ගියේ. පු.
පාරුපිත්වා=පොරවා.
පාසාද=ප්‍රාසාදය. පු.
පිතා=පියා. (පිතු-ශබ්ද.) පු.
පියංවද=ප්‍රිය වචන කියන. 3.
පියායති=ප්‍රියකෙරේ.
පිවති=බොයි.
පිවනමත්ත=බොන පමණ. 3.
පුච්ඡති=විචාරයි; අසයි.
පුච්ඡිත=ප්‍රශනකළ. 3.
පුඤ්ඤ=පින. න.
පුට්ඨ=විචාරනලද. 3.
පුත්ත=පුත්‍රයා.
පුථුජ්ජන=මාර්ගඵල නොලැබූ අය. පු.
පුනදිවස=පසුදා. පු.
පුනප්පුනං=නැවත නැවත. නි.
පුප්ඵ=මල්. න.
පුප්ඵගන්ධ=මල් සුවඳ. පු.
පුරිස=පුරුෂයා. පු.
පූජෙත්වා=පුදා.
පූරෙත්වා=පුරවා.
පෙසෙති=යවයි.
පොක්ඛරණී=පොකුණ. ඉ.
පොථෙත්වා=තළා; බැටදී.
පොසෙතුං=පොෂණය කරන්ට. නි.
ඵාලෙත්වා=පළා.
ඵුට=පැතුරුණු. 3.
බ්‍රහ්මචාරිනී=බ්‍රහ්මචර්ය්‍යාවෙහි හැසිරෙන්නී. ඉ.
බ්‍රූති=කියයි.
බජ්ඣති=බැඳේ.
බන්ධති=බඳී.
බන්ධාපෙත්වා=බන්දවා.
බබ්බු=බළලා. පු.
බලනායක=සෙන්පතියා. පු.
බලවන්තු=බලවත්. 3.
බලාකා=කොකී. ඉ.
බලි=බද්ද. පු.
බලිකම්ම=බිලියම්. න.
බලිකාර=බදුගෙවන. පු.
බහු=බොහෝ. 3.
බාල=අඥාන. 3.
බාළ්හං=දැඩිකොට. ක්‍රි. වි.
බීජ=බීජය; ඇටය. න.
භගවා=භාග්‍යවත් තෙමේ. පු. (භගවන්තු-ශබ්ද).

භගිනී=සොහොයුරී. ඉ.
භඤ්ජිත්වා=බිඳ; න. ඛා.
භණ්ඩ=බඩු. න.
භණ්ඩික=පොදිය. න.
භත්ත=බත. න.
භත්තවෙතන=බත් හා වැටුප්. න.
භත්තා=ස්වාමියා. (භත්තු-ශබ්ද.) පු.
භත්ති=කුලිය. ඉ.
භද්දෙ=සොඳුර. ඉ. (ආලපන.)
භද්‍ර=යහපත. න.
භරියා=භාර්‍යාව. ඉ.
භවනිස්සිත=භවය ආශ්‍රිතවූ. 3.
භවිතුං=වන්ට. නි.
භාතික=සහොයුරා. පු.
භාතා=සහොදරයා. (භාතු-ශබ්ද)
භාවෙති=(සිතින්) වඩයි.
භාසන්ත=කියන; කියමින්. 3.
භික්ඛු=භික්ෂු. පු.
භික්ඛුනී=මෙහෙණිය. ඉ.
භිජ්ජති=බිඳේ.
භුක්කරණ=බිරීම. න.
භුඤ්ජති=අනුභවකරයි.
භුවනවිවර=ලෝක කුහරය. න.
භූමිකා=තට්ටුව. ඉ.
භූමිරාමණෙය්‍යක=රම්‍ය භූමිය. න.
භෙරී=බෙරය. ඉ.
භොජෙත්වා=අනුභවකරවා.
භොති=පින්වතිය. (ඉ. ආලපන.)
මක්ඛිකා=මැස්සා. ඉ.
මච්ඡ=මත්ස්‍යයා. පු.
මච්ඡරී=මසුරා. පු.
මජ්ජ=මත්පැන්. න.
මණ්ඩිත=සැරසුණු. 3.
මත්ත=මත්වූ. 3.
මත්තඤ්ඤුතා=පමණ දැනීම. ඉ.
මත්තා=ප්‍රමාණය. ඉ.
මධුකඵල=මීගෙඩි. න.
මධුරපටිසන්ථාර=මිහිරි පිළිසඳර. පු.
මන්ද=මඳ; අල්ප. 3.
මනුස්ස=මනුෂ්‍යයා. පු.
මනින්නී=මනාත්‍රිධුරන්ධර ස්ත්‍රී. ඉ.
මමායති=මමත්වය කෙරේ.
මහග්ඝ=ඉතා වටිනා. 3.
මහන්ත=මහත්. 3.
මහබ්භය=මහත්භය. න.
මහල්ලක=වයසින් වැඩිසිටි. 3.
මහාවීර=මහත් වීරයා. පු.
මහිද්ධික=මහත් ආනුභාව ඇති. 3.
මහිස=මීමා. පු.
මහෙසී=මහර්ෂි. පු.
මාතඞ්ග=ඇතා. පු.
මාතා=මව. ඉ. (මාතු-ශබ්ද.)
මාතුගාම= ස්ත්‍රී. පු.
මාතුලානී=නැන්දා. ඉ.
මාරියමාන=මරනුලබන. 3.
මාරෙති=මරයි.
මාලාගුළ=මල්ගුලිය. පු. න.
මාලාවිලෙපන=මල් හා විලවුන්. න.
මාලිනී=මාලා ඇත්තී. ඉ.
මිගී=මුවදෙන. ඉ.
මිච්ඡා=වැරදිලෙස්; බොරුව. නි.
මුඛ=මුහුණ. න.
මුඛතුණ්ඩ=හොටය. න.
මුද්දාපිත=මුද්‍රණය කරවූ. 3.
මුනි=ශ්‍රමණයා. පු.
මුහුත්තං=මොහොතක්. ක්‍රි. වි.
මෙණ්ඩ=වැස්සා. පු.
මෙත්තා=මෛත්‍රිය. ඉ.

මේධාවිනී=ප්‍රඥාවත් ස්ත්‍රී. ඉ.
මොචාපෙත්වා=මුදවා.
යක්ඛිනී=යකින්න. ඉ.
යත්ථ=යම් තැනක. නි.
යථාජ්ඣාසයං=අදහස්වූ පරිදී. න.
යදා=යම්කලක. නි.
යාචති=ඉල්වයි.
යාති=යයි.
යාව=යම්තාක්. නි.
යුඤ්ජති=යෙදේ.
යාවජීවං=ජීවිතාන්තය දක්වා. න.
යාවතතියං=තුන්වෙනි වර දක්වා. න.
යුවතී=තරුණිය. ඉ.
යුවා=තරුණයා. පු. (යුව-)
යෙභුය්‍යෙන=බොහෝසෙන්. නි.
රක්ඛති=රකී.
රක්ඛසී=රකුසී. ඉ.
රඞ්ගමණ්ඩල=රඟමඬල. න.
රජ්ජ=රාජ්‍යය. න.
රජ්ජු=රැහැණ; ලණුව. ඉ.
රජත=රිදී. න.
රජන=පොවන සායම. න.
රට්ඨ=රට. න.
රතන=රත්න. 3.
රමතී=සිත් අලවයි.
රවති=නාදකෙරේ.
රස්ස=මිටි. 3.
රාජ=රජ. පු.
රාජකුල=රජගෙය. න.
රාජට්ඨාන=රජ තනතුර. න.
රාජන්තෙපුර=රජුගේ ඇතුල් නුවර. න.
රාජිනී=රාජිනිය. ඉ.
රුක්ඛ=ගස. පු.

රුජති=රිදේ.
රූපාරම්මණ=ඇසින් දක්ක හැකිදේ. න.
රූපිය=රුපියල. න.
රුහති=ලියලයි; වැඩේ.
රොචෙත්වා=කැමතිවී.
රොචෙති=රුචිකෙරේ.
රොදන්ත=අඬන; අඬමින්. 3.
ලකුණ්ටක=කුරු. 3.
ලග්ග=ඇලුණු. 3.
ලතා=වැල. ඉ.
ලද්ධ=ලැබූ. 3.
ලද්ධබ්බ=ලැබියයුතු. 3.
ලද්ධුං=ලබන්ට. නි.
ලභති=ලබයි.
ලිඛිත=ලිවූ. 3.
ලුද්දක=වැද්දා. පු.
ලෙඛන=ලිපිය. න.
ලොකවිදූ=ලෝකය දන්නා. පු.
ලොකසිවඞ්කර=ලොවට සෙත සලසන. 3.
ලොහකුම්භී=ලොහො සැළිය; එනම් නරකය. ඉ.
ලොහිත=ලේ. න.
වට්ටති=වටී.
වඩ්ඪකී=වඩුවා. පු.
වණ්ණවාදී=වර්ණනාව කියන්නා. පු.
වත්ත=වත. න.
වත්තුකාම=කියනු කැමති. 3.
වත්ථ=වස්ත්‍රය. න.
වදෙති=කියයි.
වධිත්වා=නසා.
වන=වනය. න.
වනචරක=වනයෙහි හැසිරෙන. 3.

වන්දති=වඳී.
වන්දිතබ්බ=වැන්දයුතු. 3.
වන්දිය=වැන්දයුතු. 3.
වස්ස=අවුරුද්ද. පු. න.
වස=වසඟය. පු.
වසති=වසයි.
වසන්ත=වසන; වසමින්. 3.
වසභාව=වසනබව. පු.
වළවා=අශ්වෙළඹ. ඉ.
වාචෙත්වා=කියවා.
වාණිජ=වෙළෙන්දා. පු.
වාදෙන්ත=වාදනයකරමින්. 3.
වානරී=වැඳිරිය. ඉ.
වාපි=වැව. ඉ.
වාම=වම්. 3.
වාරෙත්වා=පවරා.
වාලුකා=වැලි. ඉ.
වාසිදණ්ඩක=(වෑ) පිහියෑමිට. පු.
වාසිඵල=පිහියා(වෑ) තලය. න.
වික්කිණාති=විකුණයි.
වික්කායික මූල=විකුණනමිල. න
විජානාති=දනී.
විජායති=වදයි.
විජිත=රාජ්‍යය. න.
විඤ්ඤූ=පණ්ඩිතයා. පු.
විටප=මහඅත්ත. පු.
විදිත=දත්; දත්තාලද. 3.
විධංසක=විනාශකයා. පු.
විධංසෙති=විනාශකරයි.
විමතිමාපන්න=විස්මයට පත් සිතැති. 3.
විරූහති=වැඩේ.
විරොචමාන=බබලන. 3.
විවටච්ඡද=විවෘතකළ වැස්ම ඇති. 3.
විවදති=වාදකෙරේ.
විස්සජ්ජෙන්ත=පතුරුවන. 3.
විස්සජ්ජෙත්වා=වියදම්කොට.
විස්සජ්ජෙසි=පිටත්කොට යැවීය.
විසහති=සමර්ථවේ.
විසාණ=අඟ. න.
විසීදති=ගිලාබසී.
විසුං=වෙන්ව. නි.
විහඞ්ගම=පක්ෂියා. පු.
විහරන්ත=වසන; වසමින්. 3.
වීතමල=පහවූමල ඇති. 3.
වීතිනාමෙති=කල්යවයි.
වීතිසාරෙති=පවත්වයි.
වුත්ත=කී; වැපුරූ. 3.
වූපසන්ත=සංසිඳුණු. 3.
වුසිතභාව=විසූබව. පු.
වෙග=වේගය. පු.
වෙජ්ජ=වෙදා. පු.
වෙදිකා=සකස්කළ උස්බිම; ගරාදිවැට. ඉ.
වෙළුගුම්බ=උණපඳුර. පු.
වොහාර=වෙළඳාම. පු.
ව්‍යග්ඝ=ව්‍යාඝ්‍රයා. පු.
ව්‍යග්ඝී=ව්‍යාඝ්‍රදෙන. ඉ.
ව්‍යාකරෙති=ප්‍රකාශකෙරේ.
ස=ස්වකීය. 3.
සක්කච්චං=සකසා. ක්‍රි. වි.
සකට=කරත්තය. පු.
සකටපරිවත්ත=හැල් රවූම, න.
සකුණගණ=පක්ෂිසමූහය. පු.
සකුණී=පක්ෂිදෙන. ඉ.
සක්කුණාති=හැකිවේ.
සඛිල=මෘදුවචන ඇති. 3.
සග්ග=ස්වර්ගය. පු.
සග්ගුණ=සම්පත් ගුණය. පු.
සගාරව=ගෞරව සහිත. 3.
සඞ්ඛ=සක්ගෙඩිය. පු.
සඞ්ගම්ම=එක්ව. පූ. ක්‍රි.
සච්ච=සත්‍යය. න.

සචෙ=ඉදින්. නි.
සත්තකාය=සත්වසමූහය. පු.
සත්තරතනමය=සත්රුවනින් සැදූ. 3.
සත්ථ=ශස්ත්‍රය. න.
සත්ථා=අනුශාසකයා. පු. (සත්ථු-ශබ්ද)
සද්දහාපෙති=අදහවයි.
සද්දහිතබ්බා=අදහා.
සදිස=සමාන. 3.
සද්ධිං=සමග. නි.
සන්තක=සතුදෙය. න.
සන්තමානස=සත්හුත් සිතැති. 3.
සන්තික=සමීපය. න.
සන්තිකාවචර=සමීපයෙහි හැසිරෙන. 3.
සන්තින්ද්‍රිය=සන්හුන් ඉඳුරන් ඇති. 3.
සනිකං=සෙමින්. නි.
සන්නිපතති=රැස්වේ.
සප්ප=සර්පයා. පු.
සබ්බකිච්ච=සියලුවැඩ. න.
සබ්බසෙත=සියල්ල සුදු. 3.
සම්පත්තභාව=පැමිණි බව. පු.
සම්පත්ති=සම්පත. ඉ.
සම්පරිවත්තමාන=පෙරළෙමින්. 3.
සම්පහංසෙති=මනාව සතුටු කරවයි.
සම්බහුල=බොහෝ. 3.
සම්ම=මිත්‍රය. නි.
සම්මුඛීභාව=හමුවීම. පු.
සම්මුති=සම්මුතිය. ඉ.
සම්මෝදනීය=සතුටුවියයුතු. 3.
සම්මෝදමාන=සතුටුවෙමින්. 3.
සම්මෝහ=මුළාව. පු.
සමණ=ශ්‍රමණයා. පු.
සමන්නාගත=යුක්තවූ. 3.
සමාදපෙති=සමාදන්කරවයි.
සමාපත්ති=සමවත. ඉ.
සමිජ්ඣති=සම්පාවේ.
සමීපචාරී=ලඟ හැසිරෙන්නා. පු.
සමිරති=සමීපාවේ.
සයති=නිදයි.
සයිතුං=නිදන්ට. නි.
සර=තෘණවර්ගයක්. න.
සර=විල. පු. න.
සල්ලපති=කථාකෙරේ.
සස්සු=(නෑදයෙන්) නැන්දා. ඉ.
සසුර=(නෑසාදයෙන්) මාමා. පු.
සහකාරඵල=මීඅඹගෙඩිය. න.
සහාය=යහළුවා. පු.
සංඛොභෙතබ්බා=කලඹා.
සංවුතින්ද්‍රිය=ආවරණයකළ ඉඳුරන් ඇති. 3.
සංසීදි=ගිලාබැස්සේය.
සාඛා=අත්ත. ඉ.
සාධු=යෙහෙකි. නි.
සාධුකං=මනාකොට. ක්‍රි. වි.
සාමග්ගී=සමගිය. ඉ.
සාමණේරී=හෙරණිය. ඉ.
සාමී=ස්වාමියා. පු.
සාමිනී=ස්වාමිදූ. ඉ.
සාසිතබ්බා=රසවිඳ.
සාරණීය=සිහිකටයුතු. 3.
සාරදික=සරත්කලැ හටගත්. 3.
සාල=මස්සිතා. පු.
සාලා=ශාලාව. ඉ.
සාලි=හැල්වී. පු.
සාවෙති=අස්වයි.
සාසන=හස්න; අනුශාසනය. න.
සාසනපණ්ණ=හසුන්පත. න.
සිනෙහ=ස්නේහය. පු.

සිබ්බති=මසයි.
සිව=ක්ෂේමස්ථානය. න.
සීලවන්තු=සිල්වත්. 3.
සීහ=සිංහයා පු.
සීහචම්ම=සිංහසම. න,
සීහී=සිංහදෙන. ඉ.
සුක්කපක්ඛ=ශුක්ලපක්ෂය. පු.
සුකර=කිරීමට පහසු. 3.
සුබිනී=සුවපත් ස්ත්‍රී. ඉ.
සුඤ්ඤ=ශූන්‍ය; හිස්. 3.
සුණාති=ශ්‍රවණයකරයි.
සුණිසා=ලේලි. ඉ.
සුනඛ=බල්ලා. පු.
සුනිම්මිත=මනාකොට හැදි. 3.
සුපාපික=ඉතාපවිටු; ලාමක. 3.
සුපාරුත=මනාකොට පෙරවි. 3.
සුබ්බච=කීකරු. 3.
සුභික්ඛ=සුලභ ආහාර ඇති. 3.
සුස්සූසන්ත=ඇහුම්කන්දෙන. 3.
සූචි=ඉදිකට්ට. ඉ.
සූපරස=ව්‍යඤ්ජනරසය. පු,
සෙට්ඨි=සිටුතුමා. පු.
සේත=සුදු. 3.
සෙල=ගල. පු.
සෙවාල=සෙවෙල්. පු.
සොකනුද=ශොකදුරුකරන. 3.
සොධන=ශුද්ධකිරීම. න.
සොභති=සොබී.
හඤ්ඤති=නැසේ; වෙහෙසේ.
හත්ථ=අත. පු.
හත්ථී=ඇතා. පු.
හත්ථිනාග=ඇත්රජ. පු.
හත්ථිපොතක=ඇත්පැටවා. පු.
හනති=නසයි.
හරති=ගෙනයයි.
හසන්ත=සිනාසෙන. 3.
හාතවෙ=ගෙනයන්ට. නි.
හායති=පිරිහේ.
හිමවන්ත=හිමවත් පර්වතය. පු.
හිය්‍යො=ඊයේ. නි.
හිංසති=හිංසාකරේ.

# ගැටපදය.

පිට පේළි

1- 8 න දිට්ඨපුබ්බං=නුදුන්විරූය; නොදෙන ලද්දේය.

2- 1 අක්ඛීහි න පස්සාමි=ඇස්වලින් නොදකිමි. (මගේ ඇස් නො පෙනෙති යන අදහසයි.)

3-26 එකවචනෙනෙ'ව පක්ඛන්දා=එකවචනයෙන්ම පැන දුවලා. (දෙවරක් කියනතෙක් නොසිට දුවගොස්.)

4-20 අක්ඛිං භින්දි=ඇසක් බින්දේය; තුවාල කෙළේය.

4-25 මයා කතඤ්ඤුනා භවිතබ්බන්ති=මා කළගුණ සලකන්නකු වියයුතුයයි.

5- 5 තිරිසනුන්ටත් වඩා ගුණයෙන් අඩුවූවෝ යයි. මෙහි වඩා යන අර්ථය ලැබෙන්නේ "තිරච්ඡානගතෙහි" යන තැන පඤ්චමී විභක්තියෙනි.

12-11 නක්ඛත්තං ඝුට්ඨං=නැකතක් ඝොෂණයකරනලදි. නැකැත් සම්බන්ධ උත්සවයක් පැවැත්වීමට දැනුම්දෙන ලදි.

13- 9 සිප්පිකානං සතං=සිප්පිකටු සියයක්. (පෙර මුදල් වෙනුවට කවඩි හා සිප්පිකටු පාවිච්චිකරනලදී.)

13-10 කංසසතා දුවෙ=(මිශ්‍ර ලොහයෙන් කළ) කාසි දෙසියයක්. (ශත-ශබ්දය එකවචනාන්තවූ නමුත් වෙන්වූ රාශිවශයෙන් දක්වීමේදී බහුවචනය ගනී.)

13-18 "ධනං" යන්න සමූහාර්ථයෙහි එකවචනයි. අඩගාර යන්න වෙන් වෙන් ද්‍රව්‍යවශයෙන් සලකා බහුවචනයෙන් යොදන ලදී.

16- 8 තස්ස පුනප්පුනං කථෙන්තස්සාපි=ඔහු නැවත නැවත කියන කල්හිත්. (අනාදරාර්ථයෙහි ෂෂ්ඨියයි.)

16-13 කිමෙම සමණභාවෙන=මට ශ්‍රමණභාවයෙන් ඇති ඵලය කිමෙක්ද? (මට මහණකම කුමටද? යන අදහසයි.)

16-22 කිංතෙන පුත්තෙන ගහිතෙන=ගන්නාලද පුත්‍රයාගෙන් ඔබට නම් කිම? (පුත්‍රයා ගැනීමෙන් ඔබට ඇති ඵලය කිම?)

පි: පෙ:

17-26 **අග්ගිං ........ උජ්ජාලෙසි**=ගිනි දල්වන්ට නොහැකිවන්නී හිරු නැංවිය. (හිරු නැංවීම ඈය විසින් කරනලද්දක් නොවේ; හිරු නගිනතෙක් ගිනිදල්වානන්ට ඕ අසමර්ථවීයයි මෙයින් අදහස්ක නලදී.)

18-21 **ගුම්බතො ජාලං මොචෙන්තස්සෙව**=ලැහැබෙන් දැල මුදා ගන්නාකල්හිම. (කාලාර්ථයෙහි ෂෂ්ඨියයි.)

21-12 **තතියෙන පටිහාරෙන**="පටිහාර" නම් පණිවුඩ ගෙනයන්නායි. මේ මහවෙළඳකුමෙන් පෙනීසිටි පුරුෂයා සමීපයෙහි එක් සේවකයෙක්ද ඔහුට දුරින් තවත් සේවකයෙක්ද ඔහුටත් දුරින් තවත් අයෙක්දැයි මුරකරුවෝ තිදෙනෙක් වූහ. පිටතින් පැමිණියකු දුරින්ම සිටින සේවකයාට දැන්නූවිට ඔහුතෙම දෙවැන්නාටද දෙවැන්නා තුන්වැන්නාටද දන්වයි. තුන්වැන්නා මහවෙළඳ තැනට දැනුම්දෙයි. මෙසේ කරනලද්දේ මහධනවතකුබව පෙන්වීමටයි.

22- 3 **ඨපෙත්වා යථාසුඛපරිභොගං**=පහසුපරිදි හෝ කැමති පරිදි ධනය පාවිච්චි කිරීම මිස.

22- 9 **මෙඅසීතිකොටිධනං**=අසූකෝටි දෙකක් ධනය.

22-16 **තස්ස රාජකුලතො ආගච්ඡන්තස්ස**=ඔහු රජගෙයින් එනකල්හි.

26- 3 **තං තං ගන්ත්වා ගණ්හාති**=ඒ ඒ අය වෙත ගොස් අල්වා ගනියි.

29-12 **මච්ඡානං විනන්තකබ්බතො**=මසුන් ගැන (අනුකම්පා වෙන්) සිතන කොතෙක්.

33- 2 **එතං කුසලං**=මෙය යහපති.

36-10 **සකලගාමං ආහිණ්ඩන්තො**=මුළු ගමෙහි ඇවිද.

38-11 **කාලකණ්ණිං පවාහෙස්සාමි**=අශුභකාරණය දුරුකරන්නෙමි (සෝදා හරින්නෙමි.)

42- 7 **ආවාපං ආලිම්පෙස්සසි**=පෝරණයට ගිනි දමන්නෙහිද?

42-22 **ඉමෙ මං දාරකා බහුං ලක්ඛං ජිනිංසු**=මේ ලමයි මා (පරදවා) බොහෝ ඉලක්ක දිනූහ.

42-25 **බහුං හි ජිනිතො**=බොහෝසේ පරදවන ලද්දේ වෙමි.

42-37 **බාහා පග්ගය්හ කන්දන්තො**=හිසැ අත් බැඳ ගෙන හඬමින්.

පි: පෙ:

44- 1 **තිට්ඨතු පෙසනං**=පණිවුඩය තිබේවා. (නවතීවා.)

44 13 **පුබ්බෙ ච සහනිවාසෙන**=පෙර එක්ව විසීමෙන් හෝ

44-14 **පච්චුප්පන්නහිතෙන වා**=මේ භවයේදී කළ උපකාරයක් නිසා හෝ.

44 20 **මාතා පිතූනං අඤ්ඤවිහිතකාය අප්පසන්නානං ඔතරිත්වා**=මවුපියන් අන්වැඩවල යෙදී සිටිබැවින් ඔවුන් නොදක්නා කල්හි බිමට බැස.

47- 7 **යථා පුරෙ**=පෙර මෙන්.

47 10 **සබ්බ සතෙන**=සියල්ලෙන් සියය බැගින් දීම සමග.

47-25 **මූලෙන ගණ්හථ**=මුදලෙන් ගනිව්. (මුදල් දී ගනිව් )

47 26 **සතෙන දෙථ**=(කහවණු) සියයකින් දෙව්. (කහවණු 100 ක් ගෙන දෙව්.)

48- 2 **අච්ඡරාසද්දෙන වස්සති**=අසුරු (ඇඟිලි එක්කොට) ගැසී මෙන් හඬලයි. (අසුර ගැසූවිට හඬලයි.)

48-28 **මාලාගන්ධවිභූතිසම්පන්නං**=මලින් හා සුවඳින් සැරසී මෙන් යුක්තවූ.

50-15 **උතුං ගාහාපෙසුං**=සෘතු ගැන්වූහ. නැවීමෙන් ශීතොෂ්ණයන්ගේ සමතාවය ඇතිකළහ.

50-20 **එකඞ්ගණානි අහෙසුං**=එක් සමභූමියක පිහිටියාහු මෙන් වූහ. (එසේ පෙනී ගියහ.)

52-18 **නච්ච-ගීත-වාදිතානි පයොජෙසුං**=නෘත්‍ය-ගීත-වාද්‍යයන් යෙදවූහ. (නැටුම් ගීකීම් හා තූර්‍යනාද පැවැත්වීම කළහ.)

52-27 **පාකට බීභච්ඡ-සම්බාධට්ඨානා**=ප්‍රකටවූ බියඑලවන ලජ්ජාස්ථාන ඇත්තියෝ; (නින්දේදී වස්ත්‍ර ඉවත්වීමෙන් සිදුවූ වකි.)

53-27 **කන්ථකනිවත්තනචෙතියට්ඨානං දස්සෙත්වා**=කන්ථක නිවත්තන චෛත්‍යස්ථානය දක්වා. (මේ නැවති බැලූතැන්හි පසුකලක චෛත්‍යයක් ගොඩනංවනලදී. සිද්ධාර්ථකුමරුන් තුළ එහි චෛත්‍යයක් බැන්දවීමේ අදහසක් නොතිබුණු නමුත් අටුවා ලියන කාලයෙහි ඒ චෛත්‍යය බැඳතිබුණු හෙයින් මෙසේ කියනලදී.)

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු